FM 104.4,105.7
ශ්‍රී ලංකාවේ ප්‍රථම බෞද්ධ ගුවන් විදුලි නාලිකාව
"රංගිරි ශ්‍රී ලංකා"
සැබෑ මාධ්‍ය සංස්කෘතියක පෙර ගමන්කරු

# රංගිරි ශ්‍රී ලංකා

## RANGIRI SRI LANKA NEWSPAPER

FM 104.4,105.7
ශ්‍රී ලංකාවේ ප්‍රථම බෞද්ධ ගුවන් විදුලි නාලිකාව
"රංගිරි ශ්‍රී ලංකා"
සැබෑ මාධ්‍ය සංස්කෘතියක පෙර ගමන්කරු

ශ්‍රී.බු.ව. 2564- ක්‍රි.ව. 2020
මැයි (වෙසක්)
මාසික බෞද්ධ සාර සංග්‍රහය - අන්තර්ජාල කලාපය
18




## ශ්‍රී සුභ වෙසක් මංගල්‍යයක් වේවා!

**රංගිරි ශ්‍රී ලංකා රූපවාහිනිය**

UHF CH 60
PEO TV CH 22
Dialog Tv 21
Dish Tv 2532

රංගිරි ශ්‍රී ලංකා
RSL TELEVISION

**රංගිරි ශ්‍රී ලංකා ගුවන් විදුලිය**
**දේශයේ රන් හඬ**

රංගිරි ශ්‍රී ලංකා
RSL RADIO

FM 104.4 - 105.7

වෙබ් : www.rangirisrilanka.lk

රංගිරි දඹුල්ල සංවර්ධන පදනමේ ප්‍රකාශනයකි.




දුකින් පීඩාවට පත්ව සිටි ලෝක සත්වයාට අමා සුවයක් සලසාලමින් සිදුහත් බෝසතාණෝ වෙසක් පොහෝදින දඹදිව ශාක්‍ය ජනපදයෙහි කපිලවස්තුපුර ලුම්බිණි සල්උයනෙහි උපන් සේක. සුද්ධෝදන මහරජතුමා පියා වූ අතර මහමායා දේවිය මව්තුමිය විය. උපන් බෝසතාණන් වහන්සේ 'සිදුහත්' යන විශේෂ නාමයෙන් හැඳින්විනි.

ගිහි සැප වින්දනය කළ සිදුහත් කුමරු සතර පෙරනිමිති දැක මහාභිනිෂ්ක්‍රමණය කොට තම උත්සාහයෙන් ම මැදුම් පිළිවෙත අනුගමනය කර බෝධිමූලයකදී සියලු කෙලෙසුන් නසා වෙසක් පොහෝදින සම්මා සම්බුද්ධත්වයට පත්වූ සේක. තමන් වහන්සේ විසින් අවබෝධ කරගත් නිර්මල උතුම් ධර්මය පළමුවෙන්ම බරණැස ඉසිපතනාරාමයේ දී පස්වග තවුසන්ට දේශනා කිරීමෙන් පරාර්ථ සේවය ආරම්භ කළ සේක.

කපිලවස්තුපුරයේදි තම ඤාතීන්ට දහම් දෙසා නිවන් මගට යොමු කරවූ සේක. භික්ෂු භික්ෂුණී උපාසක උපාසිකා සිවු පිරිස ඇතිකොට ධර්මයන් අනිත්‍ය බව පසක් කරමින් කුසිනාරානුවර සල්වනයේදී වෙසක් පුන් පොහෝදින පිරිනිවන් පා වදාළසේක. මෙම කරුණු මුල්කරගෙන සමරන වෙසක් දින බුද්ධ චරිතයෙන් ගත හැකි උතුම් ගුණධර්ම රාශියකි වියදී, යථාවාදී තථාකාරී ගුණය, මහාකරුණාව, අටලෝදහමින් කම්පා නොවීම, සමානාත්මතා ගුණය, මධ්‍යස්ථ බව වැනි ගුණයන් අපගේ ජීවිත වලට සම්බන්ධ කරගැනීම මෙම උතුම් දිනයේදී ඉතා වැදගත් වේ.

වෙසක් පොහෝ දිනයේ ආමිස පූජාවන්ද (දන්දීම විවිධ පූජා පැවැත්වීම) අවශ්‍යය එහෙත් බුද්ධ දේශනාවට අනුව ඉතා වැදගත් වන්නේ ධර්මානු ධර්ම ප්‍රතිපදාවෙහි යෙදීමය. ඒ බව 'යොධම්මං පස්සති සො මං පස්සති' යනුවෙන් දැක්වේ. මෙයින් පැහැදිලි වන්නේ ධර්මානුධර්ම ප්‍රතිපදාවේ යෙදීම මගින් බුදුරජාණන් වහන්සේ දැකිය හැකිවන බවයි. මේ බව අවබෝධ කරගෙන නිවන් මගට යොමුවන මෙන් රංගිරි දහම් පණිවිඩය මෙසේ ලබාදෙමු.

සියලු සත්වයෝ නිදුක් වෙත්වා!

ඇම්.ඩී.විජයවර්ධන

# අසිරිමත් වෙසක් උළෙල

අභාවප්‍රාප්ත ශාස්ත්‍රවේදී ඩී.එම්. එච්. කරුණාරත්න මහත්මාට උපහාර පිණිස නැවත පළ කෙරේ



වෙසක් හෙවත් වෛශාඛ්‍ය මංගල්‍යය වර්ෂයේ මැයි මාසයේ පවත්වන බෞද්ධාගමිකයන්ට සුවිශේෂී වූ ආගමික උත්සවයකි. තුන්ලෝකාග්‍ර සම්මා සම්බුදු පියාණන් වහන්සේ ලොව ඇති සලනිසල සියල්ලෙහිම යථාභූත බව හෙවත් යථාර්තය අවබෝධ කරගනිමින් සම්මා සම්බුධත්වයට පත්වූයේ වෙසක් පුර පසළොස්වක පොහොය දිනයේය.

එසේම උන්වහන්සේ මනුෂ්‍යයෙකු වශයෙන් මෙලොවට පහළවූයේද වෙසක් පුර පසළොස්වක පෝය දිනයේය. තවද පන්සාලිස් වසක් (45) මුළුල්ලේ ලෝකයෙහි නොඇලී නොගැටී කාම රූප, අරූප රූප, යන තුන්ලෝකයෙහි වාසය කරන සියලු සත්වයන්ටම සෙත ශාන්තිය විමුක්තිය සැලසූ බුදුරජාණන් වහන්සේ කුසිනාරා පුර නුවර මල්ල රජ දරුවන්ගේ උපවත්තන නම් සාල වනෝද්‍යානයේදී පිරිනිවන් පා වදාළේ ද මෙම වෙසක් පුර පසළොස්වක පොහොය දිනයේදීය. මීට අමතරව සුද්ධෝදන රජුගේ ඉල්ලීම පරිදි කාළුදායී ඇමතිගේ පණිවුඩයට අවධානය යොමු කළ බුරජාණන් වහන්සේ භික්ෂු සංඝයා පිරිවරා ගෙන මැදින් පුර පසළොස්වක පොහෝ දින ගමන් අරඹා දින 60කින් කිඹුල්වත් පුර නුවරට ලඟාවූයේද වෙසක්පුර පසළොස්වක පොහොය දිනයේදී බව බෞද්ධ සාහිත්‍යයේ සඳහන් වේ.

වෙසක් උත්සවයේ සමාරම්භය පිළිබඳව ඓතිහාසික වශයෙන් තොරතුරු ලැබෙන්නේ මහා වංශයෙනි. එහි මුලින්ම දුටුගැමුණු රජතුමා විසින් (කි.පූ 101-77) විසිහතර වතාවක් (24) වෙසක් උත්සව පැවැත්වූ බව සඳහන් වේ. දුටුගැමුණු රජුන්ගේ පිං පොතෙහි "සූ විස්සක් මහත් පූජා කරවීමි. ලක්දිව සියලු සංඝයාට තුන් වරක් තුන්සිවුරු දුන්නෙමි" යනුවෙන්ද දක්වා ඇත. මීට සියවස් දෙකකට පෙරද වෙසක් උත්සව පවත්වා ඇත. භාතිය රජු (කි.පූ 38 - 67) විසි අට වතාවක් (28) වසභ රජු (127-171) හතළිස් හතර වතාවත් ද (44) වෙසක් උත්සව පවත්වා ඇති අතර වෝහාරික තිස්ස රජතුමා (267-91) ජෙට්ඨතිස්ස රජු (323-33) දළ මුගලන් රජු (611-17) සහ II වන සේන (825-885) යන රජවරුන්ද වෙසක් උත්සවය උත්කර්ෂවත් අන්දමින් පැවැත්වූ බව සඳහන් වේ.)
(මහා වංශය xxiv -59, xxv:100, xxvi 40, 109, 130, x/iv, 1: -84)

ඈත අතීතයේදී පැවැත්වූ වෙසක් උත්සවය සිංහල බෞද්ධ ජනතාවගේ ප්‍රධාන ආගමික හා ජාතික උත්සවය බවට පත්වී තිබුණි. අප්‍රේල් මාසයේ එළඹෙන අලුත් අවුරුද්ද හඳුන්වන්නේ සිංහල හින්දු අලුත් අවුරුද්ද නමිනි. එය සිංහල ජනතාවගේ පමණක් නොව දෙමළ ජනතාවගේ ද උත්සවයක් ලෙස සම්මත වී ඇත. එහෙත් වෙසක් උත්සවය සිංහල බෞද්ධ ජනතාවට පමණක් අනන්‍ය වූ සුවිශේෂී වූ ආගමික හා ජාතික උත්සවයක් ලෙස සලකනු ලැබේ. මේ නිසාම මෙම උත්සවය හා බැඳුනු ආගමික චාරිත්‍ර විධි දක්නට ලැබේ.

වෙසක් උත්සවය නිමිති කොට ගෙන අතීතයේ දී බෞද්ධ ජනතාව වෙහෙර විහාර වලට පැමිණ ආගමික වතාවත් වල යෙදුනහ. එසේම ප්‍රධාන මංමාවත් හා පූජනීය ස්ථාන අසල මුල් කාලයේදී දාන ශාලා තාවකාලිකව සාදා වන්දනාවේ යන බැතිමතුන්ට ආහාරපාන වලින් සංග්‍රහ කිරීම බෞද්ධ ජනතාව බුදු දහමින් පුරුදු වී ඇති සත් ක්‍රියාවකි. දුගී මගී යාචකාදීන්ට පිහිටවීම අසරණයින්ට උපකාර කිරීම ආදිය වෙසක් සමයේ විශේෂයෙන් දැකිය හැකිය.

දෙවියන්ට හා මිනිසුන්ට පිං රැස්කර ගැනීමට අවශ්‍ය බව බුදු දහමින් පෙන්වා දී තිබේ. වෙසක් සමයේ පැවැත්වෙන දන්සැල් දීමට වෙසක් තොරණ්, වෙසක් කූඩු සෑදීමට බොහෝ දෙනෙක් සහභාගී වෙති. මේ නිසා විශාල පිරිසක් අතර සුහදත්වය සහනශීලී භාවය හා පරිත්‍යාගශීලී භාවය වර්ධනය වීමක්ද නිතැනින්ම සිදුවේ.

මීට අමතරව වෙසක් මාසයේ වෙසක් සුභපැතුම් පත් යැවීම, භක්ති ගීත සන්දර්ශන පැවැත්වීම ආදිය සිදු කෙරේ. බෞද්ධාගමික සෑම නිවසක් පාසාම වෙසක් අසිරිය සැමරීම සිදුවන්නේ වෙසක් මාසයේය. සැදැහැතියන් වෙහෙර විහාර මුල්කරගෙන දාන, ශීල, භාවනා යන තුන් බුද්ධාලම්භන ප්‍රීතියෙන් යුතුව උත්සවය සමරති.

සෑම බෞද්ධයෙක්ම තම ජීවිතයේ සාරධර්ම රෝපණයට වර්ධනයට නැඹුරුවීමක් ඇතිකරගන්නේ වෙසක් මාසයේ එළඹෙන වෙසක් පුර පසළොස්වක පෝයදාටයි. කිසිම සත්වයෙකුට මොනයම් හෝ ආකාරයකින් හිංසාවක් පීඩාවක් නොකළ අවිහිංසාවේ ප්‍රතිමූර්තියක් වූ බුදු පියාණන් වහන්සේ ගේ උතුම් තෙමඟුල සමරන මේ උතුම් දිනයේ ඒ නමින් කිසිම බෞද්ධයෙකු සතෙක් මරන්නේ නැත. එසේම මරණයට නියමවූ සතුන් මිල මුදල් දී බේරා ගැනීම සඳහා (අභයදානය) ක්‍රියා කරති.

ශ්‍රී ලාංකිකයින්ට පමණක් ආවේණික වූ ඉහත දැක්වූ ආකාරයේ වෙසක් තොරණ් ඉදිකිරීම ආදියේ පටන් පැවත ආ චාරිත්‍රයකි. මේ වෙසක් තොරණ් වලින් බුදුරජාණන් වහන්සේගේ ජීවන චරිතය හෝ පෙර භවයක කතාවක් හෙවත් ජාතක කථාවක් නිරූපණය වන අතර ඒවායින් බලාපොරොත්තු වූයේ බෞද්ධ ජනතාව තුළ ශ්‍රද්ධාව හා භක්තිය යන උභය මානසික අවස්ථා කුලුගැන්වීමයි.



බුදු දහමින් [illegible]



# ගුණාංගයන්ගෙන් බිඳක්..

**"මිනිසා සාමුහිකව ජීවත් වීමට පටන් ගත් දා සිටම නායකත්ව සංකල්පය බිහි වී ඇත්තේ ගැටලු විසදීම සඳහා නායකයකු අවශ්‍ය වූ නිසා යැයි සිතිය හැකිය. එබැවින් නායකයා වනාහි ගැටලු විසදන්නෙකු වුවත් අද සමාජයේ ගැටලු ඇතිවීම වලක්වාලනු පිණිස නායකයකු අවශ්‍ය වෙයි."**

මැක්ස් වෙබර් නැමැත්තා නායකත්වයේ ඉතිහාසය පිළිබඳ එසේ සදහන් කළ අතර එය ලොව අසම සම නායකයා ලෙස අවිවාදයෙන් පිළිගත හැකි ගෞතම බුදු රජාණන් වහන්සේගේ නායකත්වය තුළින් ද මනාව ප්‍රත්‍යක්ෂ වනු නියති. ඵලදායක කාර්යයක් ඉටු කරනු පිණිස කණ්ඩායමක් මෙහෙය වීමේ වගකීම භාර ගැනීමේ නිපුණතාවය නායකත්වය සතු විය යුතුය.

නායකත්වය රටට සමාජයට අවශ්‍ය වූවකි. වැඩ පිළිවෙළක් ක්‍රියාවට නැංවීමේදී ඒවා මෙහෙයවීම සදහා නායකයකු අත්‍යවශ්‍යය ය. සමාජයේ කුඩාම ඒකකයේ සිට විශාලතම ඒකකය දක්වාම වූ සෑම තැනකම නායකත්වය විහිදී පැතිරී ඇත. නායකත්වය ගොඩනැගෙනුයේ යම් පුද්ගලයෙකු කරන කාර්යය හා එය කිරීමට ඔහුට ඇති හැකියාව මතය. සමාරම්භක ශක්තිය මෙන්ම සමූහයක් සමඟ කටයුතු කිරීමේදී ක්‍රම ශිල්ප පාවිච්චි කිරීමේ හැකියාව සහ අනුගාමිකයන්ට අවශ්‍ය දේ ලබා දෙන බවට ඔවුන් තුළ විශ්වාසය පැවතීම නායකයා ගොඩ නංවා ගතයුතු ශක්තීන් ය. නායකයා සතුව අවස්ථාවෝචිතව හා ස්ථානෝචිතව සාර්ථකත්වය කරා සමූහය ගෙන යාමට හැකියාව ඇත්තේ ය. එසේම මනා නායකයාට සමාජයෙන් පිළිගැනීමක් ද ඇති බව වටහා ගත යුත්තේම ය.

නායකයා වනාහි යුතු අයුතු, සුදුසු නුසුදුසු හා යහපත් අයහපත් දැය නිශ්චය කිරීමේ සමත් බවින් යුතු බුද්ධිමතෙකි. එසේම බොහෝ ඇසූ පිරූ තැන් ඇති තම ක්ෂේත්‍රය පිළිබඳ පුළුල් හා ගැඹුරු අවබෝධයක් ඇති පාණ්ඩිත්වයෙන් යුක්ත වූවෙකි. එමෙන්ම බාධක හා අනපේක්ෂිත ගැටලු ඉදිරියේ නොසැලෙන සුලු, නොකැළඹෙන තැනැත්තෙකි. විශ්වාසය තැබීමට සුදුසු තැනැත්තෙකි. සමාජශීලීත්වය හෙවත් විවිධ කණ්ඩායම්වල සාමාජිකත්වය දරන බව හා සාමාජිකයන් සමඟ පහසුවෙන් සම්බන්ධතා වර්ධනය කර ගන්නා තැනැත්තෙක් මෙන්ම ආත්ම විශ්වාසයෙන් යුතුව ඕනෑම තත්ත්වයකට මුහුණ දිය හැකි පසු නොබසින, නොපැකිළෙන ධෛර්යය සම්පන්න පුද්ගලයෙකි. තවද සැබවින්ම නායකයා වූ කලී පිරුණු බවින් නොහොත් සෑම විෂය ක්ෂේත්‍රයක් පිළිබඳවම එක්තරා දැනුමක් හා අවබෝධයක් ඇති පුද්ගලයෙකු මෙන්ම ගැඹුරු අවබෝධයකින් යුක්තව කරුණු විනිවිද දකින අන්තර්වේදීත්වයෙන් යුතු තැනැත්තෙකි. ආචාරශීලීත්වය, මිත්‍රශීලීත්වය හා සංවිධාන ශූරත්වය ද නායකයාට අත්‍යවශ්‍ය වූවක් බව මෙහිලා සඳහන් කළ යුත්තේම ය.

**"නායකයා හොඳ තත්ත්වයේ අයෙකු යැයි කිව හැක්කේ එවැන්නෙකු සිටින බව පවා නොදන්නා විට ය. ප්‍රශස්ත නායකත්වය අඩුවෙන් කතා කරයි. එවැනි නායකයකුගේ කාර්යය අවසන් වූ විට ප්‍රජාව පවසන්නේ එය අපම කළාය යනුවෙනි. "**

මෙකී අදහස ප්‍රකාශ කොට ඇත්තේ ලා ඔත් සු ය. එයින් ද ගම්‍යමාන වනුයේ නායකයා තමා ඉස්මතු වීමට වෙර නොදරන පොදුවේ කාර්යයන් කරන්නා වූ තැනැත්තෙකු බව ය.

මෙකී කරුණු මනාව අධ්‍යයනය කිරීමේ දී අප හදවතට දැනෙන්නා වූ යමක් ඇත. එනම් කුමන දාර්ශනිකයා, කුමන විද්වතා මෙම කරුණු කාරණා පැවසුව ද එකී විද්වතුන් හෝ දාර්ශනිකයන් මෙලොව පහළ වීමටත් පෙර මේ ලෝකයෙහි පහළ වූ ගෞතම බුදු රජාණන් වහන්සේ තුළ මෙකී නායකත්ව ලක්ෂණ සියල්ල අන්තර්ගත වූ බව ය. උන්වහන්සේ සිය දහම ලොව තුළ ප්‍රචාරය කරන සමයෙහි මෙකී නායකත්ව ගුණාංගයන් එකී දහම මෙසේ මුල් බැස ගැනීමට හේතු වූ එක් කාරණයක් ලෙස සිතීම ද සාවද්‍යය නොවනු ඇත. උන්වහන්සෙස්ගේ නායකත්ව ලක්ෂණයන් අසම සමය. බුද්ධිමත් බව, පාණ්ඩිත්වය, පරිණතභාවය, විශ්වසනීයත්වය, සමාජශීලීත්වය, ධෛර්යය සම්පන්න බව, නම්‍යතාව, පිරුණු බව, අන්තර්වේදීත්වය, ආචාරශීලීත්වය, මිත්‍රශීලීත්වය මෙන්ම සංවිධානශූරත්වය යනාදී වූ නායකත්ව ගුණාංගයන් උන්වහන්සේගේ චරිතය තුළ අන්තර්ගත ය. තවද ඉවසීම, කරුණාව, දයාව, අනුකම්පාව, මෛත්‍රිය යනාදී අනේකවිධ වූ නායකත්ව ගුණාංගයන්ගෙන් ද උන්වහන්සේ අසම සමය. මෙකී සෑම ගුණාංගයකටම නිදසුන් ගණනය කළ නොහැකි තරමටම බුද්ධ චරිතය තුළින් පෙන්වා දිය හැකිය.

බුද්ධ දේශනාවන් තුළද නායකයකු උගත යුතු බොහෝ දෑ අන්තර්ගත ය. එවැනි දහස් සංඛ්‍යාත කරුණු අතරින් එක් සූත්‍රයක කරුණු කීපයක් කෙරෙහි අවධානයට ලක් කොට ගැනීම වටිනා බව හැඟේ. මජ්ඣිම නිකායේ මහා ගෝපාල සූත්‍රයෙහි ගොපල්ලෙකු විසින් තම ගව රැළෙහි දත යුතු කරුණු එකොළොසක් පිළිබඳ සඳහන් වෙයි. එනම්,

1. ගෙරි රැළ ගණනින් හෝ සුදු රතු පැහැයෙන් දත යුතුය.
2. ගෙරි සිරුරෙහි දුනු-සිරි-තිසුන් ආදී ලකුණු පිළිබඳ දත යුතුය.
3. වෙනෙහි කණු කටුයෙන් සම්බුන් තැන නිල මැස්සන් ලු මැසි බිජු ඉවත් කළ යුතුය.
4. ගෙරි ඇඟේ හට ගත් වණ බෙහෙත් ලා සුව කළ යුතුය.
5. මැසි මදුරු වළහනු සඳහා ගොවදෙහි දුම් දැමිය යුතුය.
6. ගෙරින් බැසිය යුතු තොටුපළ දත යුතුය.
7. ගෙරින් පානය කළ නොකළ වග දත යුතුය.
8. ගෙරින්ගේ ගමන් මඟ දත යුතුය.
9. ගෙරින් හැසිරවිය යුතු තැන්හි දක්ෂ විය යුතුය.
10. වසු පැටවුන්ට ඉතිරි කොට කිරි දොවන සුලු විය යුතුය.
11. ගෝ පීතෘ / ගෝ පරිනායක ආදීන් හදුනා ගෙන ඔවුන්ට විශේෂ සැලකිලි දැක්විය යුතුය.

මෙකී කරුණු මැනවින් අනුගමනය කරන්නා වූ ගව පාලකයා වර්ධනයටත්, අනුගමනය නොකළහොත් පිරිහීමටත් පත් වන බව බුදු රජාණන් වහන්සේ දේශනා කර ඇති අතර මෙම කරුණු එකින් එකට භික්ෂුවක් තුළ පවත්වා ගත යුතු ගුණාංග ලෙස ද සම්බන්ධ කර ඇත. එකී කරුණු එලෙසින් විග්‍රහ කළ ද ඒවා නායකයකු තුළ තිබිය යුතු මනා වූ ගුණාංගයන් ලෙස ද අප සමාජයට වැදගත් බව හැඟේ.

ඒ කෙසේද යත් ගොපල්ලා ගව රැළ ගණනින් හෝ වර්ණයෙන් හෝ දත යුත්තාක් මෙන්ම නායකයා ද තම අනුගාමිකයන්ව වහා හදුනා ගත යුත්තේම ය. එසේම අනුගාමික පිරිස ගණනින් හෝ වෙනත් ලක්ෂණයන්ගෙන් දත යුත්තේ ය. මෙය නායකයකුට අත්‍යවශ්‍ය වූවකි. තම පිරිස පිළිබඳ මනා අවබෝධයක් ලබා ගැනීමට එකී පිරිසෙහි ප්‍රමාණය මෙන්ම සංඛ්‍යාත්මකව දැන ගැනීම ඉතා වටී. එමෙන්ම තම අනුගාමික පිරිසෙහි විශේෂ වූ ලක්ෂණයන් හදුනා ගැනීම මෙන්ම ඔවුන්ගේ යහපත් අයහපත් ලක්ෂණ හදුනා ගෙන අයහපතින් ඔවුන්ව මුදවා ගත යුත්තේම ය. තවද අනුගාමික පිරිසගේ සෞඛ්‍ය තත්ත්වයන් පිළිබඳ නිසි පරිදි සොයා බැලීම් යනාදිය සිදු කිරීම, අවශ්‍ය ඖෂධ සපයා දීම, සෞඛ්‍යාරක්ෂිත බවින් යුක්ත කිරීම යනාදී වූ අවශ්‍යතාවන් පිරිමසාලීමට නායකයා කටයුතු කළ යුතුය. ගොපල්ලා තම ගවයන් බස්නා තොටුපළ පිළිබඳ අවබෝධයෙන් සිටිය යුත්තේම ය. එසේ නොවීමෙන් නුසුදුසු තොටුපළකට බටහොත් විනාශය සිදු වනු නියති. එබැවින් නායකයා ද තම අනුගාමික පිරිස කෙරෙහි අවධානයෙන් සිටිය යුතුය. එපමණක් ද නොව නායකයා වනාහි තම අනුගාමික පිරිස ආහාර ගත් බව නොගත් බව පිළිබඳව ද සොයා බලා කටයුතු කළ යුතුය. එමෙන්ම අනුගාමික පිරිස ගමන් ගන්නා ගමන් මඟ නොහොත් ඔවුන්ගේ ක්‍රියා කලාපය පිළිබඳ අවබෝධයෙන් සිට යහපත් ජීවිත ගමන් මඟක අනුගාමික පිරිස කැටුව යාමට නායකත්වය ලබා දිය යුතුය. එමෙන්ම අනුගාමික පිරිස කරන්නා වූ කටයුතුවල සුදුසු නුසුදුසු තත්ත්වයන් පිළිබඳ අවබෝධයෙන් සිට සුදුසු යහපත් කාර්යයන්හි පමණක් තම පිරිස යෙදවිය යුතු වන්නාක් මෙන්ම සෑම කාර්යයක්දීම අනාගතය පිළිබඳ සිතා කටයුතු කිරීම නුවණට හුරුය. තම අනුගාමික පිරිසෙහි සුවිශේෂීය දක්ෂතා ඇත්තවුන් හදුනා ගෙන ඔවුන්ට විශේෂ සැලකිලි දැක්වූවාට කම් නැත. එය කළ යුත්තේම ය. එසේ කිරීම එකී තැනැත්තාගේ දක්ෂතා අගය කිරීමක් මෙන්ම අන් අයගේ දක්ෂතා එළි දැක්වීමට ද රුකුලක් වනු නොඅනුමාන ය.

මෙකී කරුණුවලින් ගම්‍යමාන වන කාරණා බොහොමයක් ඇත. එනම් නායකයා හුදෙක් තමා පිළිබඳව හොඳ අවබෝධයකින් සිටිය යුතුය. තමා මැනවින් තමාවම හදුනා ගත යුතුය. එමෙන්ම යහපත් අයහපත් දෑ හදුනා ගනිමින් යහපත් දෑ පමණක් කළ යුතුය. සියලු අයහපතින් නායකයා වෙන් වන අතර හැම විටම අයහපත සිදු කරන්නට සිතට කිසි විටෙකත් ඉඩ නොදෙනු ඇත. නිසි නායකයා අධර්මය, අයහපත තමා අසලට නොගන්නා අතර සුදුසු දෑ පමණක් පමණට සිදු කරන්නෙකි. තවද සියලු අවබෝධයන්ගෙන් හා දැනුමෙන් නායකයා සන්නාහසන්නද්ධ වන අතර යහපත් මාර්ගයෙහි පමණක් නිසි ආකාරව ගමන් ගනී. එමෙන්ම මනා නායකයා තමාට ලබා ගත යුතු සියලු දෑ අවශ්‍ය ප්‍රමාණයට පමණක් ලබා ගන්නා තැනැත්තෙකි. ගරු කළ යුත්තාට ගරු බුහුමන් දක්වමින් සුදුසු පුද පූජා පවත්වන්නට නිසි නායකයා කිසි විටෙකත් පැකිලෙන්නේ නොවේ. බුද්ධිමතුන්ගෙන් අවශ්‍ය පරිදි තමා නොදත් දෑ දැන ගැනීම, අවශ්‍ය උපදෙස්

15 පිටුවෙන්...

ආර්.එන්.එච්.එම් සමන් ජයරත්න.

# යශෝදරාවතින් දුටු සිදුහත් යශෝදරා චරිතය

## අව්වේ තියන රැස් මාලා අඩු වේවා
## ගව්වෙන් ගව්ව දිව මාළිග සෑදේවා

යශෝදරාවත" යනු ගැමියන් අතර ඉතා ජනප්‍රිය පද්‍ය කෘතියකි. එය මහනුවර යුගයේ කවියෙකුගේ අපූරු නිර්මාණයකි. පූජාවලියෙත් බුදු සිරිතෙත් දැක්වුණු යශෝදරාවගේ චරිතයට වඩා නුවර යුගයේ ගැමි කවියා නිරූපණය කළ යශෝදරාව වෙනස් වේ. මහනුවර යුගයේ සිටි ගැමි කවියා යශෝදරාව නිරූපණය කරන්නේ උගතුන් දුටු යශෝදරාවට වඩා සාමාන්‍ය ගැහැණියකගේ හැඩයට ආසන්නවය. අප දන්නා බුදු සිරිතේ යශෝදරාව මේ තරම් දීර්ඝ වැළපීමක යෙදුණු වගක් නොදැක්වේ. එසේනම් ගැමි කවියා හොඳින් දන්නා ගැමි ගැහැණියකගේ චරියා රටාව යශෝදරාවතින් යශෝදරාවට ආරෝපණය කළා යැයි කීම රචකයාට කරන ගෞරවයක් සේ සැළකිය හැකිය.

**මුව ජාතියේවද පළමුව උපන්නේ**
**එම ජාතියේ සිට නෑරම මම එන්නේ**
**කොයි ජාතියේ උපන්නත් මෙහෙසුන් වන්නේ**
**මේ ජාතියේ ඇයි මා තනිකර යන්නේ**

උගතුන් යශෝදරාවගේ වැළපීමට හෝ සිද්ධාර්ථ කුමරුගේ නික්ම යෑනමට හෝ නව අර්ථකතන නොදුන්නෝය. ගැමියා එය වැදගත් වචනයකින් වසා ගැහැණියකගේ තනි වීම අඩු තක්සේරුවකට ලක් නොකළේය. ඒ නිසාම ඇයි මා තනිකර යන්නේ" යන යෙදුමෙන් ඊට හිසි ස්ථානය දුන්නේය. එමෙන්ම යශෝදරාව හඬා වැළපෙන විට ගැමි ගැහැණියක මෙන් අතීතය පුනරාවර්ජනය කරයි.

**එදා හිමේ තපසට දෙදෙනා සහ කැලේ**
**වඩා දෙදරුවන් උකුලට රැගෙන ලොලේ**
**බෙදා උනිමි පන්සල් දෙකම එක කලේ**
**මෙදා මොකද තනිකර යන්ට මම කලේ"**

එම කවියේදීත් ගැමි කවියා මහාභිනිෂ්ක්‍රමණය යනු සැමියෙකු විසින් බිරිඳව තනි කර යෑමකට අර්ථකතනය කරයි. එම කවියේදිත් සාමාන්‍ය ගැහැණියක මෙන් අතීතය සිහි කිරීමට අමතක නොකරයි.වෙසතුරු ආත්මය තෙක් ඇය සිහි කරයි. යශෝදරාවගේ වැළපිම ගැමි කවියා කඳුළු" යන වචනය භාවිතා නොකරයි.

**"තොමා වැටේ මගෙ සලුපිලි නෙත් පුරවා**
**අමා රසක් වැනි හිමි සඳ සිහි වෙනවා**
**දමා කුමරු වැඩියා මට සිහි වෙනවා**
**මෙමා ඇරලියෝ ලෙව් තුළ ඇද්ද තවා"**

ගැමියා යශෝදරාව ලවා සිද්ධාර්ථ කුමාරයා අමාරසයකට උපමා කොට තිබේ. එම යෙදුම ලෞකික පෙම්වතෙකු පිළිබඳ එබඳුම පෙම්වතියකගේ අතිශය පෞද්ගලික ආමන්ත්‍රණයකි. එතනදීත් දමා කුමරු වැඩියා" යන යෙදුමම යෙදීමට කවියා උත්සහා දරයි.

මෙමා ඇරලියෝ ලෙව්තුළ ඇද්ද තවා"

ඕනෑම ගැහැණියක් තමන් තරම් කිසිවෙකු දුක් නොවිඳියි සිතයි.

**උන්නෙමු අපි ඉපිද ලෙහෙනුන් කුලේ එදා**
**වැටුණේ ජලය මැද සමුදුරයේ බිඳිදා**
**දැනුනේ කරපු වීරිය ගොඩ ගන්ට එදා**
**හිමි රජුනේ මගෙ හැරියේ මන්ද මෙදා**

මෙලෙස ස්ථාන කීපයකදීම අභිනිෂ්ක්‍රමණය වෙනුවට මඟ හැරීම, තනිකර යෑම, වැනි අර්ථකතනයක්ද දී තිබීම ගැන අප යශෝදරා වත පරිහරණය කරන විට සැළකිලිමත් විය යුතුය.


**රුව ඇති පුතුන් හැදුවා මම වැරදීද**
**රුව ගුණ තේජසක් මගෙ අඩුවුණා වද**
**ගරු සරු නැති කමක් මාතින් යෙදුණාද**
**මරු බිඳ බුදු වෙන්න සිහිනෙන් පෙනුනාද**

පෙරදිග ස්ත්‍රිය නිතරම අර්බුධයකදී වරද තමන්ගේ යැයි සිතයි. ඉහත කවියෙන්ද දැක්වෙන්නේ නුවර යුගයෙත්, එමෙන්ම තවමත් ඇතැම් කාන්තාවන් තුළ පවතින වරද තමන්ගේ යැයි සිතන මනෝභාවයයි. යශෝදරා දේවියද තමන් හැර යෑමට හේතුව තමන්ගේ වරද බව සිතන අන්දම් කවියා පවසයි.

**"සුවඳ බොජුන් වැළඳූ මගෙ හිමි සඳට**
**නිබඳ බොජුන් රස කරදුන් වළඳන්ට**
**සුවඳ පලා පල වැවියන් හිමියන්ට**
**සුවඳ මල් නිතර පිපියන් රන් කඳට"**

යශෝදරාව ලවා ගැමි කවියා කියවන මෙම ප්‍රකාශය දිසි අරුතෙන් පමණක් ගත යුතු නැත. වැසි අරුතක්ද තිබේ. වෙන්ව යන සැමියාට වෙන්ව යෑමෙන් පසු ඇති විය හැකි දුෂ්කරතා මේ කවියේ තිබේ. එය කියා ඇත්තේ සෘජුව නොව අර්ථ ධ්වනියක් ඇති වන පරිද්දෙනි. සෘජු භාෂණය රසවත් නැත.

**පිරිය ලෙසට සැතපුන අප මල් යහනා**
**බැරිය ඉතින් දැකලා මගෙ පපුව දනා**
**වීරිය බුදු බවට බාදා නොව වඩිනා**
**සූරිය මඩල මෙනි ඔබ සැතපුන යහනා**



යශෝදරාවතේ එන සංකේත හා වක්‍රෝක්ති වලින් පිරුණු කවියක් ලෙස මේ කවිය හැඳින්විය හැකිය. දෙදෙනා නිදාගත් යහන සූර්ය මණ්ඩලයක් සේ යශෝදරාව දකියි. නමුත් සිදුහත් කුමරු දැන් මාළිගයේ නැත. එම නිසා ඔහු හැසිරුණු තැන් භාවිතා කළ දෙය යශෝදරාවට මහත් කම්පාවක් ගෙන දෙයි. එදා සිදුහත් විඳි සැපත හා අද විඳින දුක් යශෝදරාව සිහිකරයි,

**හිමයේ ගොසින් මල් යහනක නිදනවද**
**කොමළ අනඟි සිරිපා දෙක රිදෙනවද**
**හිගේ නැතිව දෙවියෝ මුර කරනවද**
**මගේ ඇත් රජුනි හිමි සඳ කොතැනකද"**

මෙම කවියේදීත් යශෝදරාව සිතන සිතුවිල්ල කෙළින්ම නොපවසා වක්‍රෝක්තියකින් දෙදෙනා අතර ඇති ආදරණිය බැඳීම පාඨකයාගේ සිතට ගලා ඒමට ඉඩ සලසා ඇත. මෙහි අවසාන පදයේ ඇති මගේ ඇත් රජුනි" යන යෙදුම ලෝකයේ ඇති ලොකුම ප්‍රේමය තමන්ට අයත් බව කීමට යොදා ගෙන ඇති වචනයක් බව හැඟෙයි.

යශෝදරාව තමන් අතහැර ගිය සැමියාට,

**කැලේ තිබෙන කොයි දේවත් රස වේවා**
**මලේ බමරු මෙන් පිරිවර ඇති වේවා**
**අව්වේ තියන රැස් මාලා අඩු වේවා**
**ගව්වෙන් ගව්ව දිව මාළිග සෑදේවා**

යි පතයි. මෙබඳු වෛරයෙන් තොර විශ්ව ප්‍රාර්ථනාවක් කළ හැක්කේ පෙරදිග ස්ත්‍රියට පමණි. තමන් හැර දා ගිය සැමියාට ගව්වෙන් ගව්ව දිවමාළිග සෑදෙන්නට යැයි පැතීමට තරම් අහිංසක සිතක් අපේ කාන්තාවට තිබුණි. අදත් ඇතැම් කාන්තාවන් තුළ පවතී. කොතෙක් තමාට ගැරහුම් අවමාන කළත් අපේ කාන්ථාව ඔහුට වෛර නොකරයි.

**කියන මැසිවිල්ල හිමි හට නො ඇසෙනවා**
**රන්කඳ මහිමි මට හිනෙන් නො පෙනෙනවා**
**කම්රස විඳීමක් නැත මම දිවිරනවා**
**වෙන් කර ගියත් මම සිලේ පිහිටනවා**

හීනෙන් නොපෙනෙන්නේ යශෝදරාව තද නින්දක නොසිටින නිසාය. කම් රස විඳීමක් නැත" යන ප්‍රකාශය එතැන් පටන් පෙරදිග අපේ කාන්තාවගේ චර්යාවක් විය. පිරිමියා බිරිඳ මිය ගිය විගස විවහා වෙයි. ගැහැනිය හැසිරී ඇත්තේ තවත් විවහයක් ගැන සිතා නොවන බව මෙම කවියෙන් පැහැදිලි වෙයි.

කෙසේ වෙතත් ගැමි කවියා මැවූ යශෝදරාවත තුළින් ස්ත්‍රිය තුළ ස්වාමි භක්තිය, ගෞරවය, අවිහිංසාව ජනිත කරවයි. සැමියාට ගරු කිරීමට උගන්වයි. වර්තමාන සිත්‍රිය තුළ පවා යශෝදරාවක් පිවත් වෙයි. සම්ප්‍රධාය මඟින් හික්මවනු ලැබූ ශ්‍රීලාංකික අඹුසැමි ප්‍රේමය හැදෑරීමේදී යශොදරාවතේ එන සිදුහත් යශෝදරා ප්‍රේමය ගැමියා දුටු අන්දම තවත් අගයෙන් පිරිහී නැති බව සඳහන් කළ යුතුය.

දිල්රුක්ෂි අබේකෝන්

# දින දින පිරිහෙන මව්පදවිය ආරක්ෂා කර ගැනීමේ වගකීම කා සතු ද?

ශාස්ත්‍රපති මිහිරිපුර ධම්මප්‍රදීපා භික්ෂුණිය
ශ්‍රී ධර්ම ප්‍රදීපාරාමය - ගොකරැල්ල.

**කාන්තාවකට මේ මිහිපිට ලැබිය හැකි උතුම්ම පදවිය වන්නේ මව්පදවියයි. ඇය සක්විති රැජිනක් වුවත් මවක් වීමට නොහැකි නම් ඒ කාන්තාවගේ ජීවිතයේ විශාල අඩුවක් ඇත. ඒ නිසා බුදුන් වහන්සේ 'බුද්ධෝව්ය මාතා' යනුවෙන් මව්පදවිය බුද්ධත්වයට සමාන කර දේශනා කළ සේක. මිනිසෙකුට ලොව ලබා ගත හැකි ශ්‍රේෂ්ඨතම පදවිය වන්නේ බුද්ධත්වයට පත්වීමටයි. එතනින් එහා යන්නට තවත් ශ්‍රේෂ්ඨ පදවියක් නැත. එසේ නම් ලොව ඇති උත්තරීතර තවත් ශ්‍රේෂ්ඨ පදවිය ලබාගත් කාන්තාවන් ඒ ශ්‍රේෂ්ඨ පදවියේ ඇති සියලු ගුණාංග දිවි හිමියෙන් ආරක්ෂා කර ගත යුතුවේ. බුදුන් වහන්සේ තුළ තිබුණ මහා කරුණා ගුණය හදවතේ දරාගෙන ඉතාම දුක් මහන්සියෙන් තම දරුවන් හදාවඩා ගන්නා අහිංසක අම්මාවරුන් අද අප රට තුළ බොහෝ සෙයින් ඇත. මව් පදවිය කෙළසන මව්වරුන් ඇත්තේ ඉතාම අතලොස්සක් පමණි. අවාසනාවකට මෙන් මාධ්‍ය තුළින් උලුප්පා පෙන්වන්නේ ඒ අතලොස්සක් වූ මව්වරුන් පමණය. ඒ නිසා අපේ රටේ සමස්ත මව්වරුන්ටම මේ අපහාසය විඳින්නට සිදු වී ඇත.**

මවක් විසින් තම දරුවා මව්කුස තුළ මරා දැම්මටත් උපන් පසු විසිකර දැම්මටත් දරුවන් සමඟ සිය දිවි තොර කර ගැනීමටත් දරුවන් විකිණීමට අතරමං කිරීමට, ගඟට දැම්මට ආදී කිසිසේත් මව්පවියට නොගැලපෙන ගදවත කම්පාකරන දේ සිදු කිරීමට පෙළඹෙන්නේ කුමක් නිසා දැයි අප සොයා බැලිය යුතුය. අප රට තුළ පවතින සිංහල සංස්කෘතියට අනුව දියණියකට නිසි වයසේදී තම දෙමාපියන් විසින් සුදුසු සහකරුවෙකු සොයා දී ඔහු විවාහ කර දෙයි. ඒ නීත්‍යානුකූලව විවාහ වූ කාන්තාව මව් පදවිය ලබයි. ඒ ඇගේ දෙමාපියන්ට සහෝදරයන්ට ඉතාම සතුටට කාරණයක් වන අතර ඒ අලුත් අමුත්තා ඉතා ආදරයෙන් පිළිගන්නට රැකබලා ගන්නට පෝෂණය කරන්නට සියල්ලෝම සුදානම් වෙති. අපේ සංස්කෘතියට අනුව ගැබිණි මාතාවකට ඉතාම ගරු සැලකිලි දක්වයි. අසල්වාසීන් පවා ඇයට රසවත් කෑම බීම සපයා දෙමින් හෝබෝ සෙනෙහසින් රැකබලා ගනී. එසේ සියලු දෙනාගේ ගෞරවයෙන් ආදරයෙන් මව්පදවිය ලබන මව සුරක්ෂිතය. ඇය තම දරුවා ඉතා සෙනෙහසින් යුතුව හදාවඩා ගන්නේ මව්පදවියේ උතුම් ගුණාංග ආරක්ෂා කර ගනිමිනි.

අපේ බෞද්ධ සංස්කෘතියට අනුව විවාහය තෙක් කුමර කුමරියන් අනිවාර්යයෙන්ම බඹසර ආරක්ෂා කළ යුතුය. එසේම පංචශීල ප්‍රතිපදාවට අනුව කාමයෙහි වරදවා නොහැසිරිය යුතුය. මේ වැනි උතුම් ප්‍රතිපත්ති ආරක්ෂා නොකරන තරුණ තරුණියයෝ බොහෝ දෙනෙක් විවාහයට පෙර නම් සැප විඳිති. ඒ තුළින් යම් තරුණියකගේ කුස තුළ දරුවෙකු පිළිසිඳ ගත හොත් බොහෝ දුරට සිදු කරන්නේ ඒ දරුවා හොර රහසේම මව්කුස තුළ මරා දැම්මය. එසේ නැති නම් එම තරුණිය හා සම්බන්ධ වන තරුණයා ඇය තනිකර දමා පලායති. කිසිත් කරකියාගන්නට නොහැකි තරුණිය සමහර විට තම දරුවා බිහිවන තෙක් මව්කුස තුළ දරාගෙන සිට බිහි වූ පසු මරා දමති. විසිකර දමති. එසේ නැතිනම් කාට හෝ විකුණා දමති. මේ වැනි අසරණ තත්ත්වයට යම් කිසි මවක් පත් වුවහොත් අපේ සමාජය පෙළඹී ඇත්තේ ඒ මවට පමණක් චෝදනා එල්ල කිරීමටය. ලෝකයේ කිසිදු මවකට තනිවම පුරුෂයෙකුගේ සම්බන්ධතාවයක් නොමැතිව තම කුසට දරුවෙකු පිළිසිඳ ගන්වා ගැනීමට නොහැකිය. එනිසා මෙවැනි අවස්ථාවක මවක් මේ තත්ත්වයට පත් වීමට ප්‍රධාන වගකිවයුතු පුද්ගලයා වන්නේ ඇය හා සම්බන්ධතා පැවැත් වූ පුරුෂයාය. ඔහුට චෝදනා එල්ල කර කාන්තාවන් මෙසේ අසරණ කිරීම පිළිබඳ නිසි දඬුවම් ලබා දිය යුතුය. ඒ සඳහා අවශ්‍ය කරන නීති රීති සියල්ල ද අප රට තුළ සම්පාදනය කර ඇත.

තවද විවාහ නොවී කාන්තාවක් ගැබ් ගැනීම අප සමාජය දකින්නේ මහා සාපරාධී අපරාධයක් ලෙසිනි. ඒ ඇය සිය පවුලට කරන ලද මහා නින්දාවක් ලෙසය. ඒ නිසාම ඇතැම් විට ඇය තම දෙමාපියන් සහෝදරයන් විසින් නිවසින් නෙරපා හරින් ලැබේ. ඒ මවට තම දරුවා මරා දමන්නට යැයි බල කිරීම ගුටි බැට දීම නින්දා අපහාස කිරීම ආදි වශයෙන් දේ සිදු කර ඇයට මිහිපිට අපායක් සමාජ විසින් සදා දෙනු ලැබේ. මේ අපායෙන් ගොඩ එන්නට ඇය මහත් වේදනාවෙන් යුතුව තම දරුවා විනාශ කිරීමට පෙළඹෙති. මා දන්නා පරිදි කිසිදු මවක් විසින් මේ වැනි දේ ඉතා සතුටින්න නොකරයි. ඇය මුළු ජීවිතය පුරාම මේ සිද්ධිය මතක් කරමින් කඳුලු වගුරන්නීය.



අප අතර සිටින කාන්තාවන් දියණියන් මේ වැනි තත්ත්වයකට පත් වුවහොත් ඇගේ දෙමාපිය සහෝදරයන් සියලු දෙනාම ඇය කෙරෙහි ඉතාම සානු කම්පිතව බැලිය යුතුය. ඇයට මේ වරද සිදු වූයේ කාගෙන් දැයි සොයා බලා සාධාරණයක් ඉටු කිරීමට නීති මඟින් හෝ පිහිට ආදාර ලබාගැනීමට කටයුතු සලසා දිය යුතුය. අපේ සමාජය විසින් නීත්‍යානුකූල සැමියෙකු සිටනි කාන්තාවක් මවක්වීමේ ලකුණු පහළ කළ කල්හි ඇයට දක්වන ගරු සැලකිලි ආදරය ද දක්වන්නට අපේ සාමජයට හැකි නම් මේ වැනි සාපරාධී ක්‍රියාවන් වලක්වා ගැනීමට බොහෝ දුරට අපට ඉඩකඩ ඇත. ඒ සඳහා වගකීම සමාජයේ සියලු දෙනා වෙතම පැවරෙන්නේය.

අපේ රටේ සංස්කෘතියට අනුව සැමියෙකු නොමැතිව කාන්තාවක දරුවෙකු බිහි කිරීම සදාචාරසම්පන්න නොවේ. ඒ බව සියලු දෙනාම දන්නේය. එසේ නම් එවැනි තත්ත්වයකට පත් නොවී ආරක්ෂා වීමට කාන්තාවන් විශේෂයෙන්ම වගබලා ගත යුතුවේ. මේ වැනි තත්ත්වයකට පත් වුවහොත් තමන්ගේ මුළු අනාගතයම විනාශ වී යන බව වටහා ගෙන විවාහය තෙක් බඹසර ආරක්ෂාකර ගැනීම ඇය සතු වගකීමකි. කාන්තාවක් මේ වැනි තත්ත්වයකට පත් වුවහොත් තම කුස තුළ දරුවෙකු පිළිසිඳ නොගැනීමට කටයුතු කිරීමට අවශ්‍ය සෞඛ්‍ය පහසුකම් උපදේශන සේවාවන් අප රට තුළ ඇත. ඒවා පිළිබඳ දැනුවත් විය යුතුය. නිවැරදි සෞඛ්‍ය ක්‍රමෝපායන් අනුගමනය කරන්නේ නම් මව් කුස තුළ දරුවන් මරා දැම්මේම් ස් ට කිරිකැටියන්ට සිදු කරනු ලබන සාපරාධී ක්‍රියා සිදු කිරීමට අවශ්‍ය වන්නේ නැත. කොතෙක් ඒ සඳහා අවශ්‍ය සෞඛ්‍ය පහසුකම් තිබුණත් ඒවා පිළිබඳ දැනුමත් නොවීමත් මේ වැනි සාපරාධී ක්‍රියාවන් අප රට තුළ සිදු වීමට එක් හේතුවකි.

නීත්‍යානුකූලව සැමියෙකු සිටින කාන්තාවක් ද මේ වැනි සාපරාධී ක්‍රියාවන් තම දරුවන්ට සිදු කිරීමට පෙළඹී ඇත.

එයට බොහෝ දුරට හේතු වී ඇත්තේ තම ස්වාමියා තමන්ටත් දරුවන්ටත් නොසලකා හැරීමය. තමන් විසින් උපයා ගන්නා ලද මුදල් වලින් මත් ද්‍රව්‍ය පාවිච්චියටත් අනාචාරයේ හැසිරීම් හැසිරීම් ආදී නොයෙක් දෝ සිදු කරමින් රෑ මැදියමේ ගෙදරට එන ස්වාමිපුරුෂයා දරුවන්ටත් තම බිරිඳටත් ගුටි බැට දෙමින් නොයෙක් ආකාරයේ වද හිංසාවලට ලක් කරනු ලබේ. ස්වාමි පුරුෂයෙකු විසින් තම බිරිඳටත් දරුවන්ටත් ඉටු කළ යුතු කිසිදු යුතුකමක් ඔහු අතින් සිදු නොවේ. මේ වැනි අසරණ තත්ත්වයකට පත් වී දුක් විඳින ඇතැම් මව්වරුන්ට වෙත කරන්නට කිසිදු දෙයක් නොමැති කළ ඇතැම් විට දරුවන් ද සමඟ දිවි තොර කර ගනිති. එසේම දරුවන් කාට හෝ දීමටත් ඉපදෙන දරුවන් මරා දැම්මටත් පෙළඹෙති.

මේ වැනි අසරණ මව්වරුන්ට පිහිටවීම සඳහා ආයතන මෙන්ම නීති රීති අපරට තුළ නැතුවා නොවේ, එහෙත් ඒවා පිළිබඳ දැනුවත් වීම හෝ විශ්වාසයක් රට තුළ තාමත් ගොඩ නැගී නැත. විශේෂයෙන්ම ජනමාධ්‍ය තුළින් මේවැනි සාපරාධී ක්‍රියා උලුප්පා දින ගණන් පෙන්වනවාට වඩා මේ වැනි දේ වලක්වා ගැනීමට හැකි ක්‍රමවේදයන් ආයතන මෙන්ම නීතිරීති ගැන දැනුවත් කරන්නේ නම් එය මේ සමාජයට සිදු කරනු ලබන මහඟු සේවාවකි

මහමග සිඟමන් යදමින් තම ශරීරය විකුණමින් වැස්ස අව්ව නොබලා කුලී වැඩ කරමින් හේන් කුඹුරු කොටමින් පියවරු දමාගිය දරුවන් තමන්ට කුමන දුක් කරදර පැමිණියත් හදාවඩා ගන්නා උතුම් මව්වරුන් අප රට තුළ කෙනෙකුත් ඇත. එසේම විදේශගතව රැකියා කරමින් අපට රට තුළම නොයෙක් ආකාරයේ රැකියා කරමින් තම ස්වාමියා ද දරුවන් ද පෝෂණය කරනු ලබන දිරිය මව්වරුන් ද අප රට තුළ ඇත. වැලේ ගෙඩිය වැලට බරක් නොවේ යැයි කියමනක් ඇත. තම සැමියා දමා ගියත් සමාජයෙන් කොපමණ නින්දා අපහාස වින්දත් දසමසක් කුස හොවා මේ ලොවට ඉතා දුක් වේදනා විඳිමින් බිහි කරන ලද තම කිරිකැටියා ගැන දාරක ප්‍රේමය ඇති කරගත් කිසිදු මවකට මේ වැනි සාපරාධී ක්‍රියා සිදු කිරීමට නොහැකිය. ඒ නිසා කාන්තා ඔබ මේ වැනි තත්ත්වයකට පත් වුවහොත් සියලු අභියෝග ජය ගෙන ඔබේ දරුවා හදාවඩා ගන්න. දිනක මුළු ලෝකයම ඔබට නැති වුවත් ඔබ ආදරයෙන් හදාවඩා ගත් දරුපැටියා ලොකු මහත් වී ඔබේ මහළු වයසේ ඔබ සෙනෙහසින් රැක බලා ගනිවී.

දිරිය මව්වරුන් ද අප රට තුළ ඇත. වැලේ ගෙඩිය වැලට බරක් නොවේ යැයි කියමනක් ඇත. තම සැමියා දමා ගියත් සමාජයෙන් කොපමණ නින්දා අපහාස වින්දත් දසමසක් කුස හොවා මේ ලොවට ඉතා දුක් වේදනා විඳිමින් බිහි කරන ලද තම කිරිකැටියා ගැන දාරක ප්‍රේමය ඇති කරගත් කිසිදු මවකට මේ වැනි සාපරාධී ක්‍රියා සිදු කිරීමට නොහැකිය. ඒ නිසා කාන්තා ඔබ මේ වැනි තත්ත්වයකට පත් වුවහොත් සියලු අභියෝග ජය ගෙන ඔබේ දරුවා හදාවඩා ගන්න. දිනක මුළු ලෝකයම ඔබට නැති වුවත් ඔබ ආදරයෙන් හදාවඩා ගත් දරුපැටියා ලොකු මහත් වී ඔබේ මහළු වයසේ ඔබ සෙනෙහසින් රැක බලා ගනිවී.

# ජාතක කථා කාව්‍ය තුළින් 'ජනකවියා' විමසුම් කළ කාන්තා ප්‍රශ්න

යූ.බී දිසානායක - කැකිරාව



සිංහල ජනකවිය වඩාත්ම පෝෂණය වී හැදී වැඩුනේ ගැමියා තුළ තිබූ අව්‍යාජ ගැමි සිතුවිලි හා අදහස් උදහස් කාව්‍යයට නැගීම නිසාය. මෙම කවිසිතුවිලි පොදු ජනතාවගේ මුවින් ගලාගියේ බුදුදහම හා සම්මිශ්‍රවීමෙන් ඇති වූ සාරධර්ම පද්ධතින් සමග බැවින් එම කවි නිර්මාණවල රසාත්මක බවක් මෙන්ම ගැඹුරු දහම් පණිවුඩ ද අන්තර්ගත නොවුනා නොවේ. කරුණාව මෛත්‍රීය කෘතගුණ සැලකීම පස්පවින් දුරුවීම වැනි කරුණු කාරණා ජනතාව අතර වර්ධනය කිරීමට බුදු දහමින් ලැබුණු පිටිවහල අති විශාලය.

මීට දශක තුන හතරකට පෙරාතුව විහාරස්ථාන වල පැවැති බණ පිංකම් උත්සව වලදී ජාතක කථාවස්තු සුවිශාල බණ මඩුවේම වේදිකා ගත විය. ඒ ඇසුරෙන් ධර්මදේශනාව ද සකස් විය. ගැඹුරු අභිධර්ම කරුණු නොවුව ද මිනුෂ්‍ය ජීවිතයට අවශ්‍ය මූලික අදහස් උදහස් වලින් පූර්ණ වූ මේ කථා වස්තු අතර සඳකිඳුරු ජාතකය මුව ජාතකය වෙස්සන්තර ජාතකය සත්තිය ජාතකය මගමාන ජාතකය ආදී කථා වස්තු බෙහෙවින් ජනප්‍රිය විය. නාගරික පරිසරයෙන් මිදුණු ඈත ග්‍රාමීය පෙදෙස්වල මේ ජාතක කථා ඇසුරෙන් නාට්‍ය රඟදක්වන නාට්‍ය කණ්ඩායම් අද තිබෙන බව රහසක් නොවේ. ලොකු මොනිටර් පොත්වල ලියා පරම්පරාවට උරුමයක් සේ උරුමකර දුන්හ.

එබැවින් ජාතක කථා ඇසුරින් පෝෂණය වී සශ්‍රීක වූ ජාතක කවි කථා සාහිත්‍යත් සමග මෙරට සමාජය තුළ නාට්‍ය කලාව ද වැඩි දියුණු වූයේ යැයි යන්න කාටිසිනුත් පිළිගත යුතු සත්‍යයකි. ඉදහිට නගරයේ විහාරස්ථානයක බණමඩුවක මෙවැනි නාට්‍ය කණ්ඩායම් රඟ දක්වනු ලබන අවස්ථා ඇසුණුවොත් හෝ ඔබද දැක ඇතුවාට සැක නැත.

ජාතක කථා කාව්‍ය නිර්මාණය කළ බොහෝ කර්තෘවරු අඥාතය. ඒ කුමන කාරණයක් නිසා දැයි පැහැදිලි නැතත් අනෙකුත් සුවිශාල බෞද්ධ කලාකෘති නිර්මාණය කළ කලා කරුවන් මෙන්ම මොවුහුද සිය නම් ගම් වාසගම් ප්‍රදර්ශනයට කැමැතිවූයේ නැත. කතාලොව පසිදු අවුකන බුද්ධ ප්‍රතිමා වහන්සේ රැස්වෙහෙර බුද්ධ ප්‍රතිමාව, ඉසුරුමුණි පෙම් යුවල, මහමෙව්නාවේ ඇති උතුම් සමාධි බුද්ධ ප්‍රතිමා වහන්සේ වැනි උත්තරීතර කලාකෘති නිමැවුම් කළ සැබෑ නිර්මාණ ශිල්පීන්ගේ ද වත ගොත සැබෑවටම එළිපෙහෙලි වී නැත. ජාතක කථා කාව්‍ය නිර්මාණය කළ කවිහුද තම වත ගොත හෙළි නොකොටම මේ මිහිමතින් සමුගත්තේ ඔවුනු කළ නිර්මාණය හුදෙක් ආර්ථික වාසියක් අරමුණු කොට ගෙන සිදු නොකළ නිසා විය හැකිය.

මුව ජාතක කථාව ඇසුරෙන් රචනා වී ඇති,

**සවන පුරා බණ ඇසුවයි සතොසින්**
**නුවන පුරා කඳුලැලි වයි දෙනෙතින්**
**මෙවන් දහම් දැනගන කර පින්දන්**
**නිවන් දකින්නට අපි යම් සතොසින්**

කාව්‍යයෙන් ද 'මගමාන' ජාතකය ඇසුරෙන් රචනා වී ඇති කාව්‍යයේ එන

**සසර දුකින් මිදෙනා විලස කර ලොලේ**
**පවර 'මගමාන' ජාතකය කවි කළේ**
**සතර දෙස තුණුරුවන් ගුණවෙයි පතලේ**
**සතිර කවි හැත්තෑ නමකි නිමකලේ**

කාව්‍යයෙන් ද 'කට්ඨාරි ජාතකය' ඇසුරෙන් ජන කවියා රචිත,

**ජාතක කථා පොත 'කට්ඨාරිය' කියන**
**තෑසැක මෙයින් කාටත් හැකි දැසගන්න**
**ලෝකෙක උතුම් අපි කවරුන් උපදින්න**
**මේ එක පිනෙන් සසරේ වාසනාවෙන**

මෙවැනි නිදසුන් මඟින් පැහැදිලි වන්නේ කිවියා විසින් කරනු ලබන කාර්යභාරයෙන් සමාජයට යහපත් දෙයක් ලබා දෙන්නට ප්‍රාර්ථනා කළා විනා අඩු තරමින් තමන්ගේ නම ගමවත් හෙළි කිරීමට තරම් එම අයගේ කැමැත්තක් තිබුණෝම නැති බවය. කාගේ කවුරුද කොහේද යන්න නොව කාලදෙසා කුමන යහපත් ධර්මයක් කවිකොට කියන්නේද? යන උත්තරීතර පරමාර්ථය විනා ඔවුනු තුළ ජනප්‍රියවීම් ඕනෑකමක් තිබූ බවක් පළ නොවීමෙන් ඔවුනු ධර්මය සැබෑවටම අවබෝධ කරගෙන තිබූ පිරිසක් ලෙස ද හැඳින්වීම පමණක් ඔවුනු හෙ කරනු ලබන උත්තම පූජාවක් වනු ඇත.

කට්ඨාරි ජාතක කාව්‍යයේදී මේ අයුරුන් නිර්මාණය වූ ජාතක කථා වස්තුවක් පාදක කොටගෙන ජනකවියා නිර්මාණය කරන ලද්දකි. සිය නම් ගම් සඟවාගත් කවියා කවි හැත්තෑදෙකක් පමණ මාත්‍රා 18 කින් යුතුව නිර්මාණය කොට සිය කථා කෞශල්‍යය විදහා දක්වයි.

පෙර බරණැස්නුවර රාජ්‍ය කරන ලද බ්‍රහ්මදත්ත නම් රජ කෙනෙකු මුව දඩයමේ ගොස් වන වැදී ආපසු තනිව එන අවස්ථාවේදී දර කඩමින් සිටි සුරූපී කාන්තාවක් දැක ඇය කෙරෙහි බැඳුනු සිත් ඇතිව ඇය සමග ප්‍රේමයෙන් බැඳී විසී දින කිහිපයකින් ඇය අත්හැර රජ මැදුරට එන රජතුමාගේ තම ප්‍රේමය පිළිබඳව සහතිකය ලෙසනින් පේරැස් මුදුවක් දී 'දුවක්' උපනොත් එය විකුණා ජීවත් විමටත් 'පුතෙකු' ලැබුණ හොත් එම මුදුව සමග මාලිගාවට පැමිණ රජතුමා මුණ ගැසීමටත් දක්වා පිටත්ව පැමිණියහ. නැවත කිසි දිනෙක රජතුමා ආපසු පැමිණියේ නැත. කලක් ගත වූ පසු මතු සඳහන් කාන්තාව පුතෙකු ලැබ වයස අවුරුදු පහක් වනතුරු හදාවඩා ගන්නාලදී. දරුවාට අවශ්‍ය පෝෂණය තිබි අයුරින් ලබාදීමට දර කඩා ජීවත්වන මෙම කාන්තාවට නොහැකි බැවින් රජතුමාගේ සිහිකිරීම අනුව රජ මාලිගාවට යාමට පිටත්විය. ඉන්පසු කුමරා හඳුනාගන්නට රජතුමාට අපොහොසත් වීම, කුමරා යම් අධිෂ්ඨාන ක්‍රියාවක් කිරීමෙන් අහසේ පළසක්බැඳ සිටීම මවගේ සත්‍ය ක්‍රියාව පසුව රජතුමා පැහැදී කුමරා භාර ගැනීමට කුමරාට රාජ්‍ය පිරිනැමීම කුමරාගේ මෑණියෝ බිසවක් ලෙසට භාරගැනීම නුවර උත්සව පැවැත්වීම ආදී කරුණු කාරණා ඔස්සේ ජනකවියා තම කවි කථාව ඉදිරිපත් කරයි.

කථාව ආරම්භවන්නේ මේ අයුරිනි, **'නිරිඳුන් පවර බඹදත් බරණැස තරුණ**
**දඩයන් පිණිස වැද දවසක් ගිරි අරණ**
**වළවන් මුවෙකු ගොස් මාවත වැර දෙමින**
**තනියෙන් ගමන වනසඳ ආපසු බවන'**

මේ එන අවස්ථාවේදී රූමත් කාන්තාවක් දරකඩනු දක්නාලදී. රජතුමා අගේ රූපශ්‍රීයෙන් වශීවෙයි. මේ නිසාම රජතුමාගේ මුවින් පළ කරන අයුරින් රචනය වී ඇති මේ කවිය රජුගේ අදහස් උදහස් පළකරයි.

**පවර 'මගමාන' ජාතකය කවි කළේ**
**සතර දෙස තුණුරුවන් ගුණවෙයි පතලේ**
**සතිර කවි හැත්තෑ නමකි නිමකලේ**

කාව්‍යයෙන් ද 'කට්ඨාරි ජාතකය' ඇසුරෙන් ජන කවියා රචිත,

**ජාතක කථා පොත 'කට්ඨාරිය' කියන**
**තෑසැක මෙයින් කාටත් හැකි දැසගන්න**

**ලෝකෙක උතුම් අපි කවරුන් උපදින්න**
**මේ එක පිනෙන් සසරේ වාසනාවෙන**

මෙවැනි නිදසුන් මඟින් පැහැදිලි වන්නේ කිවියා විසින් කරනු ලබන කාර්යභාරයෙන් සමාජයට යහපත් දෙයක් ලබා දෙන්නට ප්‍රාර්ථනා කළා විනා අඩු තරමින් තමන්ගේ නම ගමවත් හෙළි කිරීමට තරම් එම අයගේ කැමැත්තක් තිබුණෝම නැති බවය. කාගේ කවුරුද කොහේද යන්න නොව කාලදෙසා කුමන යහපත් ධර්මයක් කවිකොට කියන්නේද? යන උත්තරීතර පරමාර්ථය විනා ඔවුනු තුළ ජනප්‍රියවීම් ඕනෑකමක් තිබූ බවක් පළ නොවීමෙන් ඔවුනු ධර්මය සැබෑවටම අවබෝධ කරගෙන තිබූ පිරිසක් ලෙස ද හැඳින්වීම පමණක් ඔවුනු හෙ කරනු ලබන උත්තම පූජාවක් වනු ඇත.

කට්ඨාරි ජාතක කාව්‍යයේදී මේ අයුරුන් නිර්මාණය වූ ජාතක කථා වස්තුවක් පාදක කොටගෙන ජනකවියා නිර්මාණය කරන ලද්දකි. සිය නම් ගම් සඟවාගත් කවියා කවි හැත්තෑදෙකක් පමණ මාත්‍රා 18 කින් යුතුව නිර්මාණය කොට සිය කථා කෞශල්‍යය විදහා දක්වයි.

පෙර බරණැස්නුවර රාජ්‍ය කරන ලද බ්‍රහ්මදත්ත නම් රජ කෙනෙකු මුව දඩයමේ ගොස් වන වැදී ආපසු තනිව එන අවස්ථාවේදී දර කඩමින් සිටි සුරූපී කාන්තාවක් දැක ඇය කෙරෙහි බැඳුනු සිත් ඇතිව ඇය සමග ප්‍රේමයෙන් බැඳී විසී දින කිහිපයකින් ඇය අත්හැර රජ මැදුරට එන රජතුමාගේ තම ප්‍රේමය පිළිබඳව සහතිකය ලෙසනින් පේරැස් මුදුවක් දී 'දුවක්' උපනොත් එය විකුණා ජීවත් විමටත් 'පුතෙකු' ලැබුණ හොත් එම මුදුව සමග මාලිගාවට පැමිණ රජතුමා මුණ ගැසීමටත් දක්වා පිටත්ව පැමිණියහ. නැවත කිසි දිනෙක රජතුමා ආපසු පැමිණියේ නැත. කලක් ගත වූ පසු මතු සඳහන් කාන්තාව පුතෙකු ලැබ වයස අවුරුදු පහක් වනතුරු හදාවඩා ගන්නාලදී. දරුවාට අවශ්‍ය පෝෂණය තිබි අයුරින් ලබාදීමට දර කඩා ජීවත්වන මෙම කාන්තාවට නොහැකි බැවින් රජතුමාගේ සිහිකිරීම අනුව රජ මාලිගාවට යාමට පිටත්විය. ඉන්පසු කුමරා හඳුනාගන්නට රජතුමාට අපොහොසත් වීම, කුමරා යම් අධිෂ්ඨාන ක්‍රියාවක් කිරීමෙන් අහසේ පළසක්බැඳ සිටීම මවගේ සත්‍ය ක්‍රියාව පසුව රජතුමා පැහැදී කුමරා භාර ගැනීමට කුමරාට රාජ්‍ය පිරිනැමීම කුමරාගේ මෑණියෝ බිසවක් ලෙසට භාරගැනීම නුවර උත්සව පැවැත්වීම ආදී කරුණු කාරණා ඔස්සේ ජනකවියා තම කවි කථාව ඉදිරිපත් කරයි.

කථාව ආරම්භවන්නේ මේ අයුරිනි,

**'නිරිඳුන් පවර බඹදත් බරණැස තරුණ**
**දඩයන් පිණිස වැද දවසක් ගිරි අරණ**
**වළවන් මුවෙකු ගොස් මාවත වැර දෙමින**
**තනියෙන් ගමන වනසඳ ආපසු බවන'**

මේ එන අවස්ථාවේදී රූමත් කාන්තාවක් දරකඩනු දක්නාලදී. රජතුමා අගේ රූපශ්‍රීයෙන් වශීවෙයි. මේ නිසාම රජතුමාගේ

මුවින් පළ කරන අයුරින් රචනය වී ඇති මේ කවිය රජුගේ අදහස් උදහස් පළකරයි.

**'සෝබන ගුණ රූසිරු පින් සිරියා වන්ති**
**පුරන සඳත් නුබ තරමට වළිය නැති**
**නෑවෙන කෙනෙක් මෙහි අප දෙදෙනා කැමති**
**මා මන පිනවපන් කී රජු බසින් රූති'**

එහෙත් දරකඩන තරුණ කාන්තාව මේ අඟනු තරුණයාගේ බසට රැවටෙන්නේ නැත. ජනකවියා ඇගේ අදහස් සිව්පදයට නඟා ඇත්තේ මෙසේය.

**'එබසට කියති ඇය බිමදෙස බලාගෙන**
**ඔහොමට සිටින ලියො කොහේ දිගේ යන්න**
**දිය පිට ඇන්ද ඉරවාගේ නොපවතින**
**බොරුවට රැවටෙනා අඟනක් මම නොවෙන'**

කාන්තාවගේ මේ අදහස් වලින් රජතුමා පසුබාන්නේ නැත.

**පියොබඳ නුඹව දුටුමට බැරි සැනසෙන්ට**
**කොහොමද යන්නෙ බැරිපා යුග නඟන්නට**
**නරකද නුඹට බිස වෙන්නට නුඹ රජුට**
**ඇසුසඳ එළද ගැස්සී හිටියයි තදට**

කාන්තාව බියපත්වෙයි, තමා මෙතෙක් සංවාද කළේ රජ කෙනෙකු සමග බව දැනී ඇය බියපත්වෙයි,

**'මන් අසරණලියකි ළඟ දෙගුරුන් සිටින**
**දුප්පත්කම නිසා යම් දර කඩාගෙන'**
**'වරදින් ඔබේ දරුවෙක් මට උපනොතින**
**කෙලෙසින් සදන්නට ද සාමිනි පවසන්න'**

එම කාන්තාව කෙසේ කීවත් රජතුමා ඇය තම වශගයට ගත්තේය. පසුව තමා නමින් ඇයට ගැගැබු දරුවෙක් ලැබුණොහොත් ඇය හදාවඩා ගැනීම සඳහා තමා සතු අනගි 'පේරැස්' මුදුවක් දී එය විකුණා මිල ගෙන ජීවත්වෙන්ටත් පිරිමි දරුවෙකු ලැබුණොත් මුදුව සමග මාලිගාවට පැමිණෙන ලෙසටත් දන්වා රජතුමා නික්ම ගියහ.

කාලය විසින් බොහෝ දේ නිර්මාණය කරන්නේය. ඇය කුස දරුවෙකු පිළිසිඳගත් බව දැනෙන්නට විය. ඇය දෙව්යන්ට කන්නලව් කළාය. සියලු සත්ත්වයාට මහා කරුණාවෙන් බුදුවෙන්නට ප්‍රාර්ථනා කළ බෝධි සත්ත්වයෝ පූර්ව ආත්මවල ප්‍රාර්ථනා ඇති හෙයින් මෙම දර කඩා ජීවත් වන ළඳගේ කුසෙහි පිළිසිඳගත්තේය. නිසි කල ඇවෑමෙන් කාන්තාව රූපශ්‍රීයෙන් යුතු පුතෙකු ලැබුවාය. දරකඩමින් ජීවත් වන තමාගේ මේ කුඩා පැලේ 'බොරුපන්' පැදුර මත හදාවඩන්නේ මහා පින්වත් කුමරෙකු බව ඇයට දැනෙයි.

**'මහරම් කාසි සළුපිළි වට තිර සුද්ද**
**සිරිරන් යහන් දුප්පත් පැලවල කොහිද**
**බොරුපන් පැදුර පිට තබමින් පුතා සොඳ**
**ගහරන් මලෙස ආදරයේ වඩනී ළඳ'**

බොරුපන් පැදුර ගැමිගෙදරක සුවපහසු ඇතිරිල්ලකි. කාන්තාව නැවත රජතුමාගේ පැමිණීම අපේක්ෂා කළත් දරුවා ලැබී පස් වසක් ගත වන තුරුත් ඔහු ආපසු පැමිණියේ නැත.දැන් දරුවාට ද යමක් තේරෙයි. කි බසක් වැටහෙයි. දිනක් මේ කාන්තාව බෝසත් කුමරුද වඩාගෙන නගරයට යයි. නගරයේ සල්පිල් වල විවිධ විසිතුරු බඩු භාණ්ඩ පිරී ඇත. දරුවා සෙල්ලම් බඩු ඉල්ලයි. සෙල්ලම් බඩු ලබා දෙන්නට මිලක් ඇය අත නැත. මවගේ දෙනෙත්වලින් කඳුළු ගලාවිත් දරුවාගේ මුහුණට වැටෙයි. දරුවා මව විමසයි. තමනට ඇඳුම් පැළඳුම් සෙල්ලම් බඩු ලබා දෙන්නට පියෙකු නැත්තේ දැයි මවගෙන් විමසයි. මව කිසිවක් කියාගත නොහැකිව අසරණ වෙයි. ඇය සිනා මතා අතීත රහස සගවයි. පියාගැන මතකයක් නැති බව කියයි. දරුවා එයින් සෑහීමටක පත් නොවේ.

නොහැකිව අසරණ වෙයි. ඇය සිනා මතා අතීත රහස සගවයි. පියාගැන මතකයක් නැති බව කියයි. දරුවා එයින් සෑහීමටක පත් නොවේ.

**'නොකියාන් ඔහොම මැසිවිල් අම්මයි මෙමට**
**පෙරපින් කරපු දරුවෙකි මම පැස ගන්නට**
**සඟවන් ඉන්න රහසක් ඇති පසුවයට**
**මමනත් මැරෙමි අද එය නොකීවොත් මට'**

මේ අයුරින් ජනකවියා සිය කථාව සරල බසින් දිගින් දිගටම ඉදිරිපත් කරයි. මව හා දරුවා අතර සංවාදයක් ලෙසින් ඉදිරිපත් කරනු සංවාදය අනුව දරුවා තම මවට උපදෙසක් දෙයි. තමා සත්‍යකියා රජතුමාගේම පුතෙක් නම් එය සිහිපත් කොට තමා රජතුමා ළඟට ගෙනගොස් තමාගේ දෙපයෙන් ඔසවා අහසට විසිකරන්නට කියයි.

**'ඔහුමගෙ පියා නොවෙනම් බිම වැටෙන්නට**
**වැටිලා බිම ඔලුව සුනුවී මැරෙන්නට**
**ඔහු මගේ පියානම් අහසෙහි රැඳෙන්නට**
**පතලා දමනු අහසට ලැබෙ සැප එවට'**

පසු දිනක කාන්තාව තම දරුවා නහවා පිරිසිදු කොට පිරිසිදු ඇඳුමක් අන්දවාගෙන රජතුමා තමාට හඳුනාගැනීමේ සලකුණක් ලෙසින් ලබා දුන් පේරස් මුදුවද රැගෙන රජමාලිගාව බලා පිටත්විය.

රජතුමා මේ කාන්තාව හඳුනා නොගනියි, එය සිතාමතා ප්‍රතික්ෂේප කිරීමකි. කාන්තාවට කිසිදු සරණක් නැත. කාන්තාව රජතුමා ලබාදුන් 'පේරස් මුදුව' එකම සාක්ෂිය වශයෙන් ඉදිරිපත් කිරයි. රජතුමා එය ද ප්‍රතික්ෂේප කරයි. තමා වහසේ ඇවිදින්නට ගිය විට නැතිවූ පේරස් මුදුව අහුලාගෙනවිත් තමාට හිඟුන කිරීමට උත්සාහ කරන මේ කාන්තාවගේ හිස ගසා දැමීමට වධකයන් ද කැඳවයි. කාන්තාව බලවත් සේ අසරණවෙයි. තමාගේ අවසාන අවස්ථාව තම දරුවා තමාට දුන් උපදේශනය අනුව ක්‍රියාත්මක වීම පමණක් බව මනත්වූ වේදනාවෙන් යුතුව දරු සෙනෙහසින් සත්‍ය ක්‍රියාකොට දරුවාගේ දෙපයින් අල්ලා අහසට විසිකරයි.

15 පිටුවෙන්

ගුණමකුබව දුදන ගතියකි.



# අත්තාණි පරිහාර හා බොදු උරුම

"මේ ගමට් අභය සන්ද්හා අත්තාණි කණු පෙරහැර දුන්මහයි"
(නෑගම ටැම් ලිපිය)

සිකළ ධරණි තලයෙහි උරුමකරු වශයෙන් ගරු බුහුමන් ලබන්නෝ රජවරුම වන්නාහ. එවන් වූ රජෙකු හෝ රජයේ උසස් නිළධරයෙකු විසින් කිසියම් අයෙකුට, විහාරස්ථානයකට හෝ ආයතනයනට රාජ සභාවේ අනුමැතිය සහිතව ප්‍රධානය කරන්නාවූ සුවිශේෂි බලතල, අයිතිවාසිකම්, නිදහස්කම් හා වරප්‍රසාදයන් අත්තාණි පරිහාර" ලෙසින් වහරනු ලැබේ.

අත්තාණි පරිහාරය නම් වදන උදෙසා විවිධ වූ අර්ථ නිරුක්තීන් සපයන්නට බොහෝ විද්වතුන් ඉදිරිපත්වී ඇති බව නොකියාම බැරිය. ඔවුන්ගේ විවිධාකාර මතවල සංක්ෂිප්තාර්ථය උක්ත නිර්වචනයෙන් සුපැහැදිලි වේ.

එයට පාදක වූ විද්වත් මතයන් අතර සංස්කෘතයෙහි එන රාජ සභාවාචී අස්ථානි යන වදන අත්තානි" යන්නට මුල් වූ බව Z වික්‍රමසිංහයන් දක්වන මතය වැලිවිටියේ සෝරත හිමියෝද ස්වකීය ශබ්ධ කෝෂයෙන් මනාව පසක් කරලති.

එහෙත් මෙම මතයට පරස්පර මාවතක් ඔස්සේ සෙනරත් පරණවිතානගේ මතය දිවේ නම් අත්තාණි යනු ආත්‍රණ යන්නෙන් ප්‍රභවය වූවක් වන අතරම එමඟින් අභය හෝ අරක්ෂාව ගම්‍යමාන වන බවකි.

මෙම විහාර පන්සල් ආදියට අයත් ඉඩම් දක්වකන බැවින් ඒවායින් හෝ එහි පදිංචිකරුවන්ගෙන් රජුට අය විය යුතු බදු හා සේවාවලින් සම්පූර්ණයෙන්ම නිදහස් වීමක් මෙයින් අපේක්ෂිතය.

තවද මේවා අභය ස්ථාන ලෙසින් ලංකා ඉතිහාස කතුවර ජී.සී. මැන්දිස් මහතා පවසන අතරම ඊට රුකුල් දෙන සිරි ලියනගේ සූරීන් ද තම ශබ්ධ කෝෂයෙහි අත්තාණි පැරහැර් යන වදන යටතේ උක්ත මතය සනාථ කරයි. එය නෑගම ඇතුළු ටැම් ලිපිවලින්ද දැක්වේ.

අත්තාණි පරිහාර දීමනාවල පෞරාණිකත්වය සොයා යාමේදී භාරතීය නීති ශාස්ත්‍ර කෘතීන්ට හිමි වනුයේ අද්විතීය ස්ථානයක්ය.

කෞටිල්‍ය අර්ථ ශාස්ත්‍රයේ සඳහන් පරිදි රජු විසින් තම වැසියන්ට පර්හාර" දිය යුතුය. ඔහු දක්වන මෙම වරප්‍රසාදයන් රජු පිදුවේ බොහෝ විට බ්‍රාහ්මණ පුරෝහිත හා අනෙකුත් රාජ්‍ය නිළධාරීන් උදෙසා පමණි.

දීඝනිකායේ කූටදත්ත සූත්‍රයෙහි බමුණාට ප්‍රදානය කරනු ලබන කළ සැබවින්ම පරිහාර ප්‍රධානයකි. තවද ධර්මාශෝක අධිරාජ්‍යා විසින් බුදු රදුන් උපන් ලුම්බිණි ග්‍රාමය බද්දෙන් නිදහස් කිරීම වැනි ප්‍රධානයයන් ද අත්තාණි පරිහාර ක්‍රමයේම ලක්ෂණ විය යුතුය.

ලක්තදිව සිදු කෙරුණු අත්තාණි පරිහාර දීමනාවල ඇරඹුම දැනට ස්මතු වන්නා වූ සාක්ෂි අනුව 9,10,11 වැනි ශත වර්ෂ දක්වා අතීතයට දිව යනු පෙනේ. දැනට හමුව මංගල ලේඛනය ලෙසින් I වන සේන නිරිදුන්ගේ කිවුලේකඩ ටැම් ලිපිය දක්වාලිය හැකිය.

රිටිගල අරන්මිකාරු සලමෙවන් රජ් (වැනදෑ) වජාලෙයි. මෙ(ය්) කාප්පර් සම් දරුවන් අවුජ්ම(ග්) දිව පියව රට් ලදු පස්ලද්දන් නොව (ද්නා) කොට් හිද් වු අ(ත්තා)ණි..."

එහෙත් මීට පූර්වයෙහි දෙවන පෑතිස් රජ කළ අත්තාණි පරිහාරයන් විකාශනය වූ බව පෙනේ. එකළ පොදුවේ මුලු මහත් ශාසනයම අරමුණු කර ගනිමින් අගත අනගත චතුදිශ ෂගෂ" යනුවෙන් මෙම ප්‍රධානයන් සිදු කළ නමුදු වලගම්බා රජ කල එය පෞද්ගලික ප්‍රධානයක් ලෙසින් සිදු කරන්නට වන.

උදා -:

තවද සේවාවක් උදෙසා රාජාදීන් විසින් ප්‍රදානය කළ ගම්වර ඉඩම් ද එක්තරා ආකාරයකට අත්තාණි ප්‍රධානයක්ම විය. මෙම ගම්වර ඉඩම් පිළිබඳ සාහස්සමල්ල රජුගේ පොළොන්නරු පුවරු ලිපියේ "ගම්වර හා පරිවාර සියලු සම්පත්තීන්" ලෙසින් ද බුත්සරණෙහි ගම්වර පසෙකැයි" වශයෙන් ද සඳහන් වීම මෙයට කිදිම නිදසුන්ය.

උක්ත පරිදි පරිහාර ප්‍රධානයන් රජු හෝ රාජ්‍ය නිළධාරියෙකු විසින් ප්‍රධානය කළ යුතු නමුදු නව ආරක පරිහාර දීමනාවක් පිළිබඳව පොළොන්නරු රාජ්‍යසභා මන්දිර ටැම් ලිපියේ දැක්වේ. එනම් මනාමල් උද්ද" නම් පුද්ගලයා විසින් පරිහාර ප්‍රදානයක් කළ අයුරුය.

"මහමල් බූදාහු වජනින් (ගිරි) වඩුන්නා දනවීවෙහි මහරට් ලද් දියවැල්ලෑ කැස්බා යහු ඉසා....."

එපමණක් ද නොවේ අත්තාණි පරිහාර ලබන්නට අවැසි සුදුසුකම් ද එදා පැවතුණි. ඒ අනුව එම ප්‍රධානයන් හට උරුමකරුවන් වන්නට හැකි වූයේ ආගමික මධ්‍යස්ථාන, රාජ්‍ය නිළධාරීන්, ගම්බිම් හා රාජ පාක්ෂිකත්වයට ලක් වූ නිළධාරීන්, සමාජ සුබසාධන ආයතන හා විශේෂ දක්ෂතා ඇති අය යනාදීන්ට පමණි.

උක්ත කරුණු සලකා බලන කල්හී අත්තාණි පරිහාරයන් හා බැදුණු තොරතුරු රැසක් අප හට විද්‍යාමාන වනු නොඅනුමානය.

චිරන්දි ශශිප්‍රභා මානෑව.

## වෙසක් පොහොය දින වැදගත්කම

1. සිදුහත් කුමරුගේ උප්පත්තිය, සිදුහත් බෝසතාණන්ගේ බුදුවීම, බුදු හිමිගේ පිරිනිවන.
2. කිඹුල්වත් නුවරට වැඩීම.
3. කිඹුල්වත් නුවරදී යමාමහ පෙළහැර පෑම.
4. බුදුරජාණන් වහන්සේ තෙවනි වරට ලංකාවේ කැලණියට වැඩම වීම.
5. සිංහල ජාතියේ ආරම්භය සහ විජය කුමරුගේ පැමිණීම.
6. දෙවන පෑතිස් රජුගේ දෙවන අභිශේකය.
7. රුවන්වැලි මහසෑයේ වැඩ ආරම්භ කිරීම.
8. මහා විහාර වංශික උපසම්පදාව සිදුවීම.



# ජාති කුල ආගම් භේදයන්ගෙන් සමාජය ගලවා ගත්තේ භික්ෂුව විසිනුයි

**ගරුතර ස්වාමීන් වහන්ස අපට පහදා දෙන්න බුදුසමයේ ආරම්භය පිළිබඳව ?**

ශ්‍රී සම්බුද්ධත්ව ජයන්තිය සමරන මේ අවස්ථාවේ මේ සමාජය දිහා බැලුවිට අපි තාමත් භාරතයේ එදා තිබුණු දෘෂ්ඨි ගත වීමේම ඉන්නවාද කියලා සැකයක් ඇතිවෙනවා. ඊට හේතුව තමයි ධර්ම කාලයේ මිත්‍යා දෘෂ්ඨිවාද 62 ක් තිබූ බව බ්‍රහ්මජාල සූත්‍රයේ සඳහන්වෙනවා. ඉන් 18 ජීවිතය හා විශ්වය ගැන ප්‍රශ්න කළා. 44 ක් අනිත්‍යතාව පිළිබඳව ප්‍රශ්න කළා. ශාස්වතවාදය,අහිංසාවාදය, අමරා වික්ශේප වාදය ඒවාට උදාහරණයි. ධර්මජාල,බ්‍රහ්මජාල, දෘෂ්ඨිජාල ලෙසයි මේවා හදුන්වන්නේ.

**වත්මන් සමාජයේ භික්ෂු භූමිකාව ඔබ වහන්සේ දකින්නේ කෙසේද ?**

නූතන සමාජගත භික්ෂුවත් තමන්ගේ ශාසනික ක්‍රියාදාම තුළම දෘෂ්ඨිගත වෙලා.... ඊට හේතුව තමයි එයාලා තමන්ගේ ආගමික නායකත්වය හෝ මාර්ගෝපදේශකත්වය පිළිබඳව නොසිතීම. ඔවුන් ජාතික හා සමාජික ප්‍රගමණයට කටයුතු කළ යුතුයි ජාති, කුලමල,පක්ෂ ආදී විද භේද මතු නොවන විදිහටයි කටයුතු කළ යුත්තේ.


බුදු රජාණන් වහන්සේගේ පටිච්ච සමුප්පාදය, කර්මය,පුනර්භවය, චතුර්ආර්‍යය සත්‍යය වැනි විශිෂ්ඨ ධර්ම කරුණුයි, දේශනා කළේ. ඒත් අද ඉතා සැහැල්ලු අර්ථ විරහිත දේ තමයි ධර්මය විධියට පැතිරෙන්නේ. බොහෝ අය ප්‍රලාප දේශනා කරනවා. මිනිසා සනසන, නළවන, ආවඩන දේ අද වැඩියි. ධර්මය අඩුයි. මේක හරිම නරක තත්වයක්.

සමාජයක් විශිෂ්ඨ තත්වයකට පත්වන්නේ, බුදු, පසේ බුදු, මහරහත්, අය නිසයි. ඊට පස්සේ චක්‍රවර්ති රජවරු පයළ වෙනවා. ඒ අය තමයි,පූජාර්හ, ථූපාර්හ එනම් වැඳිය පිදිය යුතු අය අනුගමනය කළ යුතු අය ලෙස සැලකෙන්නේ.

භික්ෂුවට සමාජ කාර්යභාරයක් තියෙනවා. සමාජ වගකීමක් තියෙනවා.සමාජ නායකත්වයක් තියෙනවා. මේ සමාජයෙන් එය ඉවත් කිරීමට ගන්නා උත්සහය හරිගියොත් ශතවර්ශ ගණනක් ඉපැරණි අපේ උරුමයටත් ජාතියේ පැවැත්මටත් තර්ජන මතුවේවි.

මේ රටේ උරුමය ගොඩ නැගුනේ කහසිවුර මුල්කරගෙනයි.

ඒ වගේම ග්‍රාමවාසී සූපේෂල ශික්ෂාකාමී හිමිවරුන්ට එරෙහිවත් විවිධ තර්ජන මතුවෙනවා. සසුනින පිට වගේම සසුන තුළිනුත් එය ඉස්මතු වෙනවා.



අන්තවාදී ආත්මවාදී බඩගොස්තරවාදී සුළු පිරිසක් මේ ව්‍යායාමයේ එදා සිටම නිරතව සිටියා.

**වාර්ගිකත්වය හා ආගම පිළිබඳව සංකල්පය පහදා දෙන්න ?**

ලාංකික සංස්කෘතිය වාර්ගික සමාජයක් කියන එක අපි කවුරුත් දන්නවා. එහි විවිධතා තියනවා. එතකොටයි සමාජය බබළන්නේ.දිදුළන්නේ. හැඩවෙන්නේ.

ඒත් ඒ තුළ අනන්‍යතාවක් ආරක්ෂා විය යුතුයි. එකිනෙකාට ගෞරවය ඇති විය යුතුයි. කිසිම ජාතියකට හෝ බලපෑමක් වෙන්න බැහැ. ඒ සියල්ල සහෝදරත්වයෙන් ආරක්ෂා විය යුතුයි.

ආගමික සහජීවනය රැක ගැනීම අප කාගේත් වගකීමක්. ඒකට සියලුම දෙනා කැපවිය යුතුයි. සිත් රිදවීම් නොවන්නට නම් සැවොම ශ්‍රී ලාංකිකයින් විදිහට සිතීමත්, ඒ අනුව කටයුතු කිරීමත් අවශ්‍යයයි.

බුදු දහමේ තරම ආගමික සහජීවනය අන් කිසිදු දහමක තියනවා කියලා මම හිතන්නේ නෑ. ඒත් එය දඩමීමා කරගෙන බෞද්ධ උරුමය, ශාසනය ධර්මයට මෙන්න විහාර සන්තකයන්ටත් හානි හෝ බලපෑම් එල්ල වේ නම් ඒක අපිට අනුමත කරන්න බැහැ.

ආගමික ප්‍රශ්න,ජාතික ප්‍රශ්න සියල්ල ඇතුලේ තියෙන ඒවා සාධාරණව විසඳාගැනීමට අපි කවුරුත් කැපවන්න ඕනේ.

**සමාජමය ගැටුම් හා අර්බුද පිළිබඳවත් ඒවා විසඳා ගන්නා ආකාරය පිළිබඳවත් යමක් පහදා දෙන්න ?**

අපි විතරක් නෙමෙයි අපි සමඟ වෙසෙන අන්‍ය ජාතිකයින්ද ආගමිකයින්ද මේ රටේ පැවැත්ම සහ තමුන්ගේ අනන්‍යතාවයේ ඉඩ කඩ පිළිබඳව ඉතා හොඳ අවබෝධයකින් කටයුතු කළ යුතුය.

මේ වෙසක් සමයේ මෙවැනි ගැඹුරු සහ අප අසලම ඇති නමුත් අපි කිසිදා කතාබහ නොකරන එහෙත් ගැටලු බවට පත්වීමට ඉඩ ඇති, අපිට නොපෙනෙන කරුණු ගැනත් සොයාබලා ප්‍රඥාවෙන් හා බුද්ධියෙන් යුතුව විසඳුම් සෙවීමට ක්‍රියා කළ යුතුය.

එය අද දවසේ ප්‍රමුඛතම අවශ්‍යතාවයක් බවද පෙන්වා දිය හැකියි..

නාඋල ශ්‍රී ධම්මානන්ද පරිවේනාධිපති නාඋල සමථ මූල මණ්ඩලයේ සහ ශාසනාරක්‍ෂක බල මණ්ඩලයේ සභාපති පූජ්‍ය බිබිලේ වජිරඤාණ හිමි

## සැබෑ දහම බුදු දහමයි අපි එය සරණ යමු



"යථාපි රහදෝ ගම්භීරෝ
විප්ප සන්නෝ අනාවිලෝ
ඒවං ධම්මානි සුත්වානි
විප්ප සීදන්ති පණ්ඩිතා "

මේ දහම් ගාථාවෙන් ප්‍රකාශ වන්නේ ශ්‍රී සම්බුද්ධත්ව ජයන්තිය සමරන මේ වකවානුවේ බුදු සම්දුන් නමදින වඳින පුදන හා බුදුන් සරණ යන සියළු මානව වර්ගයා විසින් පිළිපැදිය යුතු හා වටහා ගත යුතු ධර්ම උපදේශකයකි.

ගැඹුරු ජලය නිසල වන්නේ ජලයේ ප්‍රමාණයෙනි. ගැඹුරු නිසාමය. ධර්මයේ පහස ලද සුපහත් පෞරුෂය කිසි කලෙකත් සසල නොවේ. ධර්මය යනු සළකා බැලිය යුතුමය. සංසාරික ගමනේ නානා අවස්ථාවන් පසු කළ බෝ සතුන් සම්මා සම්බුද්ධත්වය පතා පිරූ පාරමිතා බලය සසල වන හදවත නිසල කර ගැනීමට පාදක වූ චරණ ධර්ම වේ.

මේ තුළින් ජීව අජීව සියළු ලෝක විෂයන් පටිච්ච සමුප්පාද දහමින් විනිවිද දැකගැනීමේ සදාතනික පරම සත්‍ය වන අනියත දහම් දෙසූ වදාළ සේක.

බුදු දහම ඇසූ , බුදු දහම පිරූ, නැණවත්හු ලෝ තතු දැක සසල නොවෙති. දයාබර වී හෙතින් දුක් කඳුළු ගලා එන දෑස් පිස දමා කරුණා දහරින් සනසවන්නට ජීවන යාත්‍රාව මෙහෙයවති.

එහි මූලික පරමාර්ථය වන්නේ සසර ගෙම්ම භූමිය වන නිවන කරා ගමන් කිරීමය. එවන් සත්පුරුෂ සාදු වරුණි ඔබ මහා පසු පස එළඹෙන්නට පෙර ඔබ අවට ඇති ජීව අජීව පරිසරය දෙස කුළුණු බර හදින් නෙත් යොමු කළ යුතුව ඇති බව හොඳින් සිහි තබා ගන්න.

ධර්මය නමින් බොහෝ දෑ අරුත් ගන්වයි. සොභාධර්මය, නියාම ධර්ම, ක්‍රියා මාර්ග, සිදුවීම්, ආදී සියල්ල ධර්මය නම් වෙති. නමුත් බුදු දහමේ සඳහන් ධර්මය ඒ සැම කෙන්ම වෙනස් වූවකි. පරමාර්ථ වශයෙන්ද අර්ථ වශයෙන් ද ඒ තුළ ඇත්තේ අපිරිමිත ගුණ සමුදායකි.

කෙලෙස් නසා සන්සාරික ගමනට පිවිසීමට ඇති අරහත් මාර්ගය ධර්ම නම් වේ.. එය පර්යප්ති ප්‍රතිපත්ති හා ප්‍රතිවේද ලෙස ත්‍රිවිධා කාරය. බුද්ධිමත් හු සැම කල්හිම නිසි දහම පිළිපදී, නිසි දහම ජය ගනී.

සම්බුද්ධ ජයන්තිය වසරේද අන් සියළු කල්හිද වෙසෙසින් වෙසක් සමයන්හිද මෙකී ශ්‍රේෂ්ඨ ධර්ම මාර්ගය වටහා ගැනීම උතුම් මිනිස් ගුණයකි.

නාවුල අධ්‍යාපන කලාපයේ බුද්ධ ධර්ම ගුරු උපදේශක අධ්‍යාපනපති පූජ්‍ය තලාකොලවැවේ සාරානන්ද හිමි.

සාකච්ඡා කොට සකස් කළේ හිමල් ආනන්ද

රංගිරි ශ්‍රී ලංකා RSL NEWSPAPER

රංගිරි - ශ්‍රී ලංකා මාධ්‍ය ජාලය
රංගිරි දඹුල්ල සංවර්ධන පදනම,
අංක 130, දඹුල්ල.

දුරකථනය: 066-2283606 (දිගුව 161) හෝ 071 3361328
ෆැක්ස්: 066-2284603
ඊමේල්: ranginnewspapers@gmail.com
වෙබ් අඩවිය: www.rangirisrilanka.lk

## මේ, සොබාදහම අපට පාඩම් කියාදෙන කාලයයි

මේ උදාව ඇත්තේ ලෝකවාසී මිනිසුන්ට ප්‍රඥාවේ ආලෝකය උදාවූ අසිරිමත් වෙසක් සමයයි. දියුණුවේ හිම් පෙත්ත මේ.....මේ.....යැයි උදම් ඇනූ මිනිසුන්ගේ සුන්දර රාජ්‍යයන් සියල්ල ඇත්තේ මේ මොහොතේ අක්‍රියවය. සම්මුති වශයෙන් අප ගොඩ නැගූ සිහින ලෝක අනිත්‍යල දුක්ඛ සහ අනාත්ම වන බව ඉකුත් කෙටි කාලය තුළ ලෝකවාසීන් වටහා ගත්තාට සැක නැතග එය තුන්ලෝකාග්‍ර තථාගතයාණන් වහන්සේ අපට ඉගැන් වූ පරමාර්ථ සත්‍යයයි. ලොව පහළ වූ සියලූ බුදු රජාණන් වහන්සේලා අනුදැන වදළේ. සියලු පව් නොකළ යුතුය. කුසල් රැස් කළ යුතුයග සිය සිත පිරිසිදු කරගත යුතුය යන්නය. ඒ සඳහා ඉගැන් වූ සීලයෙහි පිහිටුවීම සමාධිය වැඩීම සහ ප්‍රඥාව ලැබීමේ මාර්ගයන් සියල්ලන් මෙනෙහි කළ යුතුය සියලූ බුදුවරු කලින් කල ලොව පහළ මේ දහම ලෝ වැස්සන්ට දේශනා කරනු ලබන සේක. නමුත් එය පිළිපදින්නන් විරලය ලෝකයා විද්‍යාවෙන් හා තාක්‍ෂණයෙන් අමරණීයත්වය හඹා යතිග එවිට මිනිසා ලොවට දායාද කළ සොබා දහම විසින්ම මිනිසාට දඬුවම් දීම අරඹන්නේය. මේ උදාව ඇත්තෙ සොබා දහම අපට පාඩම් කියාදෙන කාලය බව ඉහත දැක්වූයේ එබැවිනි.

ලෝ පුරා වෙසෙන බෞද්ධ ජනතාවට තවත් අසිරිමත් තෙමඟුල් උළෙලක් එළඹ ඇත්තේය. එක්සත් ජාතීන් විසින් මෙම දිනය ලොව පිළිගත් ආගමික දිනයක් බවට පත්කළේද බුදු මඟ ඔස්සේ යමින් ජීවන විමුක්තිය අපේක්‍ෂා කරන බෞද්ධ සැදැහැතියන් ලො පුරා දිනෙන් දින වැඩි වෙමින් තිබියදීය.

මිහිතලය හා සත්වයා පිළිබඳ ගැටළුවට විසඳුම් සොයන්නෝ මෙකලද හිඟ නැත. නමුත් ඒ කිසිවෙකු බුදුරජාණන් වහන්සේ ඒ සම්බන්ධයෙන් දක්වා ඇති ධර්ම කරුණු ඇසුරු කරන බවක් නොපෙනේ. 15 වන ශත වර්ෂයෙන් පසුව එළඹුන නවලෝකය තුළදී ලෝක යථාර්තයට හිමි වූයේ අල්පස්ථානයකි. බුදුදහමට වූයේද එයමය. ලෝක විනාශයන් ද, මිහිතල පාරිසරික බේදවාචකයන් ද, පිළිබඳ අත්දැකීම් දිනෙන් දින ඉහළ යද්දි මානව වර්ගා ඒ හමුවේ අසරණ වෙමින් සිටින බව දැන් ඉතා පැහැදිලිය.

බුදුරජාණන් වහන්සේ දේශනා කළ දහම නිරවුල්ය. තමා විසින්ම වටහා ගත යුතුය. අකාලිකය. කවරම් කෙනෙකුට වුවද ගැලපෙන්නේය. ඒසේම එය නුවණැතියන් විසින්ම අත්හදා බැලිය යුත්තකි.

අද ඇත්තේ ඒ බව වටහා නොගෙන මං මුලා වෙමින් ජිවිත ගමන අවුල් කර ගත්ත වුන්ගේ ලෝකයකි. ලංකාවද යනු පෙනෙනුයේ එකී වැරදි මඟ ඔස්සේය.


ෑතෙරුවන් සරණ ගිය බෞද්ධයෝ අර්ය මාර්ගය දක්වා ගෙන යන පාරමිතාවන් සම්පූර්ණ කල යුත්තේ මෙවන් වෙසක් සමයන් හිදීය.

ඒ සඳහා ගමක් ගමක් වෙහෙරක් පන්සලක් ගෙයක්දොරක් පාසා අනන්ත අපිරිමිත බුදුගුණ සමුදායක් අසුහාරදහසක් ශ්‍රී සද්ධර්මයත් ප්‍රචාරය කරමින් දුකට පත් ජනී ජනයා ඉන් මුදා ගැනීමට සියළු දෙනා එක් විය යුතුය.

භික්‍ෂු භික්‍ෂුණී උපාසක උපාසිකා යන බෞද්ධ සිව්වනක් පිරිස කේන්ද්‍ර කොට ගත් යහපත්සමාජයක් ලංකාව තුළ ස්ථාපිත කිරීමේ ජාතික වගකීම සියළු බලධාරීන් වහා ඇරඹීමට මෙය කදිම සමයකි.

රට තුළ ඇති සමාජ විපර්යාස පරිසර දූෂණය මත්ද්‍රව්‍ය භාවිතය සාමාජ ප්‍රචණ්ඩත්වය ළමා අපයෝජනය කාන්තා හිංසනය අනාගාමික කරනය ආර්ථික පරිහානි ආදියෙන් සමස්ථ සමාජයම මුදවා ගැනීමට ප්‍රතිපත්ති සම්පාදකයින් පෙරමුණ ගත යුතුය. මේ සියළු සමාජ ගැටළු වලට විසඳුම් බුදු දහමේ මැනවින් අන්තර්ගතය. ධර්මධර විනයධර භික්‍ෂූන් විසින් එකී ධර්ම කරුණු සංග්‍රහ කොට, සංගායනා කොට ශ්‍රී ලංකාව යළිත් ධර්මද්වීපයක් කිරීමට සැවොම අදිටන්කර ගත යුතුය.

සමස්ථ ලෝක වාසීන්ගේම පැවැත්මට ඉවහල් වන ධර්මය ඇත්තේ ශ්‍රී ලංකාවේ බව වරෙක මහා විද්‍යාඥ ආතර් සී ක්ලාක් ප්‍රකාශ කළේය. ඒ කියමන සත්‍යක් බවට පත් කළ හොත් මිහිමත ජීවයන් ජීවය මත බුදු දහමත් ගසක පොත්ත මෙන් රැඳී පවතිණු නිසැකය. සියලූ බලධාරීන්ගේ නෙත් සිත් මෙකී කරුණු වෙත යොමු වනු දැක්ම මේ වෙසක් සමයේ අපගේ ඒකායන ප්‍රාර්ථනාවය.



# සම්බුදු වදනින් ලෝ තතු දකිමු

ධම්ම පදයෙන් ...........

**ආරෝග්‍යා පරමා ලාභා - සන්තුට්ඨිං පරමං ධනං**

**විස්වාසා පරමා ඥාති- නිබ්බානං පරමං සුඛං**

ධම්ම පදයෙ' ඛුද්දික නිකායේ දැක්වෙන බව දහම් පණිවුඩය සමස්ත සම්බුදු දහමම කැටිකර ගත් දිව මතුරක් බඳුය. වත්මන් ලෝවැස්සෝ රෝ දුක් උවදුරින් දැඩිව පීඩා විඳින හෙයින් මෙය අද විශ්ව ව්‍යාප්ත පණිවුඩයක් සේ ගත හැකිය. ඒ අපට මෙවර වෙසක් දිනයේ තේමාවටද මෙය ඉතාම උචිතය.

රෝගී වූ සමාජයක් තුළ සතුට හා සැනසුම දැකිය නොහැකිය. ඇත්තේ බිය හා සැකය පමණය. සමාජ, දේශපාලනික, කාර්මික විද්‍යාදි යාන්ත්‍රණයන් සියල්ල කෙරෙහි අප තැබූ විශ්වාසයන් කෙටි කලකට පලුදු වී තිබේ. බටහිර දර්ශන මගින් පෙන්වා දුන්නේ කායික හා මානසික සංවර්ධනය පිළිබඳවය. නමුත් සමාජයීය සහ අධ්‍යාත්මික යන ප්‍රධාන අංශ දෙකක් ඊට එක්විය යුතු බව පෙන්වා දුන්නේ බුදුරජාණන් වහන්සේය.

ලෝකය තුළ සත්වයාගේ පැවැත්ම පිළිබඳ යථාර්ථය වටහා ගැනීමෙන් ලබන විශ්වාසය පරම ඥාතීත්වය හා සමවේ. පරම සුඛය වන නිර්වාණ සැපය කරා මිනිසා යොමු වන්නේ ඒ ස්ථිරසාරත්ම මාර්ගය ඔස්සේය.

මාසයක් දෙකක් ව්‍යසනයකට ලක්වූහොත් තමාපවුලේ හෝ ව්‍යාපාරයේ සුරක්ෂිතතාව රකිනු පිණිස මුදලක් ඉතිරි නොවීම යන ලෝපුරා ඇති ආර්ථික විකෘතියේ ප්‍රතිඵලයන්ය.

රටේ පවතින සියලු ආර්ථික න්‍යායන්ට ජනතාව අත මුදලක් ඉතිරි කරන්නට අතදීමට නොහැකිව ඇත.එසේම මිනිස්සුන්ට ද මුදලක් ඉතිරි කරගන්නට ක්‍රමයක් තිබී නැත.එබැවින් දැන් හෝ මූල්‍ය පරිහරණය පිළිබඳ මේ උතුම් බුද්ධ දේශනාව පිළිපැදීමට සියලුදෙනා සිතට ගත යුතුය.

ඒ මේ ව්‍යසනය ආරම්භයේ මුල් පණිවිඩය වන අතර ඉදිරියේදී මෙවැනි අත්දැකීම් වැඩි වැඩිවෙන් අත්විඳින්නට ලෝකයට සිදුවනු ඇති හෙයිනි



ධම්ම පදයෙන් ...........

**ඒකේන භෝගේ භුඤ්ජෙය්‍ය - ද්වීහි කම්මං පයෝජයේ**

**චතුත්ථං ච නිධාපෙය්‍ය - ආපදාසු භවිස්සති.**

*එක් කොටසක් පරිභෝජනය සඳහාත්, කොටස් දෙකක් ධන නිෂ්පාදනය සඳහාත්, අනෙක් කොටස ආපදාවක දී ප්‍රයෝජනය ගැනීමටත් වෙන් කොට තැබිය යුතු බව.*

සියලු ලෝක සත්වයෝ ආර්ථිකය නැමැති බලධාරාවේ සිරකරුවන්ය යන්න මැනවින් පසක් වී තිබේ. උද්ගත ව්‍යවසනය හමුවේ ලෝවැස්සෝ පැවත ඇත්තේ දැඩි ආර්ථික දුෂ්කරතාවයකටය. අප රටේ රජයෙන් සහන පතා ජනතාව රොක්වනු දැකගත හැකිය. නැතිබැරි වීමේ ව්‍යසනය අප සැමට වඩා ප්‍රබලය.

ගිගන්නාගේ පොකට්ටුවේ සිට රජයේ භාණ්ඩාගාරය දක්වා පිළිපැදිය යුතු ස්ථිර සාර මූල්‍ය විනය පිළිබඳ මාර්ගෝපදේශය බුදුරජාණන් වහන්සේ ලබාදුන්නේ අදට වසර 2500කට ඔබ්බෙනි.

**නාවුල පිළිහුඩුගොල්ල විද්‍යාලයේ,ආචාර්යය පූජ්‍ය උල්පතේගමඅනුරුද්ධ හිමි සමග කළ සාකච්චාවක් ඇසුරෙනි.**

**නිමල් කණහැරආරච්චි**

# සඳ සිසිල

සංස්කාරක
"සඳ සිසිල"
රංගිරි ශ්‍රී ලංකා පුවත්පත
අංක 130,
නුවර පාර,
දඹුල්ල.

## පොඩි සාදු....



සන්සුන් ඉරියව්
දශකාරකම විසා.....
කසාවත් දළ සිවුර
හැඩකාර එක විසා...
හික්මීම ලද විදන්
කටකාරකම් විසා...
නිවන් සුව සොයනවද
සංසාර බැමි නසා...

එම්. සිරිධම්මචාරි
මෙහෙණින්වහන්සේ - පොල්පිතිගම

## රංගිරි කවිය...

| | |
|---|---|
| ඉසිකෝ මද මාන තන්හා බරට | බැඳ |
| හති දම දමා දිවයන දිවි කතර | බැඳ |
| පුහුදුන් මිනිසාට අඳුහෙි ගිලෙන | ලද |
| පහනක් විය අප සම්බුදු මහිමි | සඳ |

අහංගම

## සත්වග සිත් සැනසේවා

පින්බර වෙසක් සැමරුම පිළිබඳව ගොතා
සුරඳුතියන් පවසන විට දැහැමි කතා
තිලොවග බුදු පියාණන් නමදිමිය සිතා
යම් පන්සලට නිරුවානේසුවය පතා

මිනිසා අගතියට යොමු වී රැය ද දෙවේ
දිවයන ගමන ඔහුවම ආඳුරෙහිම යැවේ
නිතරම පාපකර සිතුවිලි මනසෙ මැවේ
මෙය පැරදුමය සුවයක් නැත සසර බවේ

තෙල් මල් පහන් දුම් මේ වැනි සුවඳ හැම
මටනැත හිමියනේ මෙහි ඇති අඩුව කිම
සිරිපා ළග තබා මා සතු දිළිඳු කම
පිනිපා තරම් සණරාමර මහිම් මම

රළ රැළ කුපිත වී කළඹ මහ මුහුදේ
ජල කඳ පිටාර ගලමින් සිදු කල විදේ
සිදුවුන විපත මගෙ දුකටම මග පෑදේ
පෙන්නුම් කලා දනවාදයෙ අපරාදේ

ලොවට උතුම් කවියා බුදු පියාණෙනි
මා සිහි කරන්නේ ඉමහත් දයාවෙනි
එතැනින් ලබන්නෙම් කවියක අමාපැණි
හැටමට වාසනා දහමෙහි ඔවාමිණි

හැම දහමින් කියවෙන්නේ යහපතය
එතරම් කිසිම සුවයක් මේ ලොව නැතිය
එය සිහිකරමු - නියැලෙමු - පුදදෙමු බැතිය
ඒ උතුම් මිනිහෙකුගේ හොඳ ගතිය

විල්පුඩි මීපුර - මීගමුව

## වෙසක් සඳ



දහසක් බුදුන් බුදුවන
මේ හිමිදිරි උදයේ
මදනල සමගින් සපුමල්
සුවඳින් වෙනදා නොමැති
අමුතුම සිසිලකි දැනුනේ....
අද වැනි වෙසක් පුන් පෝ දිනයක
ඒ අසිරිය මේ ලොවමට
පවසන බුදුහිමි උපතින්
මේ මොන අසිරියක් දැයි
සිත විමසන්නේ....

තැඹිලිපිටියේ - පියසේන




## නිවන් පුරය



ලගින්නට හැකනේ නැති
විඳින්නට සදයන් නැති
බලන්නට යමක් නැති
අසන්නට කිසිත් නැති
නිවන්පුරය ගැන
අනේ අනේ හාමුදුරුවනේ
ප්‍රාර්ථනා නුවරවන්න
මට කිසත් ඇති නොවේ
සංසාරේ මේ බණමඩුවේම
නවන් හෙට් කාලයක්
අපේ උන් නමිතින්ම
බිල් අරං කැපෙන්නේ
අවසර ද හාමුදුරුවනේ.....?

## අපි වයසට යන්නේද......?

ගඥයි සුවඥයි වෙන වෙනමද
මඥ සුළගේ එනනේ
හොඥයි නරක කියා කෙලෙස
මිනිසුන් වෙන් වන්නේ
කවදාවත් නෑ මරණය
කලින් කියලා එන්නේ
ආදරයත් කියලා නෙමෙයි
එන්නේ සහ යන්නේ

පෑදිදියට එන බොරදිය
කෙලෙසද වලකන්නේ
ජීවිතයට එන කරදර
ගැන ඇයි ලතැවෙන්නේ
ලෝකය කැරකෙන හින්දද
අපි වයසට යන්නේ
නෑ පිං පව් වලට අනුව
ලෝකය පවතින්නේ......

[illegible] හේරත් - කැකිරාව

## වැටහීම

ඔබට යුතුකම් ඉටු කරන්නට
නො හැකි වූ බව දැනේ අද මට
කඳුළු සුසුමෙන් ළතවෙනා සඳ
මා ඔබය ඔබ මාය වැටහේ

ඉර හඳ ද තරු මුළු අහසයට
සුවහසක් වැඩ පල තිබුනි මට
ඔබෙබ් දුක් ගැනවිලි අසන්නට
අසුරු කසණකට ඉඩක් නො වීනි

විඳෙන වැලපෙන හදවතට අද
නොමැත සැනසුම කිසි ලෙසින්
පියාඹන දරු මුණුබුරන් ළග
දවෙනෙන වැටහෙන ෂදැයක් ඇත අද

ඔබගින්න ළග දුන් දෙයක් මිය
සතට දිවගට කැමති දේ නැති
පොත පතක් අල්ලන්නනවත් නෑ
කෙසේ සුරගුරු වී ද ඒ දවස්

ලේලියගෙ නොපණත්කම් කටු අතුල්
කියයි මට මා ඔබය ඔබ මා
ඔයබ පුතුට බිරිඳ ඒ ආ බව
මතක් වේ ඔබ ඔහුගෙ මව බව

චන්ද්‍රාණි විකුමසිංහ
කිරින්ද

ඔබයි මා හැදුවේ වැඩුවේ
ඔබයි මාගේ ජීවිතේ.....
ජීවිත ගමනට මඟ සොයා දී
හදවතින් සැනසෙන්නේ ඔබ පමණි
අම්මේ......

## සසර ගමන

කෙළවරක් නොමැතිව
බාධක දුක් කම්කටොලු මැද
ගමන් ගන්නා ජීවන යාත්‍රාව
මහ සයුරමෙන්
මහගල්පරවල හැප්‍රනත්
නැවත එතැනටම යන
සංසාර ගමනට
බුදු හිමි තෙමගුල සිදුවුණදා
පැයූ ඒ වෙසක් සඳේ ආලෝකය
සැදැහැසිත් ඇතිවන්නට
පහන් සිත් බබලවන්නට
පතමු ලොව දනන්හට
අසිරිමත් වෙසගේ අරුමය......

කැකුලාවල

## වෙසක්පෝහෝදින



වෙසක් පහන් කුඩු තනා
ආලෝකය පතුරමින්
නව විදියක් ලබා දුන්නා
වෙසක් පෝය දා........
ගමේ හැමෝමත් එක්කම
මල් අරගෙන තෙල් අරගෙන
බුදුන් පුදන්නට ආවේ
පින් බර වූ පහන් සිතින්.....
විදුලි බුබුලු පාර දිගේ
පාට පාට බබුලුවමින්
සිසිල් සුළං සමගින් අපි
පන්සල් ආවේ සතුටින්........

වරුණි තේජානි බණ්ඩාර
මා/ විජය විද්‍යාලය මාතලේ

# "කරුණාවේ ප්‍රතිමූර්තිය" අපේ බුදුරජාණන් වහන්සේ



**"පරදුක්ඛේ හදය කම්පනං කරෝතීති කරුණා"**
(අනුන්ට දුකක් ඇති වූ සත්පුරුෂයන්ගේ හදවත කම්පනය කෙරේනුයි කරුණා නම් වෙයි)

"කිණාති වා පරදුක්ඛං හිංසති විනාසේ තීති කරුණා"
(අනුන්ගේ දුක් නැති කෙරේනුයි විනාස කෙරෙනුයි කරුණා නම් වෙයි.)

"කිරියති වා දුක්ඛිතේසු ඵරණ වසේන පසාරියති කරුණා"
(දුක් වුවන් කෙරෙහි ක්‍රියා කිරීමෙන් අනුකම්පාව පැතිරීම කරුණා නම් වෙයි)

තුන් ලොවට තිලකයක් බඳු බුදුරජාණන් වහන්සේගේ කරුණා ගුණය පිළිබඳව කරුණු පැහැදිලි කිරීම ලෙහෙනෙක් තම හගුටින් මුහුදෙ ජලය හිස්කරන්නට කරන වෑයමක් මෙනි. උන් වහන්සේ ගත් කළ පන්සාලිස් වසක කාලය තුළ උන් වහන්සේගේ මුළු කාලය පුරාම ප්‍රකට වන්නේ කරුණා ගුණය තීවොත් නිවැරදිය. පැරණි අටුවා ඇදුරන් විසින් මෙම කරුණාව යන වචනයට විවිධ අරුථකතන දී ඇති ආකාරය ඉහත පාඨ තුළින් පැහැදිලි වේ.

බුදු රජාණන් වහන්සේගේ කරුණාව පිළිබඳ විමර්ශනය කර බැලීමේදී අපට පෙනී යන්නේ එම ශ්‍රේෂ්ඨ චරිතය පුරාම කරුණා ගුණය ස්මතු වන සිදුවීම් රාශියක්ම අන්තර්ගත වන බවයි. උන් වහන්සේගේ මුළු මානව සත්වයාටම සමසේ කරුණාව දක්වන ලද ශ්‍රේෂ්ඨ ශාස්තෘන් වහන්සේ කෙනෙකු වශයෙන් ඉතිහාස ගත වී ඇත. ලෝකයේ උතුම්ම පදවිය වන බුද්ධත්වයට පත් වූ උන් වහන්සේ කිසිම තැනකදී භේදයක් නොකොට කරුණාව දැක්වූ බවට සාධක එම ශ්‍රේෂ්ඨ චරිතය කියවීමෙන් අපට සොයා ගත හැකිය.

"වදකෙ දෙව දත්තම්හි
චොරෙ අංගුලි මාලකෙ
ධනපාලෙ රාහුලෙ චෙව
සම්බන්ථ සම මානසො"

ආදී වශයෙන් බුදු රජාණන් වහන්සේට ගල් පෙරලූ දේවදත්ත හාමුදුරුවන් වහන්සේටත්, බුදු රජාණන් වහන්සේ මරණවා කියන අදහසින් කඩුව අයාගෙන පැමිණි අංගුලිමාලටත් තම පුතු වූ රාහුල හාමුදුරුවන් වහන්සේටත්, නාලාගිරි වැනි තිරිසන් සතුන්ටත් බුදුරජාණන් වහන්සේගේ කරුණාවේ වෙනසක් නොවූයේය. මුළු මානව සත්වයාටම එකම අයුරින් බුදු කරුණාව දක්වන්නට උන් වහන්සේ දිවා රෑ වෙහෙස විය. පයට පාවඩ, උඩට උඩුවියන් විල්ලුද පලස් නොමැති කටු අකුල් ඇති ගල් බොරළු ඇති මාවත් දිගේ උන් වහන්සේ වැඩම කළේ අරමුණක් ඔස්සේ අන්ත අසරණ දුගී මගී යාචකාදීන්ට පිහිටක් ලබාදීමේ පරම පවිත්‍ර චේතනාවෙන්මය.

ගවු තුනක් මග ගෙවා මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ සොයා වැඩියේ යොදුන් 1200 ක් මග ගෙවා ආලවක යක්ෂයා සොයා වැඩියේ යොදුන් 480 ක් මග ගෙවා කපිල රජු සොයා වැඩියේ යොදුන් 280 ක් මග ගෙවා ධානිය තෙරුන් සොයා වැඩියේ කරුණා ගුණයෙන් පිහිට පිළිසරණ වීමේ පරම පවිත්‍ර චේතනාවෙන්ම ය. උන් වහන්සේ අනාථයාට පිහිට වීමේ දී කාලය පවා කොටස්කර ගන්නා ලදි. එනම්,

පෙර බත් කිස
පසු බත් කිස
පෙරයම් කිස
මැදියම් කිස
පැසියම් කිස ආදි වශයෙනි.

ජීවිතයේ සුළු මොහොතකවත් තම සුඛ විහරණය සඳහා නොයෙදූ බුදුරජාණන් වහන්සේ සෑම මොහොතකම අනාථයාට පිහිට වූ සේක. සැබෑ කරුණාවෙන් හෙබි බුදු රජාණන් වහන්සේගේ දහම් පාඨය වූයේ.

අත්තානං උපමං කත්වා - න හනෙය්‍යන ඝාටයේ

(අන් සතුනට හිංසා පීඩා කිරීමේදී තමා උපමාකර ගන්න) යනුවෙනි.

උන් වහන්සේ ළමයි පිරිසක් ගැරඩියෙකුට දඬුවම්කරන අවස්ථාවක දී මෙම දහම් පාඨය දේශනා කරන ලදි, එසේ වුවද මෙම දහම් පාඨය තුළින් මුළු මානව සත්වයාගේම ජීවිත වෙනුවෙන් දක්වන ලද කරුණා ගුණයක් බව ධ්වනිත වේ. ඉන් කියාපාන්නේ පර දුක්ඛ ස්ව දුක්ඛයක් ලෙස ක්‍රියා කිරීමේ ගුණය බව ප්‍රත්‍යක්ෂ වේ.

බුදු රජාණන් වහන්සේ තුළ පැවති අනන්ත කරුණා ගුණය විද්‍යාමාන වන අවස්ථා මුළු බුද්ධ චරිතය පුරාම දැකගත හැකිය. උන් වහන්සේ මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ෂා යන සතර බ්‍රහ්ම විහරණ ධර්ම තුළින් ද පෙන්වා දී ඇත්තේ කරුණාවම සම්පිණ්ඩනයක් වශයෙන් බව දැක්වීමක් බව පැහැදිලි වේ. මෙම ගුණ තුළින් ලෝක සත්වයා දෙස බැලිය හැකි නම් එය බෝසත් ගුණයකි. උන් වහන්සේ නිතර දේශනා කළේ තමන් වහන්සේ අනාථයන්ට පිහිට වූවාසේම භික්ෂූන් වහන්සේලා විසින් ද අනාථයාට පිහිට විය යුතු බවයි. ඒම ගුණය 'පරත්ථං පටි පජ්ජන' යනුවෙන් පරාර්ථයේ යෙදීම යනුවෙන් දේශනා කළහ. එය ශ්‍රාවක ශ්‍රාවිකා චරිත තුළින් ද ඒ අයුරින් ද ගම්‍යමාන වේ, රතන සූත්‍රයට අනුව බුදු රජාණන් වහන්සේ විශාලා මහනුවර ඇති වූ තුන්බිය (රෝග, අමනුෂ්‍ය, දුර්භික්ෂ) දුරු කිරීම සඳහා ආනන්ද හාමුදුරුවන්ගේ වහන්සේත් සමග කරුණාවෙන්ම පිරිත් සූත්‍ර කර පැන් ඉසූ ආකාරය පැහැදිලි වේ,

අසම-සම, අසරණ-සරණ, පරදුක්ඛ-දුක්ඛිත ගුණයන්ගෙන් යුක්ත වූ බුදුරජාණන් වහන්සේ නිරතුරුවම භික්ෂූන් වහන්සේලාට ආමන්ත්‍රණය කළේත් කරුණාවෙන් ලෝකය දෙස බලා කරුණාවෙන් ලෝකය ගැන සිතා කරුණාවෙන් ලෝකයාට පිහිට වන ලෙසටයි. පළමු ධර්ම ප්‍රචාරක කටයුතු සඳහා ඉදිරිපත් වූ පළමු රහතන් වහන්සේලා හැටනම අමතා දේශනා කළේත් 'චරථ භික්ඛවේ - චාරිකං බහුජන හිතාය බහුජන සුඛාය' මහණනි ධර්ම චාරිකාවෙහි හැසිරෙන්න. මුල මැද අග යහපත් වූ ධර්මය දේශනා කරන්න. දෙදෙනෙකු ඒක මග නොයන්න... යනාදි වශයෙනි.

යහපත් වූ ධර්මය දේශනා කරන්න. දෙදෙනෙකු ඒක මග නොයන්න... යනාදි වශයෙනි.

මේ ආකාරයට සෑම අවස්ථාවකදීම අනාථයාට පිහිටක් පිළිසරණක් ලබාදෙන අදහසින්ම සෑම කාර්යයක්ම ආරම්භකොට, පවත්වාගෙන ගොස් අවසන් කළ බව පැහැදිලි වේ. උන් වහන්සේ පරිත්‍රාණ දේශනයන් හීදී කරුණාවෙන් පරිත්‍රාණ ධර්මය දේශනා කරන ලෙස අනුදැන වදාළ අතර ඒය සත්‍යක්‍රියාවක් ලෙස සලකන ලෙස ද දේශනාකොට ඇත.

ආරම්භකොට, පවත්වාගෙන ගොස් අවසන් කළ බව පැහැදිලි වේ. උන් වහන්සේ පරිත්‍රාණ දේශනයන් හීදී කරුණාවෙන් පරිත්‍රාණ ධර්මය දේශනා කරන ලෙස අනුදැන වදාළ අතර ඒය සත්‍යක්‍රියාවක් ලෙස සලකන ලෙස ද දේශනාකොට ඇත.

මහා කාරුණිකො නාථො - හිතාය සබ්බ පාණිනං
පූරෙත්වා පාරමී සබ්බා - පත්තෝ සම්බෝධි මුත්තමං
ඒතේන සච්ච වජ්ජේන - හෝතු තේ ජය මංගලං

සියලු සත්වයින් වෙනුවෙන් පාරමිතා සම්පූර්ණ කළ බුදුරජාණන් වහන්සේ එම සත්‍ය පදනම් කරගෙන මානව සත්වයාටම යහපතක්ම වේවා යන ඒ උතුම් ප්‍රාර්ථනාව කරන ලදි. මෙහිදී පාරමිතා යනුවෙන් දැක්වෙන්නේ පරාර්ථ චර්යාවයි. ඒ පරාර්ථ චර්යාව දිවි හිමියෙන් සත්වයා වෙනුවෙන් කළ එකම ශාස්තෘවරයාණන් වූයේ බුදු රජාණන් වහන්සේ බව අමුතුවෙන් කිව යුතු නැත. උන් වහස්සේ ත්‍රිවිධාකාරයෙන් පාරමිතා සම්පූර්ණ කරන ලදි. එය දස පාරමිතා, දස උපපාරමිතා, දස පරමත්ථ පාරමිතා යනුවශේ සසර උපන් ආත්මවල ඇස්, ඉස්, මස්, ලේ පමණක් නොව අඹුදරුවන් පවා දන් දෙමින් සම්පූර්ණ කළ පාරමිතාවකි. වෙස්සන්තර, මහා සිවි, මඝමාණවක ආදි ජාතක කථා තුළින් එය වඩාත් ප්‍රත්‍යක්ෂ වේ. ඒ සෑම දෙයකම සම්පිණ්ඩනය වූයේ මහා කරුණාව ලෝකයා වෙත පතල කිරීමය. ඒ නිසාම කරුණා සාගර,කරුණා නිධාන ආදි වචන උන් වහන්සේට ආරෝපනය කරන ලදි.

බුදු රජාණන් වහන්සේ කරුණා නෙතින් මේ තුන් ලෝකය (දිව්‍යලෝක හය, සතර අපාය, මනුෂ්‍ය ලෝකය) දෙස බැලුවානම් එම බුදු කරුණා ඇසට හසු නොවුන කිසිදු පුද්ගලයෙක් නොමැත. සුනීත, සෝපාක, ආලවක, අංගුලිමාල, පඨාචාරා, කිසාගෝතමී, රජ්ජුමාලා, නාලාගිරි ආදී වශයෙන් මිනිස් තිරිසන් භේදයකින් තොරව සෑම දෙනාටම බුදු කරුණාව ලැබුණු අතර අජීවී ස්වභාවධර්මයට ද එම කරුණාවේ වෙනසක් නොවිය. පැල්පතේ සිට රජ මැදුරෙ දක්වා කිසිදු භේදයකින් නොමැතිව රාජ රාජ මහා මාත්‍යාදීන්ගේ සේම ඉන්දික වැනි දුගී මගීන්ගේ ද දානය එක සිතින් වළඳා එම කරුණා ගුණය ප්‍රකට කරන ලදි. ඒ අනුව උන් වහන්සේගේ කරුණා ගුණය මහා සාගරය පරයමින් විශ්වය තුළ විහිදී ගිය අයුරු පුදුම සහගතය.

බුදු රජාණන් වහන්සේ පිරිනිවන් පාන්නට මොහොතක් තිබියදී ද උන් වහන්සේගේ ශ්‍රී මුඛයෙන් පිට වූයේද කරුණා පෙරදැරි ඔවදනක්මය. එනම්, ''හන්ද දානි භික්ඛ, වො අමන්තයාමි වො වයධම්මා සංඛාරා අප්පමාදේථ සම්පාදේථ'' (මහණෙනි, තොපට අනුකම්පාවෙන් කියමි, සියලු සංස්කාරයෝ නැසෙන සුළුයි.අප්‍රමාදව කටයුතු කරව්) මෙම අවසන් බුදු වදන තුළ අන්තර්ගත අනුකම්පාවෙන් යන වචනයෙන් කරුණා ගුණය ප්‍රකට කර ඇත. සෑම සත්වයෙක්ම උප්පාද ඨිති භංග (ඉපදීම, පැවැත්ම හා විනාශයවීම) යන චක්‍රයට හසුව ගමන් කරති. එහි යථා තත්වය බුදු ඇසටම මිස වෙන කෙනෙකුට නොපෙනේ. පියෙකු විසින් දරුවන් විඳින දුක දැක කරන ප්‍රකාශනයක් ලෙස ශ්‍රාවකයන්ට බුදු රජාණන් වහන්සේ කළ අන්තිම බුදු වදන හැඳින්විය හැකිය.

බුදු රජාණන් වහන්සේ සත්වයා වෙත පතල මහා කරුණාව අතීත වර්තමාන, අනාගත කාල භේදයක් නොමැතිව අපමණ, අසංඛ්‍ය, අනන්ත අයුරින් විද්‍යාමාන වේ. මුළු ලෝකයටම කරුණා ගුණය පතුරා සිත් සතන් සිසිල් කරමින් නිවන් මඟෙහි දොරටු විවෘත කරදුන් එකම ශාස්තෘවරයා බුදු රජාණන් වහන්සේ පමණි. එසේනම් තිලොවටම තිලකයක් බඳු බුදු රජාණන් වහන්සේගේ කරුනා ගුණය සිහියට නගාගෙන සමගිය සමාදානය වර්ධනය කිරීමට උත්සාහ කරමු.

කොබෙයිගනේ පුබ්බිලිය
ශ්‍රී සාරානන්ද පිරිවෙනේ ආචාර්ය
ගලගෙදර රතන වංස හිමි.

# ලක්දිව බුදු පිළිම



බෞද්ධ අපි කවුරුත් මල් පහන් පූජා කරමින් ත්‍රිවිධ චෛත්‍යය වන්දනා කරන්නෙමු. එහිදී පළමුව ශාරීරික චෛත්‍යය හෙවත් දාගැබ් වහන්සේත් දෙවනුව පාරිභෝගික චෛත්‍යය හෙවත් බෝධීන් වහන්සේත් තෙවනුව උද්දේශික චෛත්‍යය හෙවත් පිළිම වහන්සේත් වන්දනා කිරීම සිරිත ය. ත්‍රිවිධ චෛත්‍යය යනු ධර්මය අවබෝධ කර ගැනීමේ ආධ්‍යාත්මික ඉගැනීම සඳහා අපට ඇති දෘශ්‍ය ආධාරකයන් ය. ඉන් පෘතග්ජන අපට වඩාත් සමීපතම ආධාරකය වන්නේ පිළිම වහන්සේ ය.

එසේත් නැත්නම් බුද්ධ ප්‍රතිමාව ය. ඒ මන්ද යත් පියවි ඇසින් අප නොදුටු ශ්‍රී බුද්ධ දේහය මෙසේ යැයි අපට කියන්නේ බුද්ධ ප්‍රතිමාව බැවිනි. කුඩා දරුවෙකුට වුවද බුදු හිමි යන වචනය ඇසුණු සැණින් තමන් දුටු බුද්ධ ප්‍රතිමාවක් සිතෙහි ඇඳෙනු නොඅනුමාන ය. එතරම් බැඳීමක් ඇති බුදු පිළිමය පිළිබඳ දැන ගැනීම බෞද්ධ අපට වැදගත් වෙයි.

ක්‍රි. පූ. තුන් වන සියවසේ දී ධර්මාශෝක අධිරාජයාගේ අනුග්‍රහයෙන් ලංකාවට එවනු ලැබූ සියලු ශ්‍රේණිවලට අයත් ශිල්පීන් විසින් ලංකාවේ තාක්ෂණික දියුණුව ඇති කරනු ලැබූ බවත් ඔවුන් දේශීය ශිල්පීන්ට පුහුණු කළ බවත් විශ්වාස කෙරේ. ඒ විශ්වාසය හා පිළිගැනීම නිසාම අප සතු බොහොමයක් කලා නිර්මාණවල සම්භවයේ ගෞරවය අසල්වාසී ඉන්දියාව දිනා ගනු ලබයි. බුද්ධ ප්‍රතිමාව සම්බන්ධයෙන් විමසීමේදී ද බොහෝ පඬිවරුන්ගේ පිළිගැනීම වන්නේ ක්‍රි. ව. 1වන සියවසේ දී ඉන්දියාවේ ආරම්භ වූ බවයි. ගන්ධාර හා මථුරා යන කලා සම්ප්‍රදායන් දෙකෙන් ප්‍රථම බුද්ධ ප්‍රතිමාව අයත් වන්නේ කුමන සම්ප්‍රදායට ද යන්න ගැටලු සහගත වුවත් උක්ත සම්ප්‍රදායන් දෙකම කුෂාණ යුගය (ක්‍රි. ව. 1-2 ශතවර්ෂ ) නියෝජනය කරයි. ඒ අනුව පෙළ ගැසුණු බුද්ධ ප්‍රතිමාවේ විකාශනයට අනුව ශ්‍රී ලංකාවේ බුද්ධ ප්‍රතිමාවේ ආරම්භය පිළිබඳ සාමාන්‍ය පිළිගැනීම වන්නේ ගන්ධාර හා මථුරා සම්ප්‍රදායන් දෙකෙහි සම්මිශ්‍රණයෙන් බිහි වූ දක්ෂිණ භාරතීය අමරාවතී හෙවත් ආන්ද්‍රා සම්ප්‍රදායේ ආභාසය තුළින් ආරම්භ වූවා ය යන්න ය.

එහෙත් ඩී.ටී දේවේන්ද්‍ර, නන්දදේව විජේසේකර සහ සිරි ගුණසිංහ වැනි විද්වතුන් මේ අදහස ප්‍රතික්ෂේප කරමින් බුදු පිළිමය සිංහල ශිල්පියාගේ නිර්මාණයකැයි අවධාරණයෙන් සඳහන් කරයි. එපමණක් ද නොව ආන්ද්‍ර ප්‍රතිමාව පවා සකස් වූයේ සිංහල ප්‍රතිමාව අනුව බවද ප්‍රකාශ කරයි.

ශ්‍රී ලාංකේය උරුමයකට මඟ පෑදෙන බුද්ධ ප්‍රතිමාවේ සම්භවය පිළිබඳව සාක්ෂ්‍ය සාධක ගැඹුරින් අධ්‍යයනය කිරීම මේ නිසා වැදගත් වෙයි. ආචාර්ය කඹුරුපිටියේ වනරතන හිමියෝ ද ආන්ද්‍ර සම්ප්‍රදාය ලංකාවේ බුදු පිළිමය කෙරෙහි බලපෑමක් කර නැති බව ඉස්මතු කර පෙන්වයි. එසේනම් ලංකාවේ බුදු පිළිමයේ ආරම්භය පිළිබඳ සාක්ෂ්‍ය සාධකයන්ගේ දුර්වලබව නිසා යටපත් වී ඇති මතයන් ශක්තිමත් කළ යුතු වන්නේ ය.

දුටුගැමුණු රජතුමා විසින් රුවන්වැලි සෑයේ බුද්ධ ප්‍රතිමාවක් තැන්පත් කළ බව මහාවංශයේ සඳහන් වෙයි. එය එසේනම් ලංකාවේ බුදු පිළිමයේ නිර්මාතෘ ක්‍රි. පූ. 161-137 කාලයේ රජ කළ දුටුගැමුණු රජතුමාය යන්න පිළිගත යුතු බවත් ඒ වන විට ඉන්දියාවේ බුදු පිළිමය පිළිබඳව සාක්ෂි නොමැති බවත් මහාචාර්ය බෙල්ලන්විල විමලරතන හිමි බුද්ධ ප්‍රතිමා කලාව සහ බුදු පිළිමයේ විකාශය නම් වූ පර්යේෂණ කෘතියෙහි සඳහන් කර ඇත.

එහෙත් ලංකාවේ බුද්ධ ප්‍රතිමාවේ සම්භවය තවත් ඈතට එනම් දෙවන පෑතිස් රජු කාලය දක්වා දිවෙන බවට ඉඟියක් මහාවංශයෙන්ම ලබා දෙයි. දෙවන පෑ තිස් රජු විසින් ථූපාරාමයේ පිහිටුවා තිබූ මහ ගල් පිළිමයක් දෙටුතිස් රජු විසින් (ක්‍රි. ව. 315-325) ථූපාරාමයෙන් ගෙන ගිය විස්තරයක් එහි සඳහන් වෙයි. දෙවන පෑ තිස් රජු දවස එවැනි පිළිමයක් තිබූයේ නම් එහි නිර්මාතෘ දේවානම් පිය තිස්ස රජු විය යුතු යැයි අනුමාන කරන්නට එකල අශෝක අධිරාජයාගෙන් ලත් ත්‍යාගයන්හි බුද්ධ ප්‍රතිමාවක් අඩංගු නොවීම රුකුලක් වනු ඇත.

මෙ අයුරින් සම්භවය විග්‍රහ කළ හැකි සිරිලක බුදු පිළිමයේ විකාශය පැහැදිළි බවක් සාපේක්ෂව පෙන්නුම් කරයි. විටින් විට ඇති වූ ආක්‍රමණික හා රටේ දේශපාලනික අස්ථාවරභාවයන් මත ව්‍යාප්තියේ වෙනස්කම් වූ බවක් ද පෙනේ. වංශකතා හා ශිලාලේඛන පමණක් නොව අදටත් තේජසින් නැගී සිටිනා බුද්ධ ප්‍රතිමා මෙන්ම නෂ්ටාවශේෂ ද බුදු පිළිමයේ නතු පහදයි. ක්‍රි. ව. 4-5 ශතවර්ෂ බුද්ධ ප්‍රතිමා කලාවේ ස්වර්ණමය යුගය ලෙස හඳුනාගත හැකිය. මහායාන බලපෑම් එල්ල වුවද බුද්ධ ප්‍රතිමාවට වෙනසක් කළේ නම් ඒ දෑවැන්ත ප්‍රතිමා නෙළීමට පෙළඹවීම පමණි. බුදු පිළිමය හා එහි විකාශය සියුම්ව මෙන්ම ගැඹුරින් අධ්‍යයනය කළ යුතු ක්ෂේත්‍රයකි. එය විශාල පරාසයක් තුළ පැතිරී ඇත්තකි.



ලංකාවේ බුද්ධ ප්‍රතිමා නෙළීමට යොදා ගන්නා අමු ද්‍රව්‍ය ගණනාවක් හඳුනා ගත හැකිය. මැටි, ගඩොල්, ශිලා, සඳුන් ආදී දැව, ඇත් දළ, ලෝහ වර්ග වැනි දේ අතීතයේ ද වර්තමානයේ දී කොන්ක්‍රීට්, ප්ලාස්ටික්, වීදුරු වැනි අමු ද්‍රව්‍ය ද භාවිතා කරනු දැකිය හැකිය. කුමන අමුද්‍රව්‍ය බැවින් බුද්ධ ප්‍රතිමාවක් ආයාසයෙන් නිර්මාණය කරනු ලැබේ) උක්ත කරුණු දෙකම නිසා ශිලාමය බුද්ධ ප්‍රතිමා බිහි වී ඇත. ප්‍රතිමාවට උචිත සෙල් කුල නිසා අවුකන වැනි බුදු පිළිම ද විහාරයට සුදුසු භූමියෙහි සෙල් කුලෙහි නෙලූ ප්‍රතිමාවක් වශයෙන් බුදුරුවගල වැනි සෙල් පිළිමය ද පෙන්වා දිය හැකිය.

අද වන විට තාක්ෂණය දියුණු වී ඇත. බුද්ධ ප්‍රතිමා අපූරු සැණින් නිර්මාණය කරනු දැකිය හැකිය. කොන්ක්‍රීට්, ප්ලාස්ටික්, වීදුරු වැනි නවීන අමු ද්‍රව්‍ය යොදා ගනු ලබයි. එහෙත් විශාල වුවද සියුම් වුවද නෙළන්නේ බුදු පිළිමයක් බැව් සිහි තබා ගන්නටත් ඊට නිසි ගෞරවය හිමි කර දීමටත් බැඳී සිටිම අප කාගේත් යුතුකම බව බෞද්ධ අප කවුරුත් වටහා ගත යුතු කරුණකි.

ආර්. එන්. එච්. එම් දීප්ති ජයරත්න
කුරුණෑගල







# සසර කතර නතර කරන බුදු හිමි දෙසූ පරම සැපත

කයේ විවිධ සැපයන් පිළිබඳ සඳහන් වේ. විශේෂයෙන් කාම ලෝකයේ ඇති සැප පිළිබඳ සඳහන්වීම විශේෂත්වයක් ගනී. අභිධර්මයට අනුව චිත්ත කණ්ඩය පිළිබඳ හැඳින්වෙන තැනදී කාමාචාර ගණයට අයත් ලෝක 11ක් ගැන කිය වේ. දිව්‍ය ලෝක හයකි. මනුෂ්‍ය ලෝකයත් හා සතර අපායන් පිළිබඳව එහි වැඩිදුරටත් සඳහන් වේ. දිව්‍ය ලෝක හා සතර අපාය පිළිබඳ අපට හරියටම කීමට අපහසු වන්නේ එම ලෝක අපගේ ඉන්ද්‍රියන් වලට ගෝචර නොවන නිසාය. එසේ වුවද එම ලෝක පිළිබඳ අවිශ්වාස කිරීම නොකළ යුතුය.

මනුෂ්‍ය ලෝකය අපට පෙනෙන හා අප ජීවත්වන ලෝකයයි. දෙවියෙක් වන්නෙත්, පෙරේතයෙක්, භූතයෙක් වන්නෙත් මනුෂ්‍යයාමයි. එබැවින් මනුෂ්‍යයාගේ අධ්‍යාත්මික ශක්තිය ඉතා ගැඹුරුය. බුද්ධ චරිතය තුළ පැහැදිලි වන කරුණක් නම් සිද්ධාර්ථ සමයේ විඳින ලද සැපවල ප්‍රභේදයයි. මනුෂ්‍ය ජීවිතයක ඇති(ගිහි සැප) ඉහළම ස්ථානය වන්නේ සක්විති සැපතයි. ඊට අමතරව රාජ රාජ මහාමාත්‍යාදීන් තුළද තරමක සැප සම්පත් විඳීමක් ඇත.

සිද්ධාර්ථ කුමාරයා තරම් ගිහි සැප විඳි කෙනෙකු නැති තරම්ය. එතුමාට ගිහි ජීවිතය තුළ ලැබිය හැකි සියළු සැප සම්පත් තිබුණි. කාල තුනට අවශ්‍ය විධියට රම්‍ය, සුරම්‍ය, සුභ, ආදී මාළිගා ද තිබුණි. අතට පයට වැඩකාරයින් පවා සිටියහ. අඩුම වශයෙන් කියතොත් කළකිරීමක්, සිත් තැවුලක් ඇති වූ කළ එය නැතිකිරීමට ද නෘත්‍ය, ගීත කණ්ඩායම් පෙළ ගැසී සිටියහ. මේ ආදී වශයෙන් ගිහි ජීවිතය ගෙවූ සිද්ධාර්ථ කුමාරයාට සක්විති රාජ සම්පත් ලැබීමට තව දින හතක් තිබියදී එය වළියට විසි කළ කෙළ පිඩක් සේ ඉවත් කොට පරම සැපත සොයාගෙන ගිය බව වැඩිදුරටත් සඳහන් වේ.

පුහුදුන් වැසියා සැපතක් වශයෙන් දකින්නේ ලෞකික සැපතයි. එනම් මිළ මුදල්, ඇඳුම් පැළඳුම්, ගෙවල් දොරවල්, හරක බාන, වතු පිටි, ඉඩ කඩම් මේ ආදී වශයෙන් එදිනෙදා පරිභෝජනයට ඇති සම්පත් සමඟ ඇලී ගැලී ඒවා රැස් කිරීම සැපතක් සේ දකිමින් ඒ මත ජීවිතය පවත්වාගෙන යෑමට උත්සහ කරති.

එහි නිමාවක් දැකීම අපහසුය. එයට හේතුව දැඩි තෘෂ්ණාවයි. එය තිබෙන තාක් කොතරම් සෙවිවත් රැස් කළත් ඇති වීමක් නැත. එසේ වුවද මේ සමාජය තුළ පැවිදි පක්ෂය උත්සහ කරන්නේ පරම සැපත ලබාගැනීමට බව සඳහන් වේ. එහිදී ගිහියාට නොයෙක් ප්‍රශ්න ගැටළු මධ්‍යයේ ගමන් කළ යුතුව ඇති නිසා ගිහියාගේ ගමන මොණරාටත්, පැවිද්දාගේ ගමන හංසයාටත් උපමා කර ඇත. ගිහියා ලෞකික සම්පත් සමඟ නිතර ගැටෙන නිසා ඔහුගේ ගමන ප්‍රමාදය. නමුත් පැවිද්දාගේ ගමන ඉක්මන් වන්නේ නිවන අරමුණු කොටගෙන ඉක්මන් ගමනක යෙදෙන නිසාය.

පරම සැපත ලැබීමට ගිහියාට ප්‍රමාද වන්නේ ඔවුන් ඉතා බර අඩු උපකරණ පොදි බැද කර තබා ගෙන යන නිසාය. එහෙත් අල්පේච්ඡ ජීවිතයක් ගත කරන පැවිද්දාගේ ගමන් මල්ල ඉතාමත් සැහැල්ලුය. ගෙන යන බඩු මල්ලේ බඩු අඩු වූ තරමට ගමන වේගවත් කර ගත හැකිය. එම්බා, භික්ෂුවරුව, හිස් කරනු. එය හිස් කළ විට පරම සැපත කරා වේගයෙන් ගමන් කළ හැකිය". **"සිඤ්ච භික්ඛු ඉමං නාවං සිත්තාතේ ලහු මෙස්සති"** යන ධම්ම පද ගාථාවෙන් ඒ බව පැහැදිලි වේ.

පැවිද්දා මෙන්ම ගිහියාත් ඔහුගේ ගමන් මල්ලේ බර හැකි තරම් දුරට අඩුකර ගන්නේ නම් ඔහුට ද නිවන් අවබෝධය යම් කිසි පමණකින් වේගවත් කරගත හැකිය. අල්පේච්ඡ ජීවිතය ගමන් බර අඩුකර ගැනීමේ මාර්ගයයි. පැරණි ගිහියෝ අපිත් රහතුන් අනුගමනය කරමු" යි පොහෝ දිනයන් හි පෙහෙවස් සමාදන් වූහ. එබැවින් පැවිදි පක්ෂය සඳහා දේශිත සිල්, ආචාර ධර්ම, චාරිත්‍ර වාරිත්‍ර ආදියද එකම නිවන් මාර්ගයේ ගමන් කරන ගිහියාටද ප්‍රයෝජනවත් වන බව අමුතුවෙන් කිවයුතු නොවේ. බෞද්ධ සිරිත් විරිත් කෙරෙහි ඒවායින් ලැබී ඇති අභ්‍යාසය ද ඉමහත්ය.

> *"පුහුදුන් වැසියා සැපතක් වශයෙන් දකින්නේ ලෞකික සැපතයි. එනම් මිළ මුදල්, ඇඳුම් පැළඳුම්, ගෙවල් දොරවල්, හරක බාන, වතු පිටි, ඉඩ කඩම් මේ ආදී වශයෙන් එදිනෙදා පරිභෝජනයට ඇති සම්පත් සමඟ ඇලී ගැලී ඒවා රැස් කිරීම සැපතක් සේ දකිමින් ඒ මත ජීවිතය පවත්වාගෙන යෑමට උත්සහා කරති."*

**"වත්ත නන්න පරි පූරෙන්තො - න සීලං පරි පූරති"** වත් සම්පූර්ණ නොකරන්නේ ශීලය සම්පූර්ණ නොකෙරේ. ශීල සුද්ධිය නොලබන්නේ සිතේ සමාධිය නොලබයි.

වික්ෂිප්ත සිත් ඇත්තෝ ධර්මය නොදනී. ධර්මය නොදකින්නෝ පරම සැපත වූ නිවන් සැපත නොලබන බව විනය විනිච්ඡය වත්තක්ඛන්ධක යෙහි සඳහන් වේ.

ලෞකික සැපතෙහි උච්චතම අවස්ථාවන් ලැබීමට සමථ භාවනාව තුළින් පුළුවන. ප්‍රධාන භාවනා ක්‍රම දෙකක් වූ සමථ හා විදර්ශනා තුළින් සමථ භාවනාව ප්‍රගුණ කිරීමෙන් ලෞකික සැපතෙහි දියුණුවත් විදර්ශනා භාවනාව ප්‍රගුණ කිරීමෙන් අධ්‍යාත්මික සැපතෙහි දියුණුවත් ඇති කර ගත හැකිය. කාමච්ඡන්ද, ව්‍යාපාද, ථීන මිද්ධ, උද්ධච්ච කුක්කුච්ච, විචිකිච්චා යන පංච නීවරණ ධර්ම යටපත් කිරීමට සමථ භාවනාව තුළින් පුළුවන. ඒ තුළින් ධ්‍යානාදී සැප සම්පත් ලැබ ගතහැකිය. එසේ වුවද එයද වෙනස් වන බැවින් සදාකාලික සැපතක් වශයෙන් ගැනීමට අපහසුය. එසේ වුවද විදර්ශනා භාවනාව ප්‍රගුණ කිරීමෙන් අනිත්‍ය, දුක්ඛ, අනාත්මජයන ත්‍රිලක්ෂණය පිළිබඳ දිගින් දිගට භාවනානුයෝගිව සත්‍ය වශයෙන් දැන පරම සත්‍ය වූ නිවන් සුව ලබාගැනීමට පුළුවන.

චතුරාර්ය සත්‍ය පිළිබඳ අමුතුවෙන් කිව යුතු නැත. එහිදී බුදුරජාණන් වහන්සේ සත්‍ය හතරක් ලෝක සත්වයාට දේශනා කර ඇත. දුක්ඛ, සමුධය, නිරෝධ, මාර්ග යන එම සත්‍ය හතරින්ද නිවන පිළිබඳ දේශනා කොට ඇත. එහි සඳහන් වන්නේ ඉධං ඛො පන භික්ඛ වෙ දුක්ඛ නිරෝධං අර්ය සච්චං යො තස්සායෙව තණ්හාය අසේස විරාග නිරෝධො චාගෙ පටිනිස්සග්ගො මුත්ති අනාලයො" (මහණෙනි, දුක නැති කිරීමේ, නැති කිරීමේ ආර්ය සත්‍ය නම් මෙයයි. තෘෂ්ණාව ඉතිරි නැතිව ඉවත් කිරීම නැති කිරීම, අත් හැරීම මුළුමනින් ඉවත දැමීම, ඉන් මිදීම හා එහි නොඇලීමයි)

බුදු දහමට අනුව නිවන යනු තෘෂ්ණාව නැති කිරීමයි. තණ්හක්ඛයො නිබ්බානං" සත්වයා සසරට ඇදගෙන යන බන්ධනය වන්නේ තෘෂ්ණාවයි. තෘෂ්ණාව සම්පූර්ණයෙන් නැති කරන තාක් රූප, වේදනා, සඤ්ඤා, සංඛාරා, විඤ්ඤාණ යන පංචස්කන්ධ දුක් ඇති වේ. දුකට හේතුව වන මේ තෘෂ්ණාව නැති ගකිරීම පිළිබඳ සංකල්පය බුද්ධ දේශනාවට අනුව සිහාවලෝකනය න්‍යාය අනුව ද විස්තර කළ හැකිය.

සිංහයෙකුට ගලකින් ගැසුවහොත් ඒ ගල ගැසුවේ කවරෙකු විසින්දැයි සෝදිසි කොට බලා ගැසූ තැනැත්තා වනසා දැමීම සිංහයාගේ ස්භාවයයි. ගල ගැසූ තැනැත්තා වනසා දැමූ විට සිංහයාට ගල් නොගසන බව සිංහයාගේ විශ්වාසයයි. දුක් නැති කිරීමේදීද එම න්‍යාය අනුගමනය කළ හැකිය.

> "යථාපි මූලේ අනුපද්දවෙ දළ්හෙ
> ඡින්නොපි රුක්ඛො පුනරෙව රූහති
> එවම්පි තණ්හානුසයෙ අනුහතෙ
> නිබ්බත්ති දුක්ඛ මිදං පුනප්පුනං"

ගසක මුල ශක්තිමත් ව තිබියදී එම ගස කපා දැමුවාට එලක් නැත. එය නැවත ලියලනු ඇත. එසේම තෘෂ්ණාව නොනැසූ කළ පංචස්කන්ධ දුක නැවත නැවතත් ඇති වන බව ඉහත ගාථාවෙන් පැහැදිලි වේ.

නිවන යන පදයෙන් නිවීම නැත්නම් පැවැත්ම යන අර්ථයන් ගැන කියවේ. නිවන හරියට පහනක් නිවී ගියාක් මෙනි. එය විස්තර කිරීමට අපහසුය. රාග ක්ඛයො නිබ්බානං" මෙම සංසාරය දුක් සහගතය. නිවන එහි පරම සුවයයි. සසර සංඛතයි. (වෙනස් වේ) නිවන අසංඛතයි (වෙනස් නොවේ) සසරෙහි දැකිය හැකි දුක අප්‍රිය, අසහනකාරී බව ආදියෙහි කෙළවර නිවනයි. එක් භික්ෂුවක් විඳීමක් නැත්නම් නිවනෙහි සැපත කුමක්දැයි ඇසූ ප්‍රශ්නයට සැරියුත් හිමි පිළිතුරු දෙනුයේ නොවිඳීම සැපය බවයි.

14 පිටුවට....

කොබෙයිගනේ පුබ්බිලිය
ශ්‍රී සාරානන්ද පිරිවෙන් ආචාර්ය
ගලගෙදර රතන වංශ හිමි.

## 13 පිටුවෙන්....

සත්වයා සසර සැරිසරන ආත්ම භාවය නැවැත්වීම නිවන තුළ සිදුවේ. භය උච්ජේද හා සාස්වත වාදයෙන් තොර මධ්‍යම ප්‍රතිපදාවේ ගමන් කර ලබාගත යුත්තකි. ඇත නැත යන අන්ත දෙකට නොවැටී ආර්ය අෂ්ටාංගික මාර්ගයෙහි ගමන් කොට ලබාගත යුතු දෙයකි, නිර්වාණය.

නිවීම ලෞකික ලෝකෝත්තර වශයෙන් දෙවැදෑරුම් ය. කිසා ගෝතමීය සිදුහත් කුමරු දැක ඔහුගේ මවත්, පියාත් (නිබ්බුතා) නිවුණේ වේ. යැයි සඳහන් කළේද දුකෙන් සිටි කෙනෙකු බුද්ධිමතකුගේ දේශනයක් ශ්‍රවණය කොට සතුටක් සැනසුමක් ලැබූ බව කියනුයේතද ඒ සියල්ල ලෞකික තාවකාලික වේ. නිර්වාණය ලෝකෝත්තර වශයෙන් නිවීමකි. නුවණැත්තා පිළිවෙලින් මාර්ග ඵල ලබා නිවන කරා ළඟා වන බව පහත දැක්වෙන රතන සූත්‍රයේ සංඝරත්නය ආදර්ශ කොට දක්වා ඇත.

**යේ සුප්ප යුත්තා මනසා දල්හේන**
**නික්ඛා මිනෝ ගෞතම සාසනම්හි**
**තෙපත්ති පත්තා අමතං විගය්හ**
**ලද්ධා මුධා නිබ්බුතිං භුඤ්ජමානො**
**ඉදම්පි සංඝෙ රතනං පණීතං**
**එතෙන සච්චේන සුවත්ථි හෝතු**

(යම් රහත් කෙනෙක්, ස්ථිර වූ, සිතින් පිරිසිදු කය වචනය දෙකෙහි යෙදුනාහ. ගෞතම සසුනෙහි හැම කෙලෙසුන් ගෙන් මනාව නික්මුණාහුද, අමා මහා නිවනට බැස නොමිලයෙන් ලදින් බල සමවත් සුව අනුභව කරන්නාහු පැමිණිය යුතු වූ රහත් ඵලයට පැමිණිය නම් වෙත්, සංඝ රත්නයෙහි මේ රතන භාවයද උතුම් යැ. මේ සත්‍යයෙන් හැම සත්නට සුවවේවා)

පිළිවෙලින් මාර්ග ඵලයට පිවිසීමේදී සංයෝජන සිඳී යන ආකාරය මෙහෙහි කිරීමෙන් ද නිවනට යන ගමන් මඟ ගැන අවබෝධයක් ලැබේ.

<u>සෝතාපන්න</u>

01. සක්කාය දිට්ඨි (මමය මාගේය දැඩිව ගැනීම)
02. විචිකිච්චාව (සසර හා නිවන පිළිබඳ සැකය)
03. සීලබ්බත පරාමාස (මිත්‍යා ශිල වෘත මඟින් නිවන ලැබිය හැකියයි සිතීම)

සකෘදාගාමී

01. කාම රාග (පස්කම් සැපයට ආශාව)
02. ව්‍යාපාද (තරහා ගතිය)

අනාගාමී

01. කාම රාග ව්‍යාපාද මුළුමනින්ම නැති වීම

අරහත්

01. රූප රාග (බ්‍රහ්ම ලෝකයේ ඉපදීමට ආශාව)
02. අරූප භාවය (අරූප ලෝකයේ ඉපදීම)
03. මානය (උඩඟුකම)
04. උද්ධච්ච (නොසන්සුන්කම)
05. අවිජ්ජා (නොදැනීම)

ඉහතින් සඳහන් කරන ලද දස සංයෝජන ධර්ම නැතිව යෑම යනු නිවන් ලැබීමයි. එනම් යථාවබෝධය ලබා ගැනීමයි. නිවන් ලැබූ පුද්ගලයා කුසල් අකුසල් නොකරයි. ඒවා නම් සසරට ඇදගෙන යන උපකරණයි. එසේ වුවද රහතන් වහන්සේලාට වුවද පෙර කළ කුසල අකුසල වල විපාක ලැබේ. මුගලන්, චක්ඛුපාල මහරහතන් වහන්සේලාගේ චරිත කතා කියවීමෙන් ඒ බව පැහැදිලි වේ. බුදු, පසේ බුදු, මහරහතන් යන ත්‍රිවිධ බෝධියෙන් නිවන් ලැබිය හැක. සෝපාදිශේෂ යනු පංචස්කන්ධය නිරුපද්‍රිතව තිබියදී කෙලෙස් නැති කිරීමයි. නිරුපදිශේෂ යනු ස්කන්ධ නැවත ඇති නොවන අයුරින් විනාශ වීමයි.

පිළිවෙලින් ආර්යඅෂ්ඨාංග මාර්ගය සම්පූර්ණ කොට පිළිවෙලින් ශීල, සමාධි, ප්‍රඥා යන ත්‍රිශික්ෂාවට පැමිණිම පරම සැපත වූ නිර්වාණය ලෙස හැඳින්වීමට පුළුවනි.

## පාරමිතා

01 දාන පාරමිතා

දානය අති උතුම්
පේ වෙමි අනුන් වෙනුවෙන්
ධර්ම දානය අති උදාරයි
නගා මදහස හදවතෙන්
සිනා බැල්මක් පිදිය හැකිනම්
අන්න එය වුව අනගි හට
පුදන මනහර දානයක් වේ

02 සීල පාරමිතා

චරිත ශක්තියනම්
සීලයමවේ පිරිසිදු
පව්කම් නොකොට කිසි විටෙක
පින්කම් හි නිරත වෙමි
එය එලොව මෙලොවට
වැඩදායිකය සදහට

03 නෙක්ඛම්ම පාරමිතාව

පරහිත කාමියා
සුපින්වත් සුදනෙක්ය
තමා ගැන පමන නොව
මෙරමා ගැනද සිතනා
උතුම් අපගේ කළ යුතු
දිවි මඟ පරදු කොට
කැපවෙමි අනුන් වෙනුවෙන්

04 ප්‍රඥා පාරමිතාව

හඳ හා බැඳගත්
ප්‍රඥා නම් මන ඇස
පදා යතා තතු දැන
පුහුදුන් ලොව දකිනෙමි
නැත කිසිදු බාධා
සඳ එළිය සේ මිහි බට
සැනසුම සුවය ගෙන ඒ

05 වීරිය පාරමිතාව

සිත කය වචන යන
තුන් දොර හික්ම වන්නෙමි
දිරි විරිය වඩා ගනිමින්
දිවි කැප කරමි අනුනට
මේ සියල් ඇත්තෝ
සොයුරු සොයුරියෝය මාගේ

06 ක්ෂාන්ති පාරමිතාව

බෝසත් සිරිතේ උත්තම
ක්ෂාන්තිය පුරන්නෙමි
ඉවසුම පරම සැපයක්
මේ ලොව තවත් නැත්තේ.

07 සත්‍ය පාරමිතාව

වංචාව දුරැලා
බොරුව රැවටිලි හැරලා
වෙමි මම සත්‍ය වාදී
බියක් නැත කිසිදු තැන
සුව නිදි ලැබේ සැමදා

08 අධිෂ්ඨාන පාරමිතාව

ඇත්ත හමුවේදී
මලක් මෙන් මෙලෙක් වෙමි
ඇත්ත නැත්ත දෙසුම් හමුවේ
ගලක් මෙන් දැඩි වෙමි
කුසීතව පසු බටව
පසුබානුයේ කුමකට
සිහි කල්පනා ඇතිවම
නිර අදියටන පෙරටු කොට
යම් තවත් ඉදිරියට



චවින්ද්‍ර නිරෝමණි වෛද්‍යරත්න

06 පිටුවෙන්

මේ සිදුවීම් පෙළ කවියා අපූරුවට කිවියට නගා ඇත.

බුදුවීමට පෙරුම් පුරණ බෝසත් චරිතයක් වූ මේ දරුවා සියල්ලෝම පුදුමට පත් කරමින් අහසෙයි පලක් බැඳ වැඩසිටී. අහසෙහි සිටි බෝසත් කුමරා රජු අමතයි.

**'මතු සන්සාරෙ සඟමොක් සුව සිරිගන්ට**
**අම්මා මා දුකින්මුත් හැදුවා රුවට**
**රජවී තෙදැසි සේ බරණැස් පුර වරට**
**අප්පා මගේ ඔබය සැදූ රලවා ගන්ට'**

මෙයින් පසු කථාව දිගමට සංවාද ස්වරූපයෙන් ඉදිරිපත් කරමින් සමාජයට හරවත් පණිවුඩයක් ලබා දෙයි. කාන්තා නිදහස ගැන මහලොකු උත්සව ගැන මහලොකු සම්මේලන රැස්වීම් උද්ඝෝෂණ වැඩමුළු ගැන අවබෝධයක් නැතත් සැබෑ කාන්තාවගේ යථාර්ය ජනකවියා කවි කිහිපයකින් අසන්නා දැනුවත් කරයි. මුලු කතාවේම සාරාංශය එහි අන්තර්ගතය.

**'පිරිමින් බොහෝ බලවත් කොටසකි රත්න**
**ගැහැණුන් දුබලමුත් ලස්සන මල් වැන්න**
**කුසුමෙන් සුවඳ හිසිලෙස ගෙන තුටු වෙන්න**
**බොරුවෙන් මායමින් තරකයි රවටන්න'**

**'පිය රජ අසනු ඔබ මා ගැන නොබැලුවට**
**දර විකුණලා අම්මා බත් දුන්නෙ මට**
**රජ සැප නැතත් අම්මා ළඟ සිටින මට**
**පොල් අතු පැලත් හැඩවෙයි තවතිසාවට'**

පසුව රජතුමා කුමාර ාහා මව භාරගැනීටම කැමතිවෙයි. සිදුවූ වැරැද්දටත් සිදුවූ ආශ්චර්යත් නිසා රජතුමා දන බිම තමා නමස්කාර කරයි. දරුවා හා මව ආරක්‍ෂා කිරීමේ පොරොන්දුවෙන් බොසත් කුමරාට තමන් ලගට වඩින්නට ආරාධනා කරයි. කුමරා රජතුමා ළගට නොවඩියි. බොසත් කුමරාගේ මෑණියෝ කරුණාවෙන් කුමරාට බුදුබව ප්‍රාර්ථනා කරමින් පියාණන් ළගට පැමිණීමට ආරාධනා කරයි.

විවිධ කාව්‍යාලංකාර නොමැති වුවද ව්‍යක්ත යෙදුම් භාවිතා නොවුවද කාව්‍යවල පුනරුක්ත දෝෂ දක්නට ලැබුණ ද මෙම ජාතක කතා කාව්‍යයෙන් මතු කරන සමාජ සාරධර්ම බෙහෙවින් අගය කළ යුතුය. බුදු දහම නියාම මෙවැනි කාව්‍ය තුලින් සමාජය යහමග හැරවීම සඳහා ජනකවියෝ බොහෝ වෙහෙසක් ගෙන ඇත. ඔවුහු එම නිර්මාණ කරන ලද්දේ හුදෙක් පොදු ජන සමාජය යහමග යැවීමේ පරමාර්ත කරගෙන හැරුණු විට තම නර්මාණයෙන් ආර්ථික වාසියක් ලැබීමේ පරමාර්ථයෙන් නොවන බව පමණක් අප ගෞරවයෙන් යුතුව සිහිපත් කළ යුතුව ඇත. ජනකවියාට හුරුපුරුදු සරල බස් වහර මෙහිදී ද ප්‍රයෝජනයට ගෙන ඇත.

කාන්තාවගේ අසරණභාවය හා කාන්තාව මුහුණ දෙන සමජ ප්‍රශ්න සරලව ඉදිරිපත් කරයි. එහෙත් වර්තමානයේ මහා ගැඹුරින් හැදෑරිය යුතු ප්‍රශ්න පිළිබඳව අසන්නාගේ අවධානය යොමු කරමින් ඒවා සිහිපත් කරදෙයි. කෙසේ වෙතත් 'කට්ඨාරි' ජාතක කාව්‍යය බෞද්ධ සාහිත්‍ය තුලින් සමාජයට යම් ධර්ම කරුණු රාශියක් ඉදිරිපත් කළ සරල කාව්‍ය සංග්‍රහයක් බව නම් කිව යුතුමය.

බොහෝ කාන්තාවන් හිංසනයට වධබන්ධනයට හා නොසලකා හැරීමට්ක භාජනය වෙමින් පවතින වර්තමාන කාලයේ සියලු දෙනා විසින්ද කියවා අවබෝධකරගත යුතු සත්‍යයන් මනාලෙස වටහාදීටම මෙම ජාතක කතා කාව්‍යය සමත් වී ඇතැයි කීම යුක්ති යුක්ත වන්නේය. බුදු දහමේ හර සුවඳ මේ කවි කතාව පුරාම විසිරී ඇති අතර මෙහි සඳහන් කාන්තා ප්‍රශ්න අතීත වර්තමාන අනාගතය යන කාලත්‍රයටම අයත් සමාජ ප්‍රශ්න බවද සිහිපත් කරගත යුතුව ඇත.

## දායාද වස්තු දහය

1. **"අන්තො අග්ගි බහි න නිහරිතබ්බො"** දුවණියෙනි! තිගේ නැදිමයිලන්ගේ හෝ ස්වාමි පුරුෂයාගේ හෝ යම් යම් සුළු වරදක් තිබුණත් ඒ කිසිම අගුණයක් පිට කිසිම කෙනෙකුට නො කිය යුතුය. මේ ක්‍ම සමාන ගින්නක් නැත්තේය.

2. **"බාහිර කො අග්ගි න අන්තො පවෙසෙතබ්බො"** පිට ගෙවල ස්ත්‍රී පුරුෂයන් නැදිමයිලන් ගේ හෝ තම ස්වාමි පුරුෂයාගේ හෝ යම් යම් නුගුණයක් කිය ලූ නුමුත් තී දෙවනුව ගෙට අවුත් අසවල්ලු අසවල්ලු ඔබට මෙසේ බිණූ යයි කියා ගිනිසේ කුප්පවා ගතු නො කිය යුතුයි. එසේ කීම ද මහාගින්නකි.

3. **"අදන්තතස්සෙව දුතබ්බං"** යමෙක් යම් දෙයක් තමාගේ උවමනාවක් නිසා ලබා ගෙන නැවත දෙයිද එබදු අයට දි යුතුයි.

4. **"අද දන්තස්ස න දතබ්බං"** නැවත දෙමියි කියා යමක් ලබාගෙන ඒ කී පිරිදි නොදෙන තැනැත්තන්හට නොදිය යුතුයි.

5. **"දදන්තස්සාපි, අදදන්තස්සාපි දතබ්බං"** දිළිදු ඥාති මිත්‍රාදීන්ට හෝ දුඃඛිත යාචකාදීන්ට හෝ දෙවනුව දීලිය නොහෙත් මුත් යම් කිසිවක් ඉල්ලුවහොත් තිබේ නම් දිය යුතුයි.

6. **"සුඛං නිසීදිතබ්බං"** ස්වාමියා සහ නැන්දා මාමා දැක ගෞරව ලැබෙන ලෙස හිඳිය යුතුයි. (ඔවුන් ඉදිරිපිට උස් ආසනයන්හි නොහිඳිය යුතුබවයි.)

7. **"සුඛං භුඤ්ජිතබ්බං"** නැන්දා මාමා සහ ස්වාමියා අනුභය කරන්ට මත්තෙන් අනුභව නොකොට ඔවුන් පළමු කොට අනුභව කරවා අනිකුදු අයකෑ නොකෑ බැව් සොයා තමා පසුව අනුභව කළයුතුයි.

8. **"සුඛං නිපජ්ජිතබ්බං"** නැන්දා මාමා සහ ස්වාමියා නිදන්ට මත්තෙන් තමා නිදන්ට නොගොස් ඔවුන්ට ද කටයුතු වත් පිළිවෙත් ආදිය නිමවා පසුව තමා සයනය කළයුතුයි.

9. **"අග්ගි පරිචරිතබ්බො"** තමාගේ ස්වාමියා ද නැදි මයිල් දෙදෙනාද,ගිනි කඳක් මෙන් හෝ නා රජෙක් මෙන්සලකා මහත් ගරු බුහුමන් සහිතව බිය ඇතිව සැලකිය යුතුයි.

10. **"අන්තො දෙවතා නමස්සි තබ්බා"** නැදිමයිල් ස්වාමියා යන තිදෙනා තමාගේ දෙවියෙකු මෙන් සලකා ගෞරවාදරය කළ යුතුයි.වැළිය යුතුයි.

භාග්‍යා හේරත්
කැකිරාව




බුදු රජාණන් වහන්සේ හා වෙනත් උත්තම පුරුෂයන් සමග ඇසුරු කිරීමෙදි සම්පව සිට කථාබහ කරන්නට ලැබෙන අවස්ථාවේදී එය නිසි අයුරින් කිරීමට වග බලා ගැනීම අත්‍යවශ්‍යය. බෞද්ධ පත පොතේ සඳහන් වන ආකාරයට මෙසේ සමීප ආකාරයට කථාබහ කිරීමේදී "නිෂද්‍යාදොෂ" අටක් හඳුන්වා ඇත. මෙයින් වැළකී කථා බහ කිරීමෙන් තමා විසින් කථාබහ කරනු ලබන උත්තම පුරුෂයාගේ අවධානය තමාවෙත යොමු කර ගනිමින් සාර්ථක ප්‍රතිඵල ලබා ගත හැකිය. බුද්ධ කාලීන සමාජයෙන් බිහි වූ මේ ආචාර ද්ර්ම වර්ථමාන සමාජයටද බෙහෙවින් ප්‍රයෝජනවත්ය.

1 කර අරඹා බලන සේ පිටු පසු ලා නොහිඳීමය.
2 දෘෂ්ටි පලා බලනාසේ බ්‍රහ්ම සථානයෙහි නොහිඳීමය
3 කතා බහ කරන විට ඇඟට කෙල යොමුවන සේ ඉතා ලන්ව නොහිඳීමය.
4 අඩගා කථා කරන සේ ඉතා දුරස්ථව නොහිඳීම
5 තමා ඇඟ ගත් සුලං බුදුන් ඇඟට යනා සේ උඩු සුළගටව ලා නොහිඳීමය
6 බුදුන් ඇඟ ගත් සුළඟ තමා ඇඟ ගන්නා සේ යටි සුළඟටව ලා නොහිඳිමය
7 කර ඔසවා බලනාසේ උස් තැනටලා නොහිඳීමය
8 කර හෙළා බල බලා කථා කරන සේ ඉතා පහළ තැනකට වී නොහිඳවීමය.

(පූජාවලිය ඇසුරිනි)

යූ.ඒ. දිසානායක - මලව කැකිරාව

03 පිටුවෙන්....

## බුදු දහමින් දායාද වූ ගුණාංගයන්ගෙන් බිඳක්


මෙලෙස දක්වන්නට යෙදුණාවූ බුදු දහමින් දායාද කළ නායකත්ව ගුණාංගයන් මහ සයුරෙන් ගත් දිය බිඳකට සම කළ හැකි අල්ප වූ ප්‍රමාණයක් පමණක් මෙහිලා සඳහන් වූ බව මැනවින් දත යුත්තේම ය. තවත් බොහෝ දෑ බුදු දහමින් උකහා ගත හැකි බව නොරහසකි. එවන් කරුණු කාරණා හැකිතාක් අම්ල වූ බුදු දහමින් උකහා ගෙන තම නායකත්ව ලක්ෂණයන් දියුණු තියුණු කර ගන්නට වෙර දැරීම බුද්ධිමත් නායකයන්ගෙ වෙර වීර්යය විය යුත්තේම ය. දහස් සංඛ්‍යාත නායකයන් ලොව විසුව ද නිසි නායකත්ව ලක්ෂණවලින් අනූන වූ නායකයින් අප අතර ඉතා අල්ප ය. එබැවින් නායකත්ව ලක්ෂණවලින් ඌණ නායකයා තුළින් නිවැරදි නායකත්ව භූමිකාවක් අපේක්ෂා කළ නොහැකි ය. එවැන්නන් හුදෙක් නාමික නායකයින් පමණි. ඔවුනට නිසි අනුගාමික පිරිසකට සැබෑ නායකත්වයක් කිසි විටෙකත් ලබා දිය නොහැකි ය.

නිර්මල බුදු දහමින් පෝෂිත මෙසිරිලක කුඩාම ඒකකයේ නායකයාගේ පටන් ඉහළම පෙළේ නායකයා දක්වාම සිය නායකත්වයට බුදු දහමින් ගත යුතු යට කී නායකත්ව ගුණාංගයන් රැගෙන ඒවායින් පරිපූර්ණ නායකයන් බවට පත් වේවා !යි යැයි සියලු නායකයින් අපේක්ෂා කරන අනුගාමිකයින්ගේ පැතුම වනු නියති.

රංගිරි ශ්‍රී ලංකා
සත්‍ය ගවේෂී බෞද්ධ හඬ
රංගිරි ශ්‍රී ලංකා 2020 මැයි - 2564 වෙසක් කලාපය

**යම් කෙනෙක් මිතුරන් හට ද්‍රෝහි නොවේද කෝප නොවී තම නිවසට පැමිණේද, පිරිස මධ්‍යයේ සතුටට පත්වූයේද, එබදු තැනැත්තා ඥාතීන්ට උතුම් වන්නේය.**

# මේ සාරධර්ම පුනරුත්ථාපනය කළ යුතු කාලයයි.



බුදු දහම යනු ලොව පවතින ආගම් අතරින් ශ්‍රේෂ්ඨතම දර්ශනයකි. මනුෂ්‍යයාට ස්වකීය බුද්ධි වින්‍යාසයක් තුළ තම අධ්‍යාත්මය සුපහන් කරගනිමින් භෞතික සංවර්ධනය ඇති කර ගැනීමට බුදු දහම මග පෙන්වයි. එම අධ්‍යාත්මික සංවර්ධනයේ සම්බන්ධීකාරක වන්නේ සාරධර්මය. එනම් මව්පියන්ට සැලකීම, කළගුණ සැලකීම, ආගන්තුක සත්කාරය ප්‍රත්‍යුපකාරය, පන්සිල් සුරැකීම, ධාර්මිකව මිල මුදල් ඉපයීම, අවිහිංසාව වැනි උත්තුංග ගුණධර්මයන් මෙහිදී වැදගත් වෙයි.

ආත්මාර්ථකාමීත්වය, වාණිජත්වය, මමත්වය, තරගකාරීත්වය, මුල් බැසගත් අද්‍යතන ව්‍යාකූල සමාජ සන්දර්භය තුළ තවකෙකුගේ කඳුල, දුක, වේදනාව හඳුනන සංවේදී හදවත් ඇති මිනිසුන් සොයා ගැනීම මහත් අසීරු කාර්යයකි. සාරධර්ම දිනෙන් දින මිනිස් හදවත් තුළින් දුරස් වන බව සාක්ෂාත් කර සිදුවීම් බහුලය. මිනීමැරීම්, මංකොල්ලකෑම්, අනියම් ප්‍රේම සම්බන්ධතා, උපන් බිළිඳා කුණු කූඩයේ දමා මව අතුරුදහන් වීම, වංචාව, බොරුව, අල්ලස් දූෂණ වැනි දූෂණ නිරන්තරයෙන් නෙත ගැටෙන සවන වැකෙන සාමාන්‍ය සිදුවීම් බවට පත් වී ඇත. මෙවන් වකවානුවක බුදු දහමේ තිරසාර පැවැත්ම අභිවෘද්ධිය වෙනුවෙන් සමාජ සාරධර්ම සෝදා පාළුවට යාමට ඉඩ නොදී සාරධර්ම පුනරුත්ථාපනය කළ යුතු වේ.

පිරිහී ඇති සාරධර්ම පුනරුත්ථාපනය කිරීම සඳහා ප්‍රථමයෙන් මිනිස් සිත සමාහිතභාවය පත් කර ගත යුතුයි.

**අත්තනාව කතං පාපං - අත්තනා සංකිලිස්සති**
**අත්තනා අකතං පාපං - අත්තනාව විසුජ්ඣති**
**සුද්ධි අසුද්ධි පච්චත්තං - නාඤ්ඤමඤ්ඤං විසෝධයේ**

ඔබේ සිත පිරිසිදු වන්නේ හෝ අපිරිසිදු වන්නේ ඔබ කරන කියන සිතන දේ අනුවය වෙනත් අයෙකුට ඔබේ සිත පිරිසිදු කළ නොහැකිය. එම නිසා තමාගේ සිත පිරිසිදු කර ගැනීම ඔබ සතු කාර්යයකි.

සාරධර්ම පුනරුත්ථාපනය කිරීමෙහිලා වැදගත් වන බෞද්ධ පිළිවෙත් මානව චින්තනයේ අග්‍රප්‍රාප්ත තිලෝගුරු සම්‍යක් සම්බුදු පියාණන් වහන්සේ විසින් සර්ව ජීව හිතවාදී ජීවන න්‍යායක් ලෙස සතර බ්‍රාහ්ම විහරණය දස කුසල් ප්‍රතිපදාව ලොවට හෙළි කරන ලදී. එනම් මෙත්තා කරුණා, මුදිතා උපේක්ඛායි. මෙත්තා නම් හිතවත් භාවයයි. එනම් හිතවත්, අහිතවත් භේදයකින් තොරව සියල්ලන් කෙරෙහිම දක්වන හිතවත් භාවය මෛත්‍රියයි. කරුණාව නම් අනුන්ගේ දුක දුටු විට හදවත කම්පා වී එම දුකින් මුදවා ගැනීමට ඉදිරිපත් වීමයි.

**පරදුක්ඛෙහි සති සාධුනං හදය**
**කම්පිතං කරෝතිති කරුණා**

යනුවෙන් බුදුරජාණන් වහන්සේ දේශනා කළ සේක.

මුදිතාව නම් අනුන්ගේ සතුටෙදී සතුටු වන ස්වභාවයයි. උපේක්ඛා යනු සිත්හි ඇතිවෙන නොසැලෙන මැදහත්භාවයයි. සතර බ්‍රාහ්ම විහරණයේ යුක්ත වීම තමාගේත් අනුන්ගේත් සැනසීම පිණිස හේතු වෙයි. ඊර්ෂ්‍යාව, ක්‍රෝධය, වෛරය යන දුර්ගුණ සිතෙහි බලපැවත්වෙන විට සිත අපිරිසිදු වෙයි. එවිට ජීවිතය අසහනකාරී වෙයි. සිව් බඹ විහරණ ප්‍රගුණ කරන විට ඉහත කී සිත අපිරිසිදු කරන කාරක ඉවත් වී සිත ප්‍රභාෂ්වර තත්ත්වයට පත් වෙයි.

මෙසේ සිව්බඹ විහරණය ප්‍රගුණ කරන විට දස කුසල ධර්මයද ඉබේම ජීවිතයට සම්බන්ධ වෙයි. එනම් (1) ප්‍රාණඝාතයෙන් වැලකීම, (2) නුදුන් දේ ගැනීමෙන් වැලකීම, (3) කාම මිත්‍යාචාරයෙන් වැලකීම (4) බොරු කීමෙන් වැලකීම (5) කේළම් කීමෙන් වැලකීම (6) පරුෂ වචන කීමෙන් වැලකීම (7) හිස් වචන කීමෙන් වැලකීම (8) දැඩි ලෝභයෙන් වැලකීම (9) තරහ නොගැනීම (10) මිත්‍යා දෘෂ්ටියෙන් වැලකීම.

බෞද්ධ දර්ශනයට අනුව සියලු සත්ත්වයෝ තම ජීවිතය ප්‍රිය වෙති. එම නිසා තමා උපමා කරගෙන අන්‍යයන්ගේ ජීවිත සුරක්ෂිත කළ යුතු බව බුදු රජාණන් වහන්සේ දේශනා කළ සේක.

**සබ්බේ තසන්ති දණ්ඩස්ස**
**සබ්බේ භායන්ති මච්චුනෝ**
**අත්තානං උපමං කත්වා**
**න හනෙය්‍ය න ඝාතයෙ**

ඉහත කී ධම්ම පදයට අනුව පිළිවෙත් පුරන්නේ නම් බියෙන් සැකෙන් තොරව සියලු දෙනාගේම ජීවත් වීමේ අයිතිය සුරක්ෂිත වනු ඇත.

කෙනෙකුගේ වස්තුව දැක එයට ලොබ බැඳ තණ්හාව උපදවා එය සොර සිතින් තමා නතු කර ගැනීමට යත්න දැරීම නිසා අද්‍යතන සමාජය ව්‍යාකූලත්වයට පත්වී ඇත. බුදු රජාණන් වහන්සේ වසල සූත්‍රයේදී දේශනා කර ඇත්තේ අන්‍යයන්ගේ ගමෙහි හෝ වනාන්තරයේ හෝ අනෙක් අයට අයිති දේකට ආශා කර ගනිද නුදුන් දෙයක් සොර සිතින් ගනිද හෙතෙම වසලයෙකු වන බවය.

මිනිස් සමාජය තුළ ශිෂ්ට සම්පන්න ආකාරයෙන් කම් සැප විඳීම සඳහා අවශ්‍ය පසුබිම විවාහ සංස්ථාව මඟින් ස්ථාපිත කොට ඇත. එහි සීමාව ඉක්මවා යෑම පුද්ගල පරාභවයට හේතු වන බව බුදු රජාණන් වහන්සේ වදාළ සේක.

බොරුව, කේළම, පරුෂ වචන හිස් වචන කීම යන වාග් දුශ්චරිතයෙන් වැළකී තව කෙනෙකුගේ හදවත ප්‍රහර්ෂයට පත් කරවන අයුරෙන් වදන සංවර කරගැනීම සඳහා බුදු සමයෙන් ලැබෙන්නේ මහර්ඝ පිටිවහලකි. බුදු රජාණන් වහන්සේ දේශනා කර ඇත්තේ අර්ථවත් දෙයක් කතා කළ නොහැකි නම් නිහඬව සිටීම උතුම් බවයි.

අනුන්ගේ වස්තුවට ආශා නොකිරීම හෙවත් දැඩි ලෝභයෙන් වැලකීම, අනුන් දෙස තරහ සිතින් නොබැලීම හා මිත්‍යා දෘෂ්ටියෙන් ඉවත්ව සම්මා දෘෂ්ටියෙන් ජීවිතය දැකීමත් පුද්ගලයා බැබලීමට හේතු වෙයි.

සතර බ්‍රහ්ම විහරණය දස කුසල ධර්ම ජීවිතයට සම්බන්ධ කර ධම්මානුධම්මප්‍රතිපන්න වීම තුළින් පරිහානියට පත් වෙමින් යන සාරධර්ම පුනරුත්ථාපනය කළ හැකිය. එය 2564 සම්බුද්ධත්ව ජයන්තියට වෙනුවෙන් කරන පූජෝපහාරයක්ම වේවි.

ජේ.එම්. දිලූකා ඉරෝෂනී - හලාවත

## ධම්ම පදයේ යමක වග්ගයෙන්

*යථා ආගාරං දුච්ඡන්නං - වුට්ඨී සමතිවිජ්ඣති*
*ඒවං අභාවිතං චිත්තං - රාගො සමති විජ්ඣති*

ගෙය සෙවිළි මද කොට
තෙමෙන මෙන් හැම වැස්සට
බැවුම් නොවඩන විට
රාගයෙන් සිත තෙමෙයි හැමවිට

*යථා ආගාරං සුච්ඡන්නං - වුට්ඨී න සමතිවිජ්ඣති*
*ඒවං සුභාවිතං චිත්තං - රාගො න සමති විජ්ඣති*

ගෙය සෙවිළි හොඳ විට
නොතෙමෙන ලෙසට වැසි වට
බැවුම් වැඩි සිත කට
රාග දොස් යා නොහැක ඇතුලට




බුදු පියාණනි, ඔබේ පාද කරනෙමි පිනිපා
පියෙන් පියට මිහිකත සනහා
බැලූ බැලූ නෙත් සිත් බඳවා
දහම් අමාවෙන් තිලොව තෙමූ
බුදු පියාණනි... ඔබේ පාද කරනෙමි පිනිපා...

සසර සයුරකට නෞකාවයි
නිමල අමිල මෙත් සිලිලාරයි
ලොවේ අනගි ගුණ දම් මුහුදයි
බුදු පියා මගේ භවේ අඳුර නැසූ මිණි පහනයි

හිමියනි ඔබෙ මොක් මග හමුවේ
ඇදෙමි බැඳෙමි පැහැදෙමි නිබඳේ
තිලෝ තිලක සම්බුදු සමිඳේ
මම දීවා රැයේ ගිලී නහමි නියැකැන් දහරේ

*ගේය පද - විජේතිලක රත්නායක*

*තනුව සංගීතය හා ගායනය - සෝමතිලක ජයමහ*

සියලු ලෝ වැසියන් භව දුකින් මුදවා ගැනීමට දස පෙරුම්පුරා බුද්ධත්වයට පත්වූ බුදු හිමියන් අපගේ පියාණන් හා සම වේ. මෙත්තා, කරුණා, මුදිතා, උපේක්‍ෂා ආදී වූ සිව් බඹ විහරණයෙන්ද කියා නිමකළ නොහැකි අනන්තවූ ගුණ මහිමයෙන් පිරිපුන් වූ බුදුන්වහන්සේගේ අභිප්‍රාය වූයේ සියලු ලෝ සතුන් දුකින් මුදවා ගැනීමයි. සතර අපායන්හි නොවැටී යහ මාර්ගයට පැමිණෙන්නට උපදෙස් දීමයි. උන්වහන්සේ සියලු ලෝ වැසියන් තම දරුවන් සේ සලකා ඔවුන් යහපතෙහි යෙදවීමට ගත් උත්සාහය නිසාම බුදුන් වහන්සේ අප සැමගේ පියාණන් බවට පත්වේ. එබැවින් අප සැම තිලෝගුරු බුදු හිමියන්ගේ ශ්‍රී පාදය නමස්කාර කළ යුතු වෙමු, බුදු ගුණ ගායනා කළ යුතු වෙමු, එමෙන්ම බුදුන් වදාළ දහම් මාර්ගයෙහි ගමන් කළ යුතු වෙමු.

බුදුන් වහන්සේගේ සුමියුරු හඬත්, අසහාය රූපකායත්, සියලු ලෝ වැසියන්ගේ නෙතත් සිතත් සනසයි. උන්වහන්සේගේ මෛත්‍රියද මුළු විශ්වයම කරා විහිදුනකි. බුදු දහම තුළින් කියවෙන්නේ සසර කතරින්, භව දුකෙන් මිදීමේ මාර්ගයයි. එබැවින් බුදුන්වහන්සේ යන වදන සවනත වැකෙත්ම අප හදවත් ශාන්තියෙන් පිරෙයි.

බුදුරජාණන් වහන්සේගේ අමිල ගුණස්කන්ධය වර්ණනා කරන්නට විජේතිලක රත්නායකයන් අතින් ලියැවී මේ ගී ද අමිලය. ගීතය සඳහා ඉතා සංයමයෙන් යොදාගන්නා වදන් සෝමතිලක ජයමහගේ සංගීතයෙන් හා මධුර හඬින් ඔපවත්ව ගැයෙන විට අපට දැනෙන්නේ ශාන්ත රසයයි.

ගීතයේ මුල් කොටස ඇසෙනවිට බුත්සරණේ නාලගිරි දමනයේ එන '' මෑත එබූ එබූ පයින් මහ පොළව සනහ සනහා වඩනා බුදු පියාණෝය'' යන වැකි සිහිපත් වේ. මින් පෙනෙන්නේ ගීතයේ සාර්ථකත්වයට බුත්සරණෙන් විජේතිලක රත්නායකයන් ලැබූ ආභාෂයද බලපා ඇති බවය.

ගේය පද රචකයා ගීතය තුළ යොදාගන්නා යෙදුම්ද ගීතයේ අර්ථය ඉස්මතු කරන්නට සමත්ව ඇත. '' සංසාරය'' ගිමක් නොමැති සයුරකට උපමා කර තිබේ. සැබවින්ම සසර ඉමක් කොනක් නොපෙනෙන්නකි. සයුරක අතරමං වී දියෙහි ගිලී මිය යන්නකුට නෞකාවක් යනු අමිල වස්තුවකි. එබැවින් සසර නම් සයුරේ අතරමං වූවෙකුට බුදු රජාණන් වහන්සේ සහ බුදු දහම යනු සසර සයුරේ එතෙර වන්නට ලැබුණු නෞකාවක් නොවන්නේද?

සයුරෙහි දිය කිසිදා නොසිඳේ. එය ප්‍රමාණ කළ නොහැකිය. බුදු දහමද එසේමය. '' ලොවේ අනගි ගුණ දම් මුහුදයි'' යනුවෙන් ප්‍රකාශ කර ඇත්තේ එනිසාමය.
බුදු දහම සැබවින්ම වටහා ගත්තෙකු, සසරේ සැබෑ ස්වරූපය, ජීවිතයේ යථාර්තය අඳුනා ගත්තෙකු නිබඳවම බුදු දහම අනුව මොක්මග සදා ගන්නට වෙහෙස වනු ඇත.

බුදුරජාණන් වහන්සේගේ අමිල ගුණ සමුදාය අරුත් බර සුලලිත සුගේය පද වැලකට මුසු කරන්නට විජේතිලක රත්නායකයන් දැරූ වෑයම සාර්ථක වී ඇත. සෝමතිලක ජයමහගේ හඬින් ගැයෙන ගීතය සවනත වැකෙත්ම අප සිත් සතන් බුද්ධාලම්භනයෙහි ගැලෙයි. ඉන් ශාන්ත රසයක් දැනෙයි

මෙතෙක් ලියැවී ඇති බුදු ගුණ ගී අතුරින් සුවිශේෂී ගීතයක් ලෙස ශ්‍රාවක හදවත් තුළ හිඳවා ගත වන්නට විජේතිලක රත්නායකයන්ගේ සුගේය පද වැලත් සෝමතිලක ජයමහගේ සංගීතය හා ගැයුමත් සමත්ව ඇත.

**සයුරෙහි දිය කිසිදානොසිඳේ. එය ප්‍රමාණ කළ නොහැකිය. බුදු දහමද එසේමය.**
**'' ලොවේ අනගි ගුණ දම් මුහුදයි'' යනුවෙන් ප්‍රකාශ කර ඇත්තේ එනිසාමය.**
**බුදු දහම සැබවින්ම වටහා ගත්තෙකු, සසරේ සැබෑ ස්වරූපය, ජීවිතයේ යථාර්තය අඳුනා ගත්තෙකු නිබඳවම බුදු දහම අනුව මොක්මග සදා ගන්නට වෙහෙස වනු ඇත.**

චාමිකා ජනානි ද සිල්වා

## දස මාසේ උරේ කතවා

# මව් පිය ගුණ වටහා ගනිමු



මව්පිය සෙනෙහසින් මවගේ කුසෙහි තැන්පත් වන ධාතු මාත්‍රකි. ඇසට නොපෙනෙන කුඩා සත්වයෙකි, මවගේ ක්‍රියාකාරකම් සියල්ලම වෙනස් කරවති. මාස දහයක් කරන ගරබයක් ඇරඹේ.

වෙනදා ගත් ආහාර ගැනීමට නොහැකිවේ. මව මේ කුඩා සත්වයාට අවැසි විලාසයට හැඩ ගැසේ. සීතල ආහාර,උණුසුම් ආහාර, දියර වර්ග තිත්ත රස, පැණි රස, ඇඹුල් රස, කුසට ආහාර වඩා වැඩිමනක් බඩ ගින්නේද සිටිති. රෝග වෙති. වේලාවට ආහාර ගැනීමට සිදුවේ. පමා වුවහොත් කලබල කරමින් දැනුම් දෙති. මව ගන්නේ ඔහුට ආහාරයි.

මවගේ ඇඳුම් පැලඳුම් පවා වෙනස් වෙති. තද වුවහොත් අපහසු කරවති. සැහැල්ලු ඇඳුමට හුරු කරවති. ගමන් විලාසය නිදා ගැනීම වාඩි වීම නැගිටීම සෑම ඉරියව්වක්ම දරුවාට ඇවසි අයුරින්ම මව සකසේ.

මේ සෑම දෙයක්ම ඉදිරියේ පියාගේ අත දීම වමටයි. ආදරය කරුණාව මෛත්‍රිය ඉවසීම වැනි අරමුණක පිහිටීම දැහැමි වීම අන් අයගේ ආදරයට ලක්වීම මෙම කාලය තුළ අගම ධර්මය කෙරෙහි මනාව හිත යොමුවේ. පියාගේ උපකාරය ලැබෙන විට ආදරය, කරුණාව ලැබෙන විට හිත සතුටු වෙයි. හිත වෙනස් වී කෝපය ඇති වුවහොත් මුළු සිරුරම උණුසුම් කරවමින් කුසෙහි සිටිමින් දෙපා ගසමින් දඟලමින් කලබල කරවති.

මෙම කාලය තුළ බවට දෙන දුබුවම් අපමණය. හිතේ හැටියට නින්දක් නැත. අවැඩි විලසින් ගමනක් යා නොහැක. හැරුණත්, නැමුනත්, පෙරළුනත් කලබල කරවති. මෙපමණ හරබයක් කළත් මවගේ හිත හරිම උණුවෙන හදකි.

අංගුලිමාල මහ රහතන් වහන්සේ දරුවෙකු ලැබෙන්නට සිටි ගැබිබර මවකගේ දුක් අඳෝනා අසා සිටියේ පිණ්ඩපාතයේ වඩිනා ගමනේදීය. උන් වහන්සේ කල්පනා කරන්නට ඇති "මිනිසුන් දහසක් මැරවත් මේතරම් වද වින්දේ නැත. එහෙත් දරුවෙකු මෙලොව එළිය දැකීමට ආසන්න වෙද්දී මවකගේ දුක් අඳෝනා වේදනා මොනතරම් ද? කිසිවෙකුට අසා දරා සිටීමට නොහැකිය.

සම්මා සම්බුදු රජාණන් වහන්සේ හමු වී මේ ඇත්තියට පිහිට කිරීමට ඇත්නම් කියා සිතෙන්නට වුවෙන් සම්බුදුපියාණන් ඉදිරියේ මේ සිදුවීම ප්‍රකාශ කරද්දී මේ පිරිත දේශනා කළ සේක.

මේ දුක් දැනගත් නිසා විය යුතුයි. අංගුලිමාල රහතන් වහන්සේ කියා සිටියේ "ආර්ය ජාතියේද පාපයක් කරනැති නිසා මේ ගැබිබර මාතාව සුවපත් වේවා! " අධිෂ්ඨානශීලීව පිරිත දේශනා කළෙන් එම මාතාව සුවපත් වී නිදහස් විය.

අදටත් දරුවෙකු ලැබෙන්නට සිටින බවට පින් දහම් කිරීමට පින් සිතුවිලි ඇති කරලීමට පියවරු කෙතරම් උනන්දුවනවාද. මව සෑම මොහොතේම ජීවිතයත් මරණයත් අතර සටනක යෙදෙන නිසාය. අංගුලිමාල පිරිත දේශනා කරවා ගැනීමට කෙතරම් උනන්දු වෙනවාද? දරුවෙකු ලැබෙන මොහොතේ මව සිත කෙතරම් දැහැමි වෙනවාද? බුදු ගුණ සිහිකරමින් සිටින නිසා මව්වරුන්ගේ දුක් පීඩා දුරුවේ. පින්වත් දරු උපත් සිදුවේ.

ඔන්න හිටියා ඇති කියා දින සති මාස ගත වූ කල දරුවා මෙලොව එළිය දැකීමට කරන සටනකි. මවට සිටිනා තැන අමතකවේ. දුක් අඳෝනා නගමින් වද වේදනා විඳිමින්, මල මුත්‍රා පහවෙමින් ඇඳිවත පවා නැතිව දෙපාවල සවිය මදිදෝ සිතා අති ශක්තිය දෙන්නට දෙපා අල්ලා උසුලන වේදනාව මැද ලේ කැටියක් ලෙසින් බිහිවන විට දරුවා කවුරුන් හෝ ගනී දෝ සිතා සැක සිතේ. පෙකෙනි වැල කැපීමෙන් පසු දරුවා වෙන් වේ. ගලායන උණුසුම් රුධිරය කැටිව සිටියදී පවා සිරුරට දැනෙන සැහැල්ලුව සුවය කියා නිම කළ නොහැකිය. දරුවාගේ හැඬීම ඇසෙන විට මවගේ කලබලය දරුවාගේ මුණ බලා ගැනීමටය. මෙලොව තමා ලැබූ වටිනාම සම්පත දරුවාය.

"පුත්තා වත්‍ථු මනුස්සානං" සම්මා සම්බුදු රාජණන් වහන්සේ මෙම දහම් පදය දෙසුවේ මව්පියන් විඳින දුක හා ලබන සතුට දිවැසින් දුටු නිසාය. තමන් වහන්සේ ළඟට දෙවෙනි කොට මව්පියන් සලකන්වායි දේශනා කළ සේක. දුක වටහාගත් නිසාමය.

බුදුරජාණන් වහන්සේ මාතෘ දිව්‍යරාජයාණන්ට දහම් දෙසීමට දෙව්ලොව් මාස තුනක් වස් විදාල සේක. මවගේ උතුම් ගුණයට සැලකීමටය. පිය තුමාගේ ඉල්ලීමට මෙතරම් සැලකූ උතුමෙක් මෙලොව නැත.

කුඩා රාහුල දරුවා මහණ කළ බව අසා කම්පා වූ පිය රජතුමා හඬා වැටෙමින් කියා සිටියේ "දරු සෙනෙහස ඇට මිදුළු නහර හද පතුලටම දැනෙන බැවින් මව්පිය අවසරයක් නොමැතිව දරුවෙකු සසුන් ගත කිරීමට එපාය.." යන ඉල්ලීම අදටත් පවතින ධර්මයකි. පිය රජතුමා අවසන් කාලය පසු වෙද්දී තමන් වහන්සේ ළඟම වැඩ සිට හිස අත තබා ධර්ම දේශනා කරමින් රහත් භාවයට පත්කරලීමට මඟ සැලසූ සේක.

දරුවෙනි මව් පිය ගුණ අපමණයි. ඔබලාගේ සිත් පහන් වේවා. වැඩිහිටි නිවාස වලට යවා ඇති, නොසලකා හැර ඇති, මව්පියන් තමන් ළඟට ගෙන්වා ගෙන සිදු වූ වැරදි වලට සමාව ලබාගෙන කවා පොවා ඇප උපස්ථාන කරවා සිත් සැහැල්ලු කරවා පින් කිරීමට මඟ සලසා සැපවත් මරණයක් ළඟාකර ගැනීමට මඟ පාදා දෙත්වා.

සම්මා සම්බුද්ධත්වය සමරණ මොහොතේ බුදුන්වහන්සේගේ දේශනාව අනුව ගෙදර බුදුන් වහන්සේලාට සලකමු පින් රැස් කර ගමු.

ඇම්.ඩී. මාලනී ගුණතිලක
කඳුරුවෙල-පොළොන්නරුව

# සරළ දිවි පෙවෙත ආයුෂ වැඩි කරයි.

මිනිසාගේ පරිනාමය කෙසේ සිදු වුවත්, අප දන්නා ඉතිහාසය තුළ මිනිසුන් වනාචාරීව ජීවත් වූ බවට සඳහන් වෙයි. මේ වනාචාරී යන වචනය ඇසෙනවිට යමෙකුට නොදියුණු, අසංවර, පහත් යන හැඟීමක්ද සිතට එයි. එහෙත් එහි මා දකින අදහස නම් ආදිවාසී මිනිසා පරිසරය සමග සහයෝගයෙන් ජීවත් වූ දියුණු පිරිසක් බවයි. මේ දියුණුව යනු අද අප දකින පරිගණකය හෝ ග්‍රහලෝක තරණය කිරීම සඳහා මිනිසා ලබා ඇති දියුණුව නොවේ. තමන්ටත් කරදරයක් නොවී, අනුන්ටත් කරදරයක් නොමැතිව පරිසරය රැක ගනිමින් ජීවත් වීමේ කලාව ඉගෙනගත් මිනිසා යන අදහසයි. එදා මිනිසුන්ගේ ජීවන රටාව සකස්වී තිබුනේ අසීමිත වුවමනාවන් තුළ නොවේ. එදිනෙදා පැවැත්ම මෙන්ම හෙට දවස ගැනද ඔවුන් සිතූහ. ඒ යුගයට අවශ්‍ය ජීවිතයට අවශ්‍ය තාක්ෂණික මෙවලම් භාවිතා කළහ. මේ සියල්ල තුළ සරළ බව හෙවත් චාම් බව පැහැදිලිව දක්නට ලැබුණි.

මිනිසා වර්තමානයේ දියුණුවේ ඉහලටම ලගා වෙමින් ඇත. කළ නොහැකි දෙයක් නැත යන තරමට මිනිසා මේ මිත්‍යාව තුළ අතරමංවී සිටිති. මේ සැම දෙයක්ම රඳපවතින්නේ ලෝක ධර්මතාවයන් අනුවය. ඇතිවීම, පැවතීම, නැතිවීම ඒ ධර්මතාවයයි. මේ පිළිබඳව කාලයෙන් කාලයට මිනිස් සමාජය දැනුවත් කරන්නට විවිධ ශාස්තෘවරුන් බිහිවී ඇත. ඔවුන් කාලයක් තිස්සේ ප්‍රගුණ කල දේ ලැබූ අත්දැකීම් තුළ එක්කර ගත් දැනුමින් සත්ත්වයාට යහපත් වූ ජීවිතයකට කරුණු පහදා දී ඇත. මේ කරුණු වටහා දුන් ශාස්තෘවරුන් අතර බුදුන් වහන්සේ, ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ. වැඩි පිරිසක් පිළිගන්නා ආගමික න්‍යායයක් දැක්වූ ශාස්තෘවරුන්ය. මේ අතර බුදුරජාණන් වහන්සේ සත්වයන්ගේ ලෞකික ජීවිතය මෙන්ම ලෝකෝත්තර ජීවිතය යන දෙයාකාරයෙන්ම ඉදිරියට යාම සඳහා උත්තරීතර දර්ශනයක් ඉදිරිපත් කර ඇත. මේ කරුණු පිළිබඳ මිනිසා උනන්දු නොවන විට ජීවා අපේ ඇස් පනාපිටම යථාර්ථයක් බවට පත් කරලීමට ස්වභාව ධර්මය විසින් මග පාදයි. අප පසුගිය කාලයේ අත්විදි සුනාමි , ගංවතුර , සාගත , භූමිකම්පා, ලැව්ගිනි, කුණාටු මේ ලෝක ස්වභාවය පිළිබඳ පෙන්වන සාධකයන්ය. අද අප ලබා ඇති දියුණුව තුළ මේවා පාලනය කරන්නට හෝ නතර කරන්නට කිසිවෙක් සමත් වී නැත.

බුදු දහම තුළ උගන්වා ඇති මේ ධර්මතාවයන් අන්ත දෙකක් වන්නේද නැත. බුදු දහමේ උගන්වන අවසාන ප්‍රතිඵලය වන ලෝකෝත්තර සුවය වන නිවන ලගාකර ගැනීමට උපකාරීවන ක්‍රමවේදයක් පෙන්වා ඇත. ලෞකික ජීවිතය හැඩ ගැස්සවීමේදි දේශනා කර ඇත. මෙහිදී ජීවත් වන අපට එදිනෙදා වඩාත් ප්‍රයෝජනවත් වන සමාජයේ ලෞකික ජීවිතය ක්‍රමවත් ව හැඩගස්වා ගනිමින් ඉදිරියට යන්නට බුදුන් වහන්සේ දේශනාකර ඇති කරුණු කාරණා විශාල කොටසකි.

මහා සාගරයක් වන් කොටසකින් පුංචිම පුංචි දිය බිදක් වුවත් සෑම දිවියක්ම සාර්ථක කර ගන්නට දිව ඔසුවක් වී ඇත.

අපට සාර්ථක ජීවිතයක් ගත කරන්නට කියා දුන් කරුණු අතර, ඉතා වැදගත් දහම් කරුණු සිගාලෝවාද, මහා මංගල,පරාභව ආදී සූත්‍ර වලින් කියාදී ඇත. අප ගරු කලයුතු දහම් කරුණු මොනවාද? මිනිසාගේ දියුණුව හේතුවන කරුණු මොනවාද? යන්න එමගින් පැහැදිලිව අපට උගතහැක. මේ අතර සිගාලෝවාද සූත්‍රයේ ඔබ සැම දන්නා කරුණක් මෙහි සටහන් කරමි.

යමෙක් උපයන ධනයෙන් කොටසක් පරිභෝජනයට ගත යුතුය. තවත් දෙකොටසක් කර්මාන්ත ක්‍රියාව හෝ ව්‍යාපාර දියුණුව සඳහා යෙදවිය යුතුය. අනෙක් කොටස ඉදිරි දියුණුව සඳහා ඉතිරි කළ යුතුය. අද කුමන න්‍යායක් ඉදිරිපත් කලත් ඉහත න්‍යායෙන් පිටස්තරව ගොස් ලැබූ දියුණුවක් නැත. සාර්ථක මනුෂ්‍යයකු ලෙස ජීවත්වීමේදී පමණ දැන කටයුතු කළයුතු බව අපේ පැරැණ්නන් කියා ඇත්තේ මෙසේය.

**ගොඩැල්ලේ තරම දැනගෙන ළිඳකපනු**
**බොරැල්ලේ තරම දැනගෙන උඩපනිනු**
**කඩුල්ලේ තරම දැනගෙන කඳබඳිනු**
**තමුන්ගේ තරම දැනගෙන කල්අරිණු**

ඒ තුළ වටිනා උපදේශයක් ගැබ්ව ඇත. එහෙත් විවිධ හේතූන් නිසා මේ සියළුදේ උඩු යටිකුරු වෙමින් මිනිසා අසීමිත ආශාවන් පසුපස හඹායන්නට පටන්ගත් දා සිට ආයුෂයෙන්, ධනයෙන් බලයෙන් පිරිහෙමින් දුකට පත්ව සිටීම සාමජ යථාර්ථයක් බවට පත් වෙමින් ඇත.

අපට ජීවත් වීමට ආහාර අවශ්‍යයි. නිවාස වස්තු බෙහෙත් මේ මූලික දේයි. මේවාට අප වහල් වුවහොත් ඇතිවන්නේ දියුණුවට වඩා පරිහානියයි.

ජීවත් වීමට නිවාස අත්‍යාවශ්‍ය සාධකයකි. - ඒ සඳහා සුවපහසු නිවසක් ගෙඩනගා ගත යුතුය. අපට සරිලන අපට ප්‍රමාණවත්, නිවසකට වඩා අප සිතන්නේ පරපුරක් ජීවත් කළ හැකි මහා පරිමාන නිවසක් ගැනය. ඒ අනුව අප ඉහතින් සඳහන් කළ ඉතිරි කිරීම වෙනුවට ණය කරුවන් වී අවසන්ය. ලැබෙන නිසා ණය ලබා ගැනීම හෝ ණය ලැබෙන නිසා අපට බරොත්තු නොදෙන ලෙස නිවාස ඉදිකිරීම නිදහසට කරුණක් නොවේ.

දෙවන කරුණ ආහාරයයි. සෑම සත්වයෙකුටම ආහාර අවශ්‍යයි. ආහාර අවශ්‍ය වන්නේ ජීවත් වීමට මිස ජීවත්විය යුත්තේ ආහාර සඳහා නොවේ. එයින් සිදු වන්නේ ජීවිතය කෙටි කර ගැනීමට උදව්වකි. අප ගන්නා ආහාර රටාව මිනිස් සිරුරට කොතරම් හිතකරදැයි සිතා බලමු. මිනිස් සිරුර හැඩ ගැසී ඇත්තේ ස්වාභාවික පරිසරයෙන් ලබා ගන්නා ආහාර ජීර්ණය කිරීමේ පද්ධතියකි. අදිවාසී මිනිසා කොලවර්ග අලවර්ග ධාන්‍ය වර්ග, ආහාරයට ගත්තේ ඒ රටාව තේරුම් ගත් බැවිනි. අදටත් අපේ පරිසරයේ වැවෙන පලාකොල, අලබතල , වී ,කොස් පොල්, දෙල් වෙනුවට අප නිතර ලබා ගන්නේ සකස්කල කෑතීම ආහාර වර්ගයන්ය. විවිධ මාංශ ආහාර, මේදය බහුල අහාර, පිටිවර්ග නවීණ තාක්ෂණය යටතේ වැඩිදියුණු කල පළතුරු වර්ග පරිභෝජනයට ගැනීමට අපි පුරුදු වී සිටිමු. මේ සියල්ලටම අප හුරුව ඇත්තේ අප නොදැනුවත්වම අප මුලා කර ඇත වෙළඳ ප්‍රචාරණයන් විසිනි. මෙම ව්‍යාපාර වීමෙහි සකසුරුවම, සරළ බව අල්පේච්ඡතාවය වෙනුවට වෙළඳ ප්‍රචාරණ තුළ සමාජය කොතරම් කළුගත සමාජයක් කර ඇත්දැයි ඔබ නිකමට සිතා බලන්න.

**මිනිසා වර්තමානයේ දියුණුවේ ඉහළටම ලඟා වෙමින් ඇත. කළ නොහැකි දෙයක් නැත යන තරමට මිනිසා මේ මිත්‍යාව තුළ අතරමංවී සිටිති. මේ සැම දෙයක්ම රඳපවතින්නේ ලෝක ධර්මතාවයන් අනුවය. ඇතිවීම, පැවතීම, නැතිවීම ඒ ධර්මතාවයයි. මේ පිළිබඳව කාලයෙන් කාලයට මිනිස් සමාජය දැනුවත් කරන්නට විවිධ ශාස්තෘවරුන් බිහිවී ඇත. ඔවුන් කාලයක් තිසේසේ ප්‍රගුණ කළ දේ ලැබූ අත්දැකීම් තුළ එක්කර ගත් දැනුමින් සත්ත්වයාට යහපත් වූ ජීවිතයකට කරුණු පහදා දී ඇත. මේ කරුණු වටහා දුන් ශාස්තෘවරුන් අතර බුදුන් වහන්සේ, ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ, වැඩි පිරිසක් පිළිගන්නා ආගමික න්‍යායයක් දැක්වූ ශාස්තෘවරුන්ය. මේ අතර බුදුරජාණන් වහන්සේ සත්වයන්ගේ ලෞකික ජීවිතය මෙන්ම ලෝකෝත්තර ජීවිතය යන දෙයාකාරයෙන්ම ඉදිරියට යාම සඳහා උත්තරීතර දර්ශනයක් ඉදිරිපත් කර ඇත.**

**ඔබට නිතර ඇසෙන**


අපේ ඔයා තාම පාවිච්චි කරන්නේ පරන ටීවී එකමද?
ඔයා තවම ලැප්ටොප් එකක් ගත්තෙ නැද්ද?
මම නම් පාවිච්චි කරන්නේ අගටම ඇවිපු එක බලන්නකො,
මගේ කොන්ඩෙ ලස්සන.

මේ සියළු දේ තුළ ළමා පරපුරේ සිට වැඩිහිටියා දක්වා අරමුණක් නොමැති හිස් මිනිසුන් බවට පත් කරමින් සිටිනවා නොවේද? වෙළඳ ප්‍රචාරණය සමාජයට ගැලපෙන පරිදි යොදා ගැනීම වරදක් නොවේ, සමාජයට හිතකර සාරධර්ම සංස්කෘතිය, දේශීය ආහාර රටාවන් පුරුදු පුහුණු කර හැකි ප්‍රචාරණයන් ඉතා ඵලදායී ලෙස යොදා ගත හැකිය. ඒ තුලින් පරගැති මානසිකත්වය දුරු වී දේශීය චින්තන ජනතාවගේ හදවත් තුළ ගොඩනගන්නටද මහත් උපකාරයක් සිදු කළ හැකිය. එසේ නොමැති තැන සිදු වන්නේ රට සංස්කෘතික වශයෙන් සාරධර්ම වශයෙන් පිරිහුණු මිනිසුන් කිරීමය.අද බොහෝ දෙනෙකුට ටික දුරක්වත් පා ගමනින් යා නොහැක. ඇගට පතට දැනෙන වැඩක් කළ නොහැකි රෝගීන් පිරිසක් සමාජයට බිහිකරමින් සිටිති. අවුරුදු 18 පිරුණු පාසැල් දරුවන්ට පවා දියවැඩියාව, හතිය, අධිරුධිර පීඩනය, දායද වී තමාරය, මේ නිරෝගී කමද ? මේ අපගේ දියුණුවද ? බුදුන් වහන්සේ දේශනා කළේ උතුම්ම ලාභය නීරෝගී කම බවයි. නිරෝගී කම නැතිකර ගන්නේත් අප විසින් ඇතිකරගත් වැරදි ජීවන රටාව නිසා නොවේද ?

ඔබ නිකමට සිතන්න. උත්සවයකට සහභාගී වන විට අපේ කෑම ප්‍රමාණය පාලනය වෙනවාද? අපේ සිතිවිලි අනුව බරොත්තු නොදෙන තරමට තිබෙන සියළුම දේ කෑමට උත්සාහ දරයි. ඒ තුලින් අපට අනවශ්‍ය තරමට මෙන්ම අනවශ්‍ය දේද ආහාරයට ගැනෙයි. වැඩි කොටසක් නිකරුණේ ඉවත දමයි. මේ අප තුළ ඇතිවන සිතුවිලි පාලනය නොකිරීම නිසා සිදුවන හානියකි. අපට බරොත්තු නොදෙන සිහින සැබෑ කර ගැනීමට යාම අහෙක් රෝගයයි. අප අපේ ජීවිත වඩාත් යහපත් කර ගැනීම ගොඩක් දේවල් හිතනවා, ගොඩක් දේ අපේක්ෂා කරනවා, උසස්වීම, ගෙවල් දොරවල්, යාන වාහන, දූවා දරුවන්, මිල මුදල්, සමාජ තත්ත්වය, මේ හැමදෙයක්ම කරගන්නට බැරිවූනාම, අපේක්ෂාවක් කඩ උනාම අපි මානසික පීඩාවකට පත්වෙනවා. එය අපේ මුළු ජීවිතයටම බලපානවා, මානසික ආතතිය, මානසික වේදනා අපි ඇතිකර ගන්නා දේවල් ලෝකය අපට අවශ්‍ය විදියට හසුරවා ගන්නට හැකිනම් පීඩාවල් නැහැ, එහෙම නොවන නිසා අපේ සිත් පාලනය කරන ක්‍රමවේදයක් අප පුරුදු කළ යුතුයි.

අද අපි ජීවත් වන්නේ අපට ඕනෑ හැටියටද? එසේ නැත්නම් සමාජයට අවශ්‍ය හැටියටද? එහෙත් අපට අවශ්‍ය විදියට ජීවත් වන්නත් බෑ. ඒ ඒ සමාජ වලට පොදු සමාජ හිතකාමී චර්යා රටාවන් තිබෙනවා. එය අප තේරුම් ගත යුතුයි. අපට පොඩ්ඩක් දේ සකස් කරන්නට බැරි වෙයි. අපි අපි හැදෙමු. අපි දරුවන් හදන්නට උත්සාහ ගනිමු. අවශ්‍ය ප්‍රමාණයට අඳුම් පැලඳුම්, කෑම බීම, යාන වාහන, දුරකථනය, ගුවන්විදුලි, රූපවාහිනී මේ සියල්ල පරිහරණය කරමු. එයින් ලැබෙන හොඳ දේ අපේ ජීවිතයට එක්කර ගනිමු. සරල පැවතුම් ඇති ලෝක ධර්මයට ගරු කරන සැහැල්ලු මිනිසුන් වීමට උත්සාහ ගනිමු.

ඒ තුලින් ඔබේ සිතේ තිබෙන ගොඩක් ලෙඩ රෝග සුවපත් වේවි. යතේ තිබෙන ගොඩක් ලෙඩ ඉවත් වේවි. එවිට ඔබට අලුතින් හිතන්නට ඉඩ ලැබේවි, යහපත් සිතුවිලි ඔබේ සිත ප්‍රභාෂ්වර කරාවි, එයින් ඔබේ ලේ ධාතුව පිරිසිදු වේවි. ඔබේ මුහුණ ලස්සන වේවි. ශරීරය පැහැපත් වේවි. අන් අයට ප්‍රියවේවි.ඔබ වයසට වඩා තරුණ වේවි. එයින් ඔබට දීර්ඝායුෂ ලැබේවි. සම්බුද්ධත්ව ජයන්තියේදී අප අපේ ජීවිත මේ අයුරින් හැඩගස්වා ගැනීමට උනන්දුවෙමු.



**සෝමදාස කන්දගේ - මාතර.**

# තිබහට වතුර බොන්නට 'පිංතාලිය' අද කෝ....?



තණ්හාව උපදින්නේ කොතැනද යනුවෙන් කෙනෙකු විමසුව හොත් එහි මූල නිධානය ඇත්තේ මිනිසාගේ හද තුළ යැයි බොහෝ දෙනා පවසනු ඇත. කාසිය පුදපුජනගි තබා වැඳුම් පිදුම් කරන අද වැනි සමාජයකට එම නිගමනයෙහි වලංගුභාවයක් තිබිය හැකිය. එහෙත් අප පැරැන්නන්ගේ බොහෝ ක්‍රියා තුළ තණ්හාව පිළිබිඹු වූයේ නැත. බඩ සයින් මහ මග වැතිර සිටිනා මිනිසෙකු ගේ පිපාසය සංසිඳවීම ඔවුන් දුටුවේ මහා දානමය ක්‍රියාවක් වශයෙනි. ඔවුන්ගේ එවන් සත් ක්‍රියාවකි මග යන එන අයගේ පිපාසාව සිංසිඳවා ලන්නට පිංතාලියක් පවත්වා ගෙන යාම.

'බුදු බව පතන බෝසත්වරු මහමෙර පරයන සේ හිස් ගොඩක් ඇස් ගොඩක් දන් දුන් සේක' යනුවෙන් අසන අපේ උපාසක උපාසිකාවන් දෑත් ඔසවා සාදුකාර දෙන්නේ එහි සැබෑ අර්ථය හැඳින ගෙන නොවන්නේය. ඒ උතුමන්ලා සංසාරයේ අනේක ජාතිවල දී හිස්, ඇස් ලෝකයා ගේ විමුක්තිය පිණිස ඔළුව වෙනෙසා මොළය වෙනෙසා ඇස වෙනෙසා අසීමිත කැපවීමක් කිරීමෙනි. ස්වකීය දර්ශන ශක්තිය සව්සතුන්ගේ යහපත පිණිස යෙදීම ඇස් දන්දීමක් වශයෙන් ද ශ්‍රම ශක්තිය කැප කිරීම මස් දන්දීමක් වශයෙන් ද බෞද්ධ සාහිත්‍යකරු විසින් වර්ණනා කොට පෙන්වා දෙනු ලැබ ඇතිවා මිස එවැනි නිරර්ථක ක්‍රියාවක් ප්‍රඥාවත් බෝසතුන් කළා නොවන්නේය.

වෙසක් හෝ පොසොන් දිනක පූජා භූමි ආශ්‍රිතව ද මග තොට ද අද මහා ඉහළින් දකින දන්සලත් පිංතාලියත් අතර ඇත්තේ පුළුල් පරතරයකි. දන්සැලකින් ලැබෙන සත්කාරය බොහෝ දෙනා භුක්ති විඳින්නේ පෙරැත්තකය නිසාය. එසේ නැතිනම් හුදු විනෝදාස්වාදය සඳහාය. එහෙත් ඒ කාරිය තුලින් වුව එයට දායකවන්නන් තුළ අභ්‍යන්තර සංවරයක් ඇති වන්නේ නම් එය නිශ්ඵල ක්‍රියාවක් වන්නේ නැත.

නමුත් පිංතාලිය පරෝපකාර නමැති සත්ක්‍රියාවේ ප්‍රභවය පැරණි සමාජ ජීවිතය තුළ විහිදී ගිය විරල අවස්ථාවක් විය. ඒ මගින් කිසිදු ප්‍රතිලාභයක් අපේක්ෂා නොකළ ඔවුන් එයින් පිපාසාව සංසිඳුවා ගනු ලැබුවේ කවරෙකු විසින් ද යන්න සම්බන්ධයෙන් වුව විමසිලිවත් වුවේද නැත. ඔවුන් සම්බන්ධයෙන් සලකා බලන විට ධර්මය පිහිටා තිබුණේ ඔවුන්ගේ සන්තානයේ යැයි කීම නිවැරදිය. ගසේ ස්වභාවය එහි ඵල වලින් දැන ගත හැකි වනවා මෙන්ම ඔවුන් ද බෞද්ධයන් වශයෙන් පෙනී සිටියේ හැකිතාක් දුරට එය ක්‍රියාවෙන් පෙන්වා දෙමිනි.

තම කුස ගින්න නිවා ගන්නට වෙස්සරන්තර රජු ගෙන් ජාලිය, ක්‍රිෂ්ණජිනා යන දරු දෙදෙනා ඉල්ලූ ජූජකයන් අද නැත. අද ඇත්තේ මග තොට දී ශත පහක් දහයක් ඉල්ලා අත පාන යාචකයන්ය. නමුත් තමා වෙත දිගු වන එවන් අතක් නොදුටුවා මෙන් සිටින ඇතැමුන් සිය වත් පොහොසත්කම් හැටි හැටියට තරඟකාරීව මුදල් වියදම් කොට පින්කම්, ධර්ම දේශනා ආදිය මහා උත්සවාකාරයෙන් සංවිධානය කරන්නට නම් පසුබට නොවෙති. එහෙත් ඔවුන් අතර බණ අහන්නන් බොහෝ වෙතත් අදහන්නන් ඇත්තේ එක් අයෙක් දෙදෙනෙක් පමණි.

පුද්ගලයා ගේ කීර්ති හා ප්‍රභූත්වය සොයා කරන මෙවන් ක්‍රියා මගින් ඔහුගේ ලෝභය අඩුකර ගැනීමක් හෝ දෙනුලබන්නා කෙරෙහි ද්වේශයෙන් ඈත් වී, මෛත්‍රී සිතිවිලි පහළ කර ගැනීමක් හෝ, මෝහයෙන් ඈත් වී අමෝහය හෙවත් ප්‍රඥා පහළ කර ගැනීමක් හෝ සිදුවන්නේ යැයි පිළිගත නොහැකිය.

මගක් යාබද පිංතාලියක් තැබූ පැරණි ගැමියා ද මේ පැන් අසවල් මගියාට ය කියා වෙන් කිරීමක් කළේ නැත. ඒ පිපාසාව තිබූ සෑම කෙනෙකුගේම ප්‍රයෝජනය සඳහා පිරිසිදු සිතින් කළ කුසල් ක්‍රියාවක් විය. ඒ අනුව ද එය ප්‍රත්‍යාගත දානයක් විය.

පැරණි ගැමියන් ජන කවියෙන් පිංතාලිය කෙරෙහි අනුරාගය දක්වා ඇත්තේ මෙසේය.

**පිංතාලිය සෑදුවේ බෝසත් විදානෝ**
**පැන් බීමෝ මගි දන සිතු ලෙසානෝ**
**දෙව් ලෝ වැඩිය ඒ ගුණ කඳාණෝ**
**පිංතාලිය බින්දේ දෙවිදත් පුතාණෝ**

**පිනට ලැබුණු පැන් හැම තැන ඒ කාලේ**
**දනට පිනට බණටත් තිබුණෙයි ආලේ**
**මිලට පැන් ගන්ට වී ඇති මේ කාලේ**
**පවට අපේ මොනවා කරමුද රාලේ**

අද මෙන් අප දවස ප්‍රවාහන පහසුකම් හෝ මග දෙපස සෑම තැනකම ආපනශාලා නොතිබුණු හෙයින් පිංතාලියෙන් සිදුවූයේ සුවිශේෂ සේවයකි. බොහෝ විට පාගමනින් ගමන් බිමන් ගියා මගියාගේ පිපාසාව සංසිඳ වූ පිංතාලිය සංකේතවත් කළේ පුණ්‍ය ක්‍රියාවකි.

පූජා වශයෙන් හෝ අනුග්‍රහ වශයෙන් හෝ වස්තුවක් නිර්ලෝභීව පරහට දීම දානයයි. දෙන වස්තුව හා දීම යන දෙකටම දානය යන වචනය ව්‍යවහාර කරනු ලැබුවත් දානමය කුසලය වනුයේ දෙන වස්තුව නොව දීම යන ක්‍රියාවයි. ඒ අනුව පිංතාලියකින් පුදනු ලැබුවේ ළිඳකින් හොම්ලේ ලබා ගත් පිරිසිදු ජලය වුවත් එය පවත්වාගෙන ගිය සැදැහැවත් ගැමියාගේ චේතනාව වූයේ මගියා ගේ පිපාසාව සංසිඳ වීමයි. එය නියත වශයෙන් මහා පුණ්‍ය කර්මයක් විය.

දීම සාමාන්‍යයෙන් එකක් වුවද බෞද්ධයාට එය දානය, පූජාව යනුවෙන් දෙවැදෑරුම් වේ. තමාට වඩා උසස් වූ බුදුන්වහන්සේ ආදී උත්තමයන් වහන්සේලාට දීම පූජා වන අතර සෙසු පූජාවට මහත් ඵල ලැබෙන බව සැබෑවකි. අද බොහෝ දෙනා පෙළඹෙන්නේ ද පූජාවට සැදැහැවත්තයෝ දීම මිස දානයට නොවන බව ද නොරහසකි. එහෙත් අපේ පැරණි සැදැහැවත්තයෝ දීම පූජාවට පමණක් සීමා නොකළහ. පිංතාලිය ඔවුන්ගේ දීමේ හිතවාදීභාවය හා පරාර්ථකාමීත්වය ප්‍රකාශ කළ ප්‍රබල සාධකයක් විය.

අපේ ගැමි සැදැහැවත්තු අද ද තම කෑම පිගානෙන් පළමුව බත් පිඩක් වෙන් කොට එළිමහන් තැනක රඳවා ඇති බඳුනක තබති. එය පිළිගැනීමට පුරුදු පුහුණු වී ඇති සතුන් හට එය අමිහිරි ආහාරයකි. දානයක මූලිකාංග සැම්කක්ම මේ කුඩා ක්‍රියාවේ ගැබ්ව ඇත.

බුදුපියාණන් වහන්සේ එය පෙන්වා දී ඇත්තේ මෙසේය.

**'මහණෙනි, මම යම් සේ දානයාගේ විපාකය දනිම් ද,**
**මේ සත්ත්වයෝ ද එසේ දනිත් නම් දකී.**
**නොදී තුමු නොවළඳනන්නාතහ.**
**මසුරු මලය ඔවුනගේ සිත යට කරගෙන නොසිතන්නේය.**
**ඔවුන්ට යම් අන්තිම බත් පිඩක් වේ නම් එයින් ද දන් දී වළඳන්නාහුය.'**

(ධම්ම පදය)

## දස රාජ ධර්ම

රජවරුන් විසින් අනුගමනය කළ යුතු මූල ධර්ම 10 ක් ලෙස දසරාජ ධර්ම නමින් බුදු සමයෙහි ඉගැන්වේ. පාලකයෙකු වෙත පැවතිය යුතු ගුණධර්ම ලෙසින් දැක්වෙන මෙම මූලධර්ම බෞද්ධ පාලකයෙකුගේ ගුණධර්ම ලෙස දක්වා ඇත. එනම්,

**දානය, ශීලය, පරිත්‍යාගය, ඍජු බව, මෘදු බව, තපස, අක්‍රෝධය, අවිහිංසාව, ඉවසීම, අවිරෝධතාව** යන මේවා දස රාජ ධර්ම නමින් හැඳින්වේ.

මෙහි පළමුවෙන්ම සඳහන් වන්නේ දානයයි. මෙහි **දානය** යනුවෙන් අදහස් කරන්නේ කූට දන්ත සූත්‍රයේ සඳහන් පරිදි ජීවං පෝෂණය සඳහා රටවැසියාට මූලික ධනය පරිත්‍යාග කිරීමයි. ධනය නැතිකම හේතු කොටගෙන සොරකම් කරන පිරිස වැඩිවේ. චක්කවත්ති සීහ නාද සූත්‍රයේ පෙන්වා දෙන්නේ දුප්පතුන් කිහිපදෙනෙකුට ධනය දීමෙන් ප්‍රශ්න නොවිසඳෙන බවයි. ඒ නිසා තම හැකියාව දියුණු කිරීම සඳහා පරිත්‍යාග දියුණු කළ යුතුය.

**සීලය** යනුවෙන් සඳහන් කරන්නේ රට වැසියා ප්‍රතිපත්ති ගරුක සංවරශීලි පුද්ගලයෙකු විය යුතුය යන්නයි. මෙයින් පැහැදිලි කරන්නේ රටක පාලකයා කිසියම් සදාචාරාත්මක ප්‍රතිපත්ති සමූහයක් මත පිහිටා කටයුතු කිරීම අවශ්‍ය බවයි.

**පරිත්‍යාගය** යන්නෙන් විස්තර කරන්නේ ත්‍යාගශීලී කරුණයි. මෙයින් කියවෙන්නේ පාලකයා රටවැසියාගේ මානව සුභ සාධනය වෙනුවෙන් තම ධනය කාලය, ශ්‍රමය යෙදවිය යුතු බවයි.

**ඍජු** ගතිය යන්නෙන් අදහස් කරන්නේ තම තීරණයන් මත ස්ථාවරව පිහිටා සිටීමට තමාට ආත්ම ශක්තියක් ඇතැයි යන්නයි.

දහැමි රාජ්‍යයක් නිර්මාණය කිරීමේදී පාලකයා **මෘදු** ගතියෙන් යුක්ත විය යුතු බව දක්වා ඇත.

**තපස** යන්නෙන් අදහස් කරන්නේ පාලකයා හෙවත් රජු ඉන්ද්‍රිය දමනයෙන් යුක්ත විය යුතු බවයි. පාලකයා අධික ලෙස ඉඳුරන් පිනවීමට කාලය ගත කරන පුරුෂයකු නම් ඔහු ඔහුගේ අභ්‍යන්තර හා බාහිර වියවුල් වලට හේතුවේ.

**අවිහිංසාව** යනු රජු පරිපාලනය විෂයෙහි හිංසාකාරී මාධ්‍යයන්ට වහල් නොවිය යුතු බවයි. කූට දන්ත සූත්‍රයේ සඳහන් වන පරිදි රජු හිංසා කාරී පිළිවෙතකට නැඹුරු වුවහොත් ජනතාව ද රජුට එරෙහිව සන්නද්ධ වීමට ද ඉඩ තිබේ.

**ඛන්තිය** හෙවත් ඉවසීම රජුට තම පරිපාලනයේදී අවශ්‍ය අංගයකි. එසේ නොමැතිනම් ගන්නා ඉක්මන් තීරණ නිසා එම පාලකයා පමණක් නොව ජනතාව ද පීඩනයට පත්වේ

**අක්‍රෝධය** හෙවත් මෛත්‍රිය පාලකයෙකු තුළ තිබිය යුතු තවත් විශේෂ ලක්ෂණයකි. රට වැසියා සමඟ මිත්‍ර ශීලිව කටයුතු කරන්නේ නම් යහපත් පාලනයක් ඇති කිරීමට හැකියාව ඇත.

## සතර අගති

**01. ඡන්දය**
**02. ද්වේශය**
**03. භය**
**04. මෝහය**

යහපත් පාලකයෙකුට තම පාලන කටයුතු නිසි පරිදි කිරීමටනම් අවශ්‍ය බුදු සමයේ ඉගැන්වෙන සතර අගතිය ද වැදගත් වේ.

**ඡන්දය** - යම් යම් දෑ පිළිබඳව පුද්ගල කැමැත්ත ඡන්දයයි. ස්වතන්ත්‍රව ගනු ලබන තීරණයකි. යම් යම් අවස්ථාවන්හි මෙය මෙලෙස කළ යුතුය. මෙම කරුණු මෙලෙස කළ යුතුය. ආදී වශයෙන් ගනු ලබන තීරණ ඡන්දය අනුව සිදුවේ. මෙබඳු තීරණ ගැනීමේදී යුක්තිය හා සාධාරණත්වය ඉෂ්ට වන පරිදි නිවැරදි තීරණ ගනී නම් එය අගතියක් නොවේ. නමුත් එය එසේ සිදු නොවේ. සිය රුචි අරුචි කම් පක්ෂපාතිත්වය ඥාතිමිත්‍ර සම්බන්ධතා ලාභ ප්‍රයෝජන ආදිය බලපායි. පාලකයෙකු සතු විධායක බලය හා යුධ ශක්තිය වෙත මෙවන් බලපෑම් සිදු වීම බොහෙවින්ම අහිතු ප්‍රතිඵල උදාකරයි.

**ද්වේශය** - සමගිය හා සාමයේ දෑත් සමාජය වෙත දිගු කිරීමට උගන්වන බුදු සමය ද්වේශයට පටහැනි දහමකි. ද්වේශයෙන් දූෂිත වූ මනෝ භාවයන් ඇති පාලකයෙකුට යුතුකම් සුදුසුකම් හා සාරධර්ම පිළිබඳ යතාවබෝධයක් නැත. නිරතුරුවම තරහින් පිපිරෙන හද ඇත්තෙකුට මධ්‍යස්ථව නිවැරදිව තීරණවලට එළඹිය නොහැකිය. ද්වේශ සහගත පාලකයා පිය පුතු සබඳතාවය අනුව සමාජය දෙස නොබලති.

**භය** - ශක්තිය හා බුද්ධිය හීන පාලකයන් බියෙන් සැකයෙන් පසුවේ. කවර මොහොතක කවර පැත්තකින් තමා වෙත විරෝධතා අභියෝග ඉදිරිපත් වේ දැයි ඔවුන් බියෙන් පසුවෙති. තමාට දෝෂාරෝපන එතැයි ද නිරතුරු බියෙන් පසුවේ.

**මෝහය** - මෝඩකම සියළු අකුසලයන්ට මූලවේ. පාලකයා බුද්ධිහීන අඥාණ මෝඩයෙකු නම් ඔහුට යහපත් පාලකයක් දියත් කළ නොහැකිය. මෝඩකම නිසා වැරදි නිගමන වලට එළඹේ.

කුමුදුලී



# ජීවිතය සරු කරන දැහැමි පිළිවෙත්

ගොඩනැගෙන්නේය. හොඳම නෑයා විශ්වාසවන්තයා බව බුදුදහමෙහි පෙන්වා දී තිබෙනවා. එමෙන්ම සමාජ පැවැත්ම සඳහා මනා සිහියෙන් කටයුතු කිරීමද අත්‍යවශ්‍යය කමත් නිවැරදි සිහියෙන් යුතුව තම ජීවිතය පවත්වා ගෙන යෑම තුළින් ශීලයද ආරක්‍ෂා වන අතර මානව සබඳතාවද වර්ධනය වීම සිදුවෙයි.

මිනිසා තමාට සිතෙන හොඳ නරක දෙක හොඳින් තේරුම් ගෙන සමාජ යහපතට හේතු වූ දේ කිරීමට උත්සහ කරයි. සිත, කය, වචනය සංවරයක් ඇතිව ක්‍රියා කරයි. සිත සංවර වීමට භාවනාව හේතුවන අතර කය, වචන දෙක සංවර වන්නේ සීලයෙනි. වාචනං සමෝදනං සීලං' යනුවෙන් දහමෙහි දක්වා ඇත්තේ එයයි. පන්සිල්, අටසිල්, දසසිල් ආදී වශයෙන් ගිහියන් සඳහා සිල් වර්ග කර ඇත. ප්‍රාතිමෝක්‍ෂ සංවර සීලය ආදී සිල් පද පැවිද්දන් සඳහා වර්ග කර ඇත. මෙම සීලයන් වැඩීම දියුණු කිරීමකි. සංවර්ධනය කිරීමකි. දියුණුව හෙවත් සංවර්ධනය කොටස් දෙකකි. එනම්

1. භෞතික සංවර්ධනය
2. අධ්‍යාත්මික සංවර්ධනය

භෞතික සංවර්ධනය ලෙස හැඳින්වෙන්නේ පුද්ගලයාට බාහිර වටපිටාවෙන් සම්පත් බහුලවීම, මූලික අවශ්‍යතා නොඅඩුවීමයි. අධ්‍යාත්මික සංවර්ධනය යනු ශීලය මුල් කොට ගෙන දියුණු කරනු ලබන සදාචාර සංවර්ධනයයි. දුසිරිතෙන් ඈත්වී සුසිරිත් පුහුණු කිරීම සදාචාර දියුණුවයි. සදාචාරය ඇති තැන භෞතික වශයෙන්ද සංවර්ධනය රදාපවතින බව බුදුදහමෙහි ඉගැන්වේ. සමාජය තුළ අධ්‍යාත්මික ගුණ වගාවක් ඇති කිරීමට හේතුවන ප්‍රතිපදාවක් ඇත. එම පිළිවෙත් වන්නේ පංචව සීල ප්‍රතිපදාවයි. මෙලෙස සීලය දියුණු කිරීමෙන් සදාචාර සංවර්ධනයක් ඇතිවේ.

## සීලය සහ සදාචාරය

මිනිසුන්ගේ ප්‍රගතිය හෙවත් සංවර්ධනය සදාචාර සම්පන්නවීම තුළින් පිළිපිඹු කෙරේ. පුද්ගලයා සිදු කරන දුරාචාර තුළින් සමාජයට අයහපතක් සිදුවේ. මෙලෙස මිනිසා සදාචාරය ඉවත් කොට දුරාචාරය අනුව ගමන් කිරීම තිරිසනාට උපමා කොට තිබේ. මිනිසා මෙන්ම තිරිසනා අතර සමානකම් හතරකි. එනම් නිදා ගැනීම, ආහාර ගැනීම, බිය, සිය වර්ගයා බෝ කිරීමය. මෙලෙස සමානකම් තිබුණද මිනිසා දුසිරිතට ලැජ්ජාවක් හා බියක් ඇත. සමාජයක සිව් ආකාරයක මිනිසුන් සිටින බව පෙන්වා දී ඇත. එනම් මිනිසුන් සේ සිටින තිරිසන්නු, මිනිසුන්ම වන මිනිස්සු වශයෙනි. මෙහි පළමු, දෙවන, තෙවන ගණයට අයත් වන්නෝ සදාචාරවත් මිනිසා ලෙස වර්ග කළ හැක. දුසිරිත් කිරීමට ලැජ්ජා නැති අන් අය නොමඟ යවන සංවරයක් නැති අධර්මයෙන් උපයා යැපෙන පුද්ගලයා සුවසේ කාබී වෙසෙන දක්‍ෂ කපුටෙකු වැනිය යනුවෙන් ධම්මපදයේ දක්වා ඇත.

පරපණ නසන, අන්සතු දේ හොරකම් කරන අසම්මතචර්යා ඇති මත් ද්‍රව්‍ය භාවිතා කරන බොරු කියන පුද්ගලයන් සිටින සමාජය දියුණු යැයි කිව නොහැක. මිනිස්කම නොමැති සමාජයේ භෞතික දියුණුවද මායාවකි.

බුදුදහමට අනුව සියළු මානව ක්‍රියාකාරකම් වලට මනස මුල්වේ. තමන් විසින් කරනු ලබන අයහපත් ක්‍රියාවන්හි ප්‍රතිඵල තමන් පසුපස එන බවත්, තමන් කරනු ලබන යහපත් ක්‍රියාවන්හි ප්‍රතිඵල තමන් පසුපස සෙවණැල්ල සේ එන බවත් උපමා කර ඇත. මෙලෙස කායික හා මානසික පිරිහීම දුසිල් බවද, කායික මානසික හා අධ්‍යාත්මික දියුණුව සුසිල් බව ප්‍රකට කරන්නේය.

බුදුරජාණන් වහන්සේ වදළ සීලය චාරිත්‍ර හා වාරිත්‍ර සීලය යනුවෙන් කොටස් දෙකකි. එනම් විරමණය හා සමාදනයයි. විරමණය යනු වැළකී සිටීමයි. චාරිත්‍ර යනු පරපණ නැසීම අන්සතු දේ ගැනීම, අසම්මත හැසිරීම, බොරු කීම, සිහි විකල්බව ආදියෙන් වැළකී සිටීමයි. එසේ වැළකී සිටීමෙන්ම ප්‍රමාණවත් නොවේ.

සමාජයේ වෙසෙන මනුෂ්‍යන්ගේ ජීවත් වීමේ නිදහස තහවුරු කිරීම, දයාව, කරුණාව, මෛත්‍රිය, සියළු සත්ත්වයන් ආරක්‍ෂා කිරීම, සම්මත හැසිරීම් පවත්වා ගැනීම, අන් සතුන් විපතින් ආරක්‍ෂා කර ගැනීම, සත්‍ය වචන කතා කිරීම, මංමුලා නොකිරීම ආදිය චාරිත්‍ර සීලයට අයත් වන අතර එය සමාදනයයි. මෙලෙස විරමණය හා සමාදනය මැනවින් තේරුම් ගෙන කටයුතු කිරීම තුළින් කායික හා මානසික සුවය සංවර්ධනය වන්නේය. පංච ශීලය තුළින් මානව සබඳතා දියුණු කර ගැනීමට උපකාර වෙයි. සීලය පිරිහීමට පත්වුව හොත් මිනිස් සබඳතා හා සාමයද පිරිහෙන්නේය.

එකිනෙකා අතර හිංසනය, සිදුවුවහොත් සමාජයට හානි පමුණුවන්නේය. එලෙසම මිනිසුන් සතු සම්පත් ඔවුනොවුන් විසින් ආරක්‍ෂා කරගත යුතු වන්නේය. සොරමැරකම් වර්ධනය වුවහොත් මානසික අසහනයද වර්ධනය වන්නේය. අසම්මත හැසිරීමෙන් වැළකී කුල කුමරියන් ආරක්‍ෂා කිරීම සිදුවන විට සමාජ ප්‍රශ්න, සමාජ රෝග ආදිය දුරුවන අතර මානව හිතවාදී බවද තහවුරු වන්නේය. සත්‍ය වචන භාවිතය නිසා ඔවුනොවුන් අතර විශ්වාසයද

මිනිසාගේ මූලික අවශ්‍යතා සපුරා ගැනීමට ශක්තිමත් ආර්ථිකයක් සකස් කර ගැනීමත් වැදගත්ය. යහපත් සාධාරණ ආර්ථිකයක් තුළින් සැපවත් ජීවිතයක් ගත කිරීමට හැකි බවද බුදු දහමෙහි දක්වා ඇත.

ආර්ථික දියුණුව සඳහා මස් වෙළදාම, වස වෙළඳාම, මත්පැන් වෙළඳාම ආදෘ පංච වෙළදාමෙන් ඈත්ව තුලා කූට මානකූට යන වැරදි මැනීම් වලින් ඈත්ව යහපත් වෙළඳ කටයුතු කළ යුතු බව ඇතැම් සූත්‍ර ධර්මවල සඳහන් කර ඇත. උත්සහයෙන් දහඩිය වගුරවා දෑතේ මහන්සියෙන් ධාර්මිකව ධනය ඉපයීම කළ යුතු බව දහමේ පෙන්වා ඇත.

සැම දෙනාම සිල්වත් ගුණ ධර්ම පුරන යහපත් පුද්ගලයන් වීමට අධිෂ්ඨානය කර ගැනීම වටිනේය.

**බුදුදහමට අනුව සියළු මානව ක්‍රියාකාරකම් වලට මනස මුල්වේ. තමන් විසින් කරනු ලබන අයහපත් ක්‍රියාවන්හි ප්‍රතිඵල තමන් පසුපස එන බවත්, තමන් කරනු ලබන යහපත් ක්‍රියාවන්හි ප්‍රතිඵල තමන් පසුපස සෙවණැල්ල සේ එන බවත් උපමා කර ඇත.**

පූජ්‍ය මෙත්තානි අසේකා මෙහෙණින් වහන්සේ